# 01 කාර්මික විප්ලවය ( 1750 - 1850 )

***කාර්මික විප්ලවය බිහිවීමේ පසුබිම.***


- 18 වන සියවසේ අග භාගයේදී යුරෝපයේ භාණ්ඩ නිෂ්පාදනයේ පුළුල් වෙනසක් සිදුවිය.
- මින් පෙර භාණ්ඩ නිෂ්පාදනය සිදු වූයේ දෑතේ සවියෙන් ගෘහස්ථ කර්මාන්ත ලෙසිනි.
- යුරෝපා රාජ්‍යන් යටත් විජිත ඇති කර ගැනීමත් සමග වෙළෙඳපළක් නිර්මාණය විය.
- වෙළෙඳපළට අවශ්‍ය නිෂ්පාදන භාණ්ඩ වැඩිකර ගැනීම සඳහා කර්මාන්තශාලා තුළ යන්ත්‍ර සූත්‍ර භාවිතා කරන ලදී.
- මේ හේතු සාධක මුල් කරගනිමින් කාර්මික විප්ලවය බිහිවිය.

> කාර්මික විප්ලවය යනු .............
> ***මිනිසා දෑතේ සවියෙන් භාණ්ඩ නිෂ්පාදනය කිරීම වෙනුවට යන්ත්‍ර සූත්‍ර භාවිතා කර භාණ්ඩ නිෂ්පාදනයේ ඇති කළ පුළුල් වෙනස කාර්මික විප්ලවය වේ.***

- එංගලන්තය මුල් කරගනිමින් යුරෝපයේ ආරම්භ වූ තාක්ෂණික පරිවර්තනය පසුව අනිකුත් මහද්වීප වලටද ව්‍යාප්ත විය.
- කාර්මික විප්ලවය දේශපාලන, ආර්ථික, සමාජීය වෙනස්කම් ඇති කළේය.

***කාර්මික විප්ලවය එංගලන්තයේ ආරම්භ වීමට බලපෑ හේතු.***

බ්‍රිතාන්‍යයේ වැඩවසම් ක්‍රමය සම්පූර්ණයෙන් ඉවත්ව ජාතික රාජ්‍යක් ලෙස ගොඩනැගී තිබුණු පසුබිමක් තුළ යටත් විජිත ඇතිකර ගනිමින් බ්‍රිතාන්‍ය යුරෝපයේ බලවතා වෙමින් පැවතිණි.



***කාර්මික විප්ලවයේ ප්‍රබෝධය.***

වර්ධනය වූ ක්ෂේත්‍ර
- → පේෂ කර්මාන්තය ( රෙදි පිළි )
- → ගල් අඟුරු කර්මාන්තය ( ඉන්ධනයක් ලෙස )
- → යකඩ හා වානේ කර්මාන්තය

## පේෂ කර්මාන්තය තුළ ඇති වූ නව සොයා ගැනීම්.

දුවන නඩාව නිපදවීමත් සමග රෙදි විවීම වේගවත් වූ නමුත් කපු කැටීම වේගවත් නොවීම.
උදා - හය දෙනෙක් සමඟ දිනකට සකසන නූල් ප්‍රමාණය එක් රෙදි වියන්නෙක් විසින් එක් දිනකදී රෙදි වියා අවසන් කරන ලදී.

| වර්ෂය | නිපදවූ පුද්ගලයාගේ නම | යන්ත්‍රයේ නම | පහසු වූ කාර්ය |
|---|---|---|---|
| 1733 | ජෝන් කේ | දුවන නඩාව | රෙදි විවීම තරමක් වේගවත් විය. |
| 1764 | ජේම්ස් හාග්‍රීව්ස් | ජෙනී යන්ත්‍රය | කපු කැටීම වේගවත් කිරීම |
| 1769 | රිචඩ් ආක්රයිට් | ජල රාමුව | වේගවත්ව නූල් කැටීමට හැකි වීම. |
| 1779 | සැමුවෙල් ක්‍රොම්ප්ටන් | මියුල් යන්ත්‍රය | සියුම් හා ශක්තිමත් නූල් සැකසීම. |
| 1785 | එඩ්මන්ඩ් කාට්රයිට් | පවර්ලූම් ( වාෂ්ප බලයෙන් ක්‍රියා කිරීම ) | තාක්ෂණික ලෙස කපු කැටීම. |

- ❑ මීට අමතරව එලිවිට්නි - කොටන් ජින් , එලියස් ගෝවේ - රෙදි මැසීමේ යන්ත්‍රය වැනි යන්ත්‍ර සොයා ගැනීම.
- ❑ බල ශක්තියක් ලෙස ජලය මඟින් ක්‍රියාත්මක කළ හැකි ජල රාමුව එකතු වීමත් සමඟ රෙදි විවීම වේගවත් විය. ( මෙය නිවසේ තැබිය නොහැකි වූ නිසා ජලය ලබා ගත හැකි විශාල කර්මාන්තශාලා ලෙස නිර්මාණය විය.)
- ❑ බල ශක්තියක් ලෙස ගල් අඟුරු හා වාෂ්ප බලය යොදා ගැනීමත් සමඟ පේෂ කර්මාන්තය නව මගකට යොමු විය.
- ❑ මෙම නව සොයා ගැනීම් නිසා එංගලන්තයේ ලොම් රෙදි කර්මාන්තයට වඩා කපු රෙදි කර්මාන්තය දියුණු විය.

## යකඩ හා වානේ කර්මාන්තය.

- ✓ කාර්මික විප්ලවයට පෙර සිට බ්‍රිතාන්‍ය තුළ යකඩ භාවිතා කළේය.
- ✓ එම යකඩ ශක්තිමත් බවින් හා නැමිය හැකි බැවින් අඩු ඒවා විය.
- ✓ යපස් උණු කිරීමට මුල් අවධියේ දර භාවිතා කළ අතර දර වෙනුවට ගල් අඟුරු යොදා ගැනීමත් සමඟ යකඩ හා වානේ නිෂ්පාදනය වැඩිවිය.
- ✓ 1730 දී ඒබ්‍රහම් ඩර්බි විසින් ගල් අඟුරු යොදා ගනිමින් යපස් උණු කර එමගින් වාත්තු කළ යකඩ නිපදවීම.

**යකඩ හා වානේ කර්මාන්තයට එකතු වූ යන්ත්‍ර සූත්‍ර**

| වර්ෂය | නිපද වූ පුද්ගලයාගේ නම | යන්ත්‍රයේ නම | පහසු වූ කාර්ය |
|---|---|---|---|
| 1784 | හෙන්රි කෝට් | රෝලර් යන්ත්‍රය | යපස් වල අපද්‍රව්‍ය ඉවත් කිරීම. තැලිය හැකි යකඩ හෙවත් පදම් කළ යකඩ නිපදවීම. |
| 1856 | හෙන්රි බෙසමර් | වානේ නිපදවීමේ උදුන | යකඩ වල අපද්‍රව්‍ය ඉවත් කිරීමේ නව ක්‍රමයක් සොයා ගැනීම. |
| 1860 | විලියම් සීමන්ස් | විවෘත උදුන් ක්‍රමය | උසස් තත්වයේ වානේ නිපදවීම. පිරිසිදු යකඩ නිපදවීම. |
| 1878 | විලියම් සීමන්ස් | විදුලි උදුන | යකඩ හා වානේ කර්මාන්තය ශීඝ්‍ර ලෙස දියුණු විය. |

✓ පේෂ කර්මාන්තයට හා අනිකුත් කර්මාන්තශාලා වලට අවශ්‍ය යකඩ එංගලන්තය තුළම නිෂ්පාදනය කර ගැනීමට හැකිවිය.

## ගල් අඟුරු කර්මාන්තය.

ගල් අඟුරු බහුල ලෙස පැවති බ්‍රිතාන්‍ය ප්‍රදේශ →
- දකුණු වේල්ස්
- යෝක්ෂයර්
- ලැන්කැෂයර්
- නෝදම්බර්ලන්ඩ්

✓ ගල් අඟුරු බහුල වීම නිසා යන්ත්‍ර සූත්‍ර ක්‍රියාකරවීමට බලශක්තියක් ලෙස යොදාගත හැකිවීම.

✓ වාෂ්ප එන්ජිම නිපදවීමත් සමඟ නිවාස හා කර්මාන්තශාලා තුළ ගල් අඟුරු වැඩි වශයෙන් භාවිතා කිරීම.

✓ ඉල්ලුමට අනුව සැපයුම ලබාදෙන විට ගල් අඟුරු පතල් ඉතා ගැඹුරට කැපීමට සිදුවිය.


✓ එවිට අභියෝගතා රැසකට මුහුණ දීමට සිදු වූ අතර එම අභියෝග ජය ගැනීමට නව සොයා ගැනීම් සිදු වූ නිසා ගල් අඟුරු කර්මාන්තය වර්ධනය විය.

ගල් අඟුරු කර්මාන්තයට එල්ල වූ අභියෝග →
- ආකර තුළ එකතු වූ ජලය ඉවත් කිරීම.
- ආකර පතුළේ විෂ වායු තිබීම.
- ආකර තුළට ආලෝකය නොමැති වීම.
- ආකර තුළට පිරිසිදු වාතය ගෙන යාම.

**ගල් අඟුරු කර්මාන්තයට එකතු වූ යන්ත්‍ර සූත්‍ර**

| වර්ෂය | නිපදවූ පුද්ගලයාගේ නම | යන්ත්‍රයේ නම | පහසු වූ කාර්ය |
|---|---|---|---|
| 1735 | තෝමස් නිව්කොමන් | වාෂ්ප එන්ජිම | ආකර තුළ තිබෙන ජලය නළ මගින් ඉවත් කිරීම හා වාතය කෘතිම ලෙස සිසිල් කිරීම. |
| 1736 | ජේම්ස් වොට් | විධිමත් වාෂ්ප එන්ජිම | සියලු කර්මාන්තශාලා වලට යොදා ගත හැකිවීම. |
| 1812<br>1815 | හම්ප්‍රි ඩේව් | ආරක්ෂක ලාම්පුව | ආරක්ෂිතව ලාම්පුව ආකර තුළට ආලෝකය ගෙන යාමට හැකි වීම. |

- ✓ වාෂ්ප එන්ජිම හා ආරක්ෂිත ලාම්පුව සොයා ගැනීමත් සමග පතල් හෑරීම ඉක්මන්වීම හා ඒ ආශ්‍රිත අභියෝග රැසක් ජයගත හැකිවීම.
- ✓ 1839 දී යකඩ කේබල් කම්බි යොදාගැනීම නිසා ආකර තුළ සිට ඉක්මනින් ගල් අඟුරු ගොඩගැනීමට හැකිවීම. 1844 දී පතල් වල සේවයට කාන්තාවන් හා ළමුන් යොදා ගැනීම තහනම් විය.




***කාර්මික විප්ලවයේ ව්‍යාප්තිය.***

- වසර පනහක් පමණ බ්‍රිතාන්‍යට පමණක් සීමා වූ කාර්මික දියුණුව 19වන සියවසේදී අනිකුත් රටවල් කරාද ව්‍යාප්ත විය.
- කාර්මික විප්ලවයේ බලපෑම ප්‍රවාහනය, සන්නිවේදනය, කෘෂිකර්මාන්තය යන අංශ වල දියුණුවක් ඇති කළේය.

<u>ප්‍රවාහන ක්ෂේත්‍රයේ දියුණුව.</u>

- කර්මාන්තශාලා වලට අවශ්‍ය අමුද්‍රව්‍ය ගෙන ඒමටත් නිෂ්පාදන භාණ්ඩ වෙළෙඳපොළට ගෙනයාමටත් හොඳ ප්‍රවාහන ක්‍රමයක් නිර්මාණය විය.
- 1811 දී ජෝන් මැකඩම් විසින් ශක්තිමත් මාර්ග පද්ධතියක් සකස්කර ගන්නා ලද අතර එය මැකඩම් ක්‍රමය ලෙස හඳුන්වයි.

ප්‍රවාහන ක්ෂේත්‍රයේ නිෂ්පාදන

| වර්ෂය | නිපදවූ පුද්ගලයාගේ නම | නිෂ්පාදනයේ නම | පහසු වූ කාර්ය |
|---|---|---|---|
| 1811 | ජෝන් මැකඩම් (බ්‍රිතාන්‍ය) | මැකඩම් ක්‍රමය | පහසුවෙන් භාණ්ඩ රැගෙන යා හැකි මාර්ග නිර්මාණය කිරීම. |
| 1814 | ජෝර්ජ් ස්ටීවන්ස් | දුම්රිය එන්ජිම | භාණ්ඩ වැඩි ප්‍රමාණයක් එකවර ප්‍රවාහනය කළ හැකිවීම. |
| 1807 | රොබට් පුල්ටන් ( ඇමරිකාව ) | දුම් බෝට්ටුව | ගංගා හා ඇළ මාර්ගවල ප්‍රවාහනය ඉක්මන් විය. |
| 1811 | හෙන්රි බෙල් | දුම් නැව | මහද්වීප හරහා ගමනාගමනය වේගවත්වීම |
| 1885 | ඩෙම්ලර් ( ජර්මනිය ) | මෝටර් රථය | මගී ප්‍රවාහනය ඉක්මන් විය. |
| 1903 | රයිට් සහෝදරයෝ (ඇමරිකාව) | ගුවන් යානය | අහසින්ද ගමන් කිරීමට හැකිවීම. |

සන්නිවේදන ක්ෂේත්‍රයේ දියුණුව


- මුල් අවධියේ බ්‍රිතාන්‍ය තුළ පැවති තැපැල් ක්‍රමය නොදියුණු සහ වියදම් අධික ක්‍රමයක් විය.
- 1840 දී පෙනී තැපැල් සේවය ආරම්භ වීමත් සමඟ බ්‍රිතාන්‍යයේ ඕනෑම තැනකට ලිපි යැවීමට වියදම් වූයේ පැන්සයක් පමණි.
- කාර්මික දියුණුවත් සමඟ ස්ථාන දෙකක් අතර ඉක්මනින් පණිවුඩ හුවමාරු කර ගැනීමට 1844 දී සැමුවෙල් මෝස් විසින් විදුලි පණිවුඩ ක්‍රමය සොයා ගන්නා ලදී.
- 1876 දී ඇලෙක්සැන්ඩර් ග්‍රැහැම්බෙල් විසින් කේබල් මඟින් කටහඬින් අදහස් හුවමාරු කර ගැනීමට දුරකථනය නිපදවන ලදී.
- 1895 දී ගුග්ලි මාර්කෝනි විසින් විදුලි තරංග භාවිතා කරමින් ගුවන් විදුලි යන්ත්‍රය නිර්මාණය කිරීම.
- 1926 දී ජෝන් ලොගී බෙයාඩ් විසින් රූපවාහිනිය නිපදවීමත් සමඟ කාර්මික භාන්ඩ ප්‍රචාරණ කටයුතු සිදුකළ හැකිවිය.

කෘෂිකර්මාන්තයේ දියුණුව.

- වැඩවසම් ක්‍රමයේ සිටි ප්‍රවේණිදාසයෝ නගරවලට පැමිණීම නිසාද ඉඩම් හිමි පුද්ගලයන් කර්මාන්තශාලා ආරම්භ කිරීම නිසාද ගොවිබිම් පාලුවිය.
- නගර තුළ කම්කරු ජනතාව වැඩි වීමත් සමඟ ආහාර අවශ්‍යතාවයද වැඩිවිය.
- එම ආහාර අවශ්‍යතාවය සපුරාලීම සඳහා කාර්මික විප්ලවයෙන් සොයාගත් නව යන්ත්‍ර සූත්‍ර යොදා ගනිමින් ගොවිබිම් අස්වැද්දවීම හේතුවෙන් කෘෂිකර්මාන්තය තුළ දියුණුවක් ඇතිවිය.

කෘෂිකර්මාන්තය වර්ධනය වීමට බලපෑ සාධක →
- මහාපරිමාණ ගොවිබිම් ආරම්භ වීම.
- ශෂ්‍ය මාරු ක්‍රමය .
- නව තාක්ෂණයෙන් යුක්ත සත්ව පාලනය.
- නව කෘෂිකාර්මික ක්‍රම හා උපකරණ.

- කුඩාවට තිබූ ඉඩම් එක් කරමින් විශාල ගොවිබිම් නිර්මාණය කිරීම. එය ඉඩම් කොටු කිරීමේ ව්‍යාපාරය ලෙස හඳුන්වයි.
- විශාල ගොවිබිම් කොටස් තුනකට බෙදා වගා කිරීම තුළින් වැඩි අස්වැන්නක් ලබා ගැනීමට හැකිවීම හා ලෙඩරෝග අවම කර ගැනීමට හැකිවීම.
- ගොවිබිම් වල එක් කොටසක ප්‍රධාන බෝගයද දෙවැනි කොටසේ අතුරු බෝගයද තුන්වැනි කොටසේ කිසිදු බෝගයක් වගා නොකර අත්හැර දමන ලදී. මෙය ශෂ්‍ය මාරු ක්‍රමය ලෙස හඳුන්වනු ලැබීය.



- ජෝන් රෝටල් විසින් අශ්වයන් බඳින ලද නගුල් වලින් පේළියට වැපිරීමේ ක්‍රමය සොයා ගැනීමත් සමඟ අඩු බීජ ප්‍රමාණයකින් වැඩි අස්වැන්නක් ගත හැකිවිය.
- සත්ව පාලනය තුළද තාක්ෂණය යොදා ගනිමින් රොබට් බැක්වෙල් විසින් බැටලු වර්ග අභිජනනය කිරීම සොයා ගත්තේය.
- 1800 දී ගුවානෝ පොහොර සොයාගැනීමත් සමඟ රසායනික පොහොර හා කෘෂි රසායන නිෂ්පාදන වැඩි කිරීම තුළින් කෘෂිකර්මාන්තයේ නව පෙරළියක් සිදුවිය.

***කාර්මික විප්ලවය වෙනත් රටවල් කරා ව්‍යාප්ත වීම.***

- අඩ සියවසක් තරම් කාලයක් කාර්මික විප්ලවය බ්‍රිතාන්‍යට පමණක් සීමාවිය.
- එසේ වීමට හේතුව වූයේ බ්‍රිතාන්‍යන් විසින් සොයා ගත් නව තාක්ෂණය නව යන්ත්‍ර සූත්‍ර වෙනත් රටවල් වලට විකිණීම තහනම් වූ නිසාය.
- අනිකුත් රටවල් සම්ප්‍රදායික ක්‍රම වලින් මිදී නව තාක්ෂණික ක්‍රම කරා යොමු වීමට මැළිවිය.
- එම නිසා යුරෝපයේ අනිකුත් රටවලට කාර්මික විප්ලවය ව්‍යාප්ත වීම ප්‍රමාද විය. නමුත් ලෝක ප්‍රවනතාවය හේතුවෙන් තවදුරටත් බ්‍රිතාන්‍යට එය ආරක්ෂා කරගත නොහැකි විය.

කාර්මික විප්ලවය ව්‍යාප්ත වීමට බලපෑ හේතු →

- ජනගහනය ඉහළ යාම
- භාණ්ඩ වලට තිබූ ඉල්ලුම
- ප්‍රවාහන කටයුතු වල වර්ධනය
- ප්‍රංශය හා ජර්මනිය ගල් අඟුරු සොයා ගැනීම

කාර්මික විප්ලවය ව්‍යාප්ත වූ රටවල් →

- ප්‍රංශය
- ජර්මනිය
- බෙල්ජියම
- ඔස්ට්‍රියාව
- හංගේරියාව
- ප්‍රෂියාව
- ජපානය

බ්‍රිතාන්‍ය යටත්විජිත තුළ කාර්මික විප්ලවයේ බලපෑම →

- ඇමරිකන් ජනපද (නිදහසට පෙර )
- චීනය
- ඉන්දියාව
- ශ්‍රී ලංකාව

**කාර්මීකරණයේ ප්‍රතිඵල**

- කාර්මික විප්ලවය පදනම් කර ගනිමින් එම රටවල දේශපාලන, ආර්ථික, සමාජීය වෙනස්කම් ඇතිවිය.

<u>දේශපාලන වෙනස්කම්.</u>

- මුදල් ආයෝජනය කරනු ලබන ධනපති පන්තියක් හා ශ්‍රමය විකුණා ජීවත් වන නිර්ධන පන්තියක් බිහිවීම.
- ධනපතීන් විශාල ලාභ ලබාගත් අතර ශ්‍රමිකයන්ගේ ජීවන තත්වය පහත වැටුණි.
- ශ්‍රමයට සරිලන වැටුපක් සහ සුඛසාධන පහසුකම් ඉල්ලා කම්කරු සටන් ඇතිවිය.
- ධනපති - කම්කරු ගැටුම්, වෘත්තීය සංගම් බිහිවීම, සේවක වැඩවර්ජන, අයිතිවාසිකම් සඳහා සටන් ඇතිවිය.
- මෙහි ප්‍රතිඵලය වූයේ ලිබරල්වාදය හා සමාජවාදී දේශපාලන දර්ශන ඇතිවීමයි.

<u>ආර්ථික වෙනස්කම්.</u>

- කාර්මීකරණය පුළුල් වීම සිදු වූ අතර ඒ තුළින් වෙළෙඳ හා වාණිජ කටයුතු ඇතිවීම.
- ඒ තුළින් ධනපති පන්තියක් හා වෙළෙඳ පන්තියක් වර්ධනය වීම.
- ඉඩම් හිමි ගොවීන් ද වැටුප මත යැපෙන සේවකයන් වීම තුළ දේශීය යැපුම් ආර්ථිකය බිඳවැටී ආනයන අපනයන වෙළෙඳපොළක් ඇතිවීම.
- කාර්මීකරණය සමඟ විශාල නිෂ්පාදන රටාවක් ගොඩනැගුණි. ඒවා යුරෝපීන්ගේ යටත් විජිතවලට ව්‍යාප්ත වීම නිසා දේශීය විදේශීය වෙළෙඳාමක් බිහිවිය.
- බද්ධ ව්‍යාපාර සමාගම් හා බහුජාතික සමාගම් බිහිවීම.
- මුදල් හා බැංකු කටයුතු ආරම්භය

<u>සමාජ වෙනස්කම්</u>

- නිෂ්පාදන භාණ්ඩ නිෂ්පාදනය අධික වීම තුළ දැරිය හැකි මිලකට ජනතාවට මිලදී ගතහැකිවීම.
- කර්මාන්තශාලා වල විශාල රැකියා වෙළෙඳපොළක් ඇතිවීම.
- ග්‍රාමීය ජනතාව නාගරීකරණයට මුසුවීම.
- පන්ති සහිත සමාජයක් බිහිවීම.( ඉඩම් හිමි ධනවතුන් හා මධ්‍යම පන්තික ව්‍යාපාර හිමියන්,කම්කරුවන් ලෙස )
- කර්මාන්ත හිමියන් සේවකයින්ට අඩු වැටුපක් ගෙවා ඔවුන් සුඛෝපභෝගී ජීවිතයක් ගත කිරීම.
- ස්ත්‍රීන්ට හා ළමුන්ට ඉතා අඩු පහසුකම් යටතේ පැය 12 - 14 ක් පමණ සේවය කිරීමට සිදුවීම.
- අඩු සනීපාරක්ෂක පහසුකම් සහිත මුඩුක්කු නිවාස පේළි වල සේවකයන්ට ජීවත්වීමට සිදුවීම.
- වායු දූෂණය හා ජල දූෂණය ඇතිවීම.

***කාර්මික විප්ලවය ශ්‍රී ලංකාව කෙරෙහි බලපෑම***

- බ්‍රිතාන්‍යයේ යටත්විජිතයක්ව පැවති ශ්‍රී ලංකාව තුළ කාර්මික විප්ලවයේ බලපෑම ඇතිවිය.
- මෙරට වතු වගාව ආරම්භ කළ අතර ( කෝපි, තේ, , රබර් , පොල් ) ඒ සඳහා යන්ත්‍ර සූත්‍ර මෙරටට පැමිණීම.
  - ✓ 1804 ෆෙඩ්රික් නෝර්ත් ආණ්ඩුකාරවරයා කෝපි කෙටීමට මෝළක් ආරම්භ කිරීම.
  - ✓ තේ වියළීමේ සිට වර්ග කිරීම හා අපනයනය දක්වා වූ ක්‍රියාවලිය යන්ත්‍ර මඟින් සිදු කිරීම.
  - ✓ රබර් නිෂ්පාදනයට අවශ්‍ය යන්ත්‍ර සූත්‍ර සවි කිරීම.
  - ✓ 1885 මැකඩම් ක්‍රමය ලංකාවට හඳුන්වා දීම.

***මෙරට ප්‍රවාහන අංශයේ ඇති වූ දියුණුව***

<u>මහාමාර්ග ඉදිකිරීම</u>

- එඩ්වඩ් බාන්ස් මහාමාර්ග ඉදිකිරීම.
  - කොළඹ - මහනුවර
  - කුරුණෑගල - මහනුවර
  - දඹුල්ල - මහනුවර
- ගල් හා තාර යොදා මාර්ග ඉදිකිරීම.
- ලී පාලම් වෙනුවට යකඩ පාලම් ඉදිකිරීම.

<u>දුම්රිය මාර්ග ඉදිකිරීම</u>

- හෙන්රි වෝඩ් ආණ්ඩුකාරවරයා මේ සඳහා මුල්විය.
- 1858 කොළඹ මහනුවර දුම්රිය මාර්ගය ඉදිකිරීම.
- 1867 ප්‍රථම වතාවට කොළඹ සිට මහනුවරට දුම්රිය ගමන් කිරීම.
- 1871 පේරාදෙණිය සිට නාවලපිටියටත් 1899 බණ්ඩාරවෙළ දක්වා දුම්රිය මාර්ග ඉදිකිරීම.

**තැපැල් සේවය**

- 1815 කොළඹ, ත්‍රිකුණාමලය, ගාල්ල හා යාපනය යන නගර සම්බන්ධ කරගනිමින් රාජකාරී තැපැල් සේවයක් ඇරඹීම.
- කොළඹ නුවර මාර්ගය තැනීම සමඟ අශ්ව කරත්ත මඟින් තැපැල් සේවාව ඇරඹීම.
- 1857 ප්‍රථම තැපැල් මුද්දරය නිකුත් කිරීම.
- 1858 ටෙලිග්‍රාප් සේවාව ආරම්භ කිරීම.
- 1903 වනවිට මෙරට තැපැල් මධ්‍යස්ථාන 340 ක් පමණ ඉදිවිය.

**සමාජීය වෙනස්කම්**

- කම්කරු පිරිසක් හා ධනවතුන් පිරිසක් බිහිවීම.
- මෙරට උගත් මධ්‍යම ධනවත් පන්තියක් බිහිවීම.
- ධනවාදී ආර්ථික රටාවක් බිහිවීම.
- දේශීය විදේශීය මුදල් අවශ්‍යතා මත බැංකු ක්‍රමයක් බිහිවීම.

# 02 ශ්‍රී ලංකාවේ බ්‍රිතාන්‍ය බලය පිහිටුවීම

- දේශගවේෂණ ක්‍රියාවලියේ ප්‍රතිපලයක් ලෙස යුරෝපා ජාතීන් වෙනත් රටවල් සොයා ගවේෂණය කරන්නට විය. ඒ අතරින්

  පෘතුගාලය
  ස්පාඤ්ඤය
  එංගලන්තය
  ප්‍රංශය
  ඕලන්දය ප්‍රධාන වේ.

*<u>යුරෝපා ජාතීන් පෙරදිගට පැමිණීමට හේතු.</u>*

- ❖ වෙළෙඳාම හා ආර්ථිකය ශක්තිමත් කර ගැනිම.
- ❖ ආගම ප්‍රචාරය කිරීම.
- ❖ ජාත්‍යාන්තර කීර්තිය දිනා ගැනීම

- පෘතුගීසි හා ලන්දේසින් පෙරදිග තුළින් ඉහළ ආර්ථික ලාභයක් ලබන දුටු ඉංග්‍රීසින් ආසියාවට අවධානය යොමු කරන ලදී.

*<u>බ්‍රිතාන්‍යන් ආසියාවට පැමිණීමට හේතු.</u>*

- ➢ ඉංග්‍රීසි ව්‍යාපාරිකයන් පිරිසක් විසින් පෙරදිග ඉන්දියා වෙළෙඳ සමාගම පිහිටුවා ගැනීම.
- ➢ බ්‍රිතාන්‍ය කිරීටයේ හිමිකාරිනිය වූ 1 වන එළිසබෙත් මහරැජින විසින් 1600 දී ආසියාවේ වෙළෙඳ කටයුතු වල නියැලීමට රාජකීය බලපත්‍රය පෙරදිග ඉන්දියා වෙළෙඳ සමාගමට ලබාදීම.
- ➢ ප්‍රථම නැව් කණ්ඩායම සුමාත්‍රා දූපත් ප්‍රදේශයට පැමිණ වෙළෙඳ කටයුතු ආරම්භ කිරීම.
- ➢ විලියම් හොකින්ස් යටතේ දෙවන නැව් කණ්ඩායම් ඉන්දියාවට පැමිණ මූගල් අධිරාජ්‍යයා සමඟ වෙළෙඳ සාකච්ඡා ඇතිකර ගැනීම.

*<u>අග්නිදිග ආසියාව අතහැර ඉන්දියාවට අවධානය යොමු කිරීමට හේතු.</u>*

- මේ වන විට පෘතුගීසීන් හා ලන්දේසීන් එම ප්‍රදේශ වල බලය ලබාගෙන සිටීම.
- පෘතුගීසීන්ට එරෙහිව ඉංග්‍රීසීන් ලන්දේසීන්ට සහය දැක්වීම.
- අග්නිද්ග ආසියාතික ප්‍රදේශ තුළ ඉංග්‍රීසි බලයක් ස්ථාපිත වීමට ලන්දේසීන් අකමැති විය.
- 1623 දී ඇම්බොයිනා දූපත් වල ඉංග්‍රීසි හමුදාවක් ලන්දේසීන් විසින් ඝාතනය කළ නිසා එම ප්‍රදේශ වලින් ඉංග්‍රීසින් ඉවත් වීම.
- 1607 සිට ඉන්දියාව තුළ වෙළෙඳ සබඳතා ගොඩනගා ගැනීමට ඉංග්‍රීසීන් කටයුතු කළේය.
- එහි ප්‍රතිපලයක් ලෙස 17වන සියවසේ අග භාගයේ දී මදුරාසිය, බොම්බාය, කල්කටා යන ස්ථාන වල වෙළෙඳ මධ්‍යස්ථාන පිහිටුවා ගත්තේය.
- 1664 වන විට ප්‍රංශවරුන් ඉන්දියාවට පැමිණ පොන්ඩිචේරි, කරිකාල්, චන්ද්‍රනගර් අල්ලා ගැනීම නිසා ඉංග්‍රීසීන් ප්‍රංශවරුන් සමඟ ගැටුම් නිර්මාණය විය.

### *ශ්‍රී ලංකාව කෙරෙහි බ්‍රිතාන්‍යයන්ගේ අවධානය යොමුවීම.*

- ❖ ඉංග්‍රීසීන් ඉන්දියාවට පැමිණ ශතවර්ෂයක් පමණ යනතුරු ශ්‍රී ලංකාව කෙරෙහි අවධානය යොමු නොකළේය.
- ❖ ඉංග්‍රීසීන් ඉන්දියාවේ දේශපාලන බලය පැතිරවීමත් සමඟ ශ්‍රී ලංකාව කෙරෙහි අවධානය යොමු වීමට හේතු දෙකක් බලපාන ලදී.එනම්

  ✓ ශ්‍රී ලංකාවේ පිහිටීම ( ත්‍රිකුණාමලය වරායේ වැදගත්කම )
  ✓ ශ්‍රී ලංකාවෙන් කුරුඳු ඇතුළු වටිනා ද්‍රව්‍ය ලබා ගැනීම.

- ❖ ඉංග්‍රීසීන් හා ප්‍රංශවරු අතර බෙංගාල බොක්ක ආශ්‍රිත ප්‍රදේශ වල ගැටුම් ඇති වූ අවස්ථා වලදී ත්‍රිකුණාමල වරාය වැදගත් වීම.
- ❖ ත්‍රිකුණාමල වරාය කෙරෙහි ඉංග්‍රීසීන්ගේ සැලකිල්ල යොමු වීමට බලපෑ කරුණු කිහිපයකි. එනම්,
  - ✓ ත්‍රිකුණාමලය වරාය බෙංගාල බොක්කට මුහුණලා පිහිටා තිබීම.
  - ✓ ඉන්දියාවේ නැගෙනහිර වෙරළේ ඉංග්‍රීසි නාවික බලය රැකගැනීමට මෙම වරායේ පිහිටීම වැදගත්වීම.
  - ✓ ඊසානදිග මෝසම් සුළං කාලයේ නැව් ආරක්ෂා කර ගැනීමට ත්‍රිකුණාලම වරාය යොදා ගත හැකිවීම.
  - ✓ අබලන් නැව් අලුත්වැඩියා කළ හැකි වරායක් වීම.
- ❖ ත්‍රිකුණාමල වරාය ප්‍රංශවරුන් අතට පත්වුවහොත් එය තමන්ට අවාසිදායක බව ඉංග්‍රීසීන් දැන සිටියේය.
- ❖ ශ්‍රී ලංකාවේ කුරුඳු වෙළෙඳාමේ ඒකාධිකාරය තමන් අතට ගැනීමට ඉංග්‍රීසීන්ට අවශ්‍යවිය.
- ❖ ඉංග්‍රීසීන් උඩරට රාජ්‍ය අතර දූත සම්බන්ධතා කිහිපයක් සිදුවී ඇත.

| වර්ෂය | දූතයා | රජු | හේතුව |
|---|---|---|---|
| 1762 | ජෝන් පයිබස් | කීර්ති ශ්‍රී රාජසිංහ රජු | වෙළෙඳ සබඳතා පවත්වා ගැනීමට |
| 1782 | හියුබොයිට් | රාජාධිරාජසිංහ රජු | වෙළෙඳ සබඳතා පවත්වා ගැනීමට |
| 1795 | රොබට් ඇන්ඩෲස් | රාජාධිරාජසිංහ රජු | ලන්දේසීන් සතු බලකොටු අල්ලා ගැනීමේදී උඩරට රජුගේ සහය ලබා ගැනීම. |

## ***බ්‍රිතාන්‍ය බලය පිහිටුවීම.***

<u>ශ්‍රී ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශවල බ්‍රිතාන්‍ය බලය පිහිටුවීම.</u>

1789 ප්‍රංශ විප්ලවයෙන් පසු ප්‍රංශ හමුදාව 1794 දී ඕලන්දය ආක්‍රමණය කිරීම.

⇓

ඕලන්ද පාලක ස්ටැඩින්හෝල්ඩර්වරයා වූ පස්වන විලියම් රජු බ්‍රිතාන්‍යට පළා යෑම.

⇓

පස්වන විලියම් රජු ලවා ඉංග්‍රීසීන්ට වාසිදායක වන ලෙස ලිපියක් ලියවා ගැනීම. ( එය කිව් ලිපිය නම් වේ )

⇓

1795 දී එම ලිපිය මෙරට ලන්දේසි ආණ්ඩුකාරවරයා වූ ෆන් එංගල්බෙක් ට ලබා දුන් නමුත් ඔහු එය පිළිනොගැනීම.

⇓

1795 අගෝස්තු මාසයේදී ත්‍රිකුණාමල වරාය අල්ලා ගැනීම. ඉන් අනතුරුව මුලතිව්, පේදුරුතුඩුව, යාපනය, මන්නාරම යන බලකොටු අල්ලා ගැනීම.

⇓


1796 පෙබරවාරි මාසය වන විට කොළඹ හා ගාල්ල බලකොටු ඇතුළු ලන්දේසීන් සතු ශ්‍රී ලංකාවේ සියලු ප්‍රදේශ ඉංග්‍රීසීන් යටතට පත්වීම.

⇓

1796පෙබරවාරි 16 වන දින ලන්දේසීන් හා ඉංග්‍රීසීන් අතර සාමකාමී ගිවිසුමක් අත්සන් කිරීම.

## *ඉංග්‍රීසි වෙළෙඳ සමාගම යටතේ මුහුදු බඩ ප්‍රදේශ වල පාලනය.*

- ✓ මුහුදුබඩ ප්‍රදේශ පාලනයේදී පෘතුගීසීන් හා ලන්දේසීන් ස්වදේශීය නිලධාරීන් යොදා ගන්නා ලදී.
- ✓ නමුත් ඉංග්‍රීසීන් ස්වදේශීය නිලධාරීන් ඉවත් කරමින් ඉන්දියාවේ මද්‍රාසි නිලධාරීන් ගෙන්වා ගත්තේය.
- ✓ 1796 වර්ෂයේ සිට 1798 දක්වා වෙළෙඳ සමාගම විසින් මුහුදුබඩ ප්‍රදේශ පාලනය කරන ලදී.




- ✓ සමාගමට වියදම් වූ මුදල ඉක්මනින් පියවා ගැනීමට නව බදු පනවා ඒවා එකතු කිරීමට මෙම පාලන ක්‍රමය ක්‍රියාත්මක කළේය.
- ✓ මද්‍රාසි නිලධාරීන් මෙරට භාෂාව, සංස්කෘතිය හා සම්ප්‍රදායන් නොසළකා හරිමින් බදු එකතු කිරීම නිසා මහජනතාව සමඟ ගැටුම් ඇතිවිය.
- ✓ ඉංග්‍රීසි පාලනයට විරුද්ධව පහතරට කැරැල්ලක් නිර්මාණය විය.
- ✓ පොල්ගස් බද්ද, ලුණු බද්ද, මාළු බද්ද, දුම්කොළ බද්ද වැනි නව බදු ඇති කිරීම.
- ✓ බදු ගෙවීමට සිදු වූයේ මුදල් මගිනි. ( ජනතාව පුරුදු වී සිටියේ භාණ්ඩ මගින් බදු ගෙවීමටය )
- ✓ කැරැල්ල මර්දනය කිරීමෙන් අනතුරුව කොමිසමක් පත් කළ අතර එය ද *මියුරන් කොමිසම* නම් විය.

### *මියුරන් කොමිසමේ නිර්දේශයන් .*

- මද්‍රාසි නිලධාරීන් ඉවත්කොට ස්වදේශීය නිලධාරීන් යටතේ බදු එකතු කරවීම.
- පොල්ගස් බද්ද ඇතුළු අලුත් බදු ඉවත් කිරීම.
- ආදායම් එකතු කිරීම හා අධිරකණ කටයුතු සඳහා වෙන වෙනම නිලධාරීන් පත් කිරීම.
- ලන්දේසි උසාවි ක්‍රමය නැවත පිහිටුවීම.

- ✓ 1798 සිට 1802 දක්වා ද්විත්ව පාලනයක් ක්‍රියාත්මක විය. එනම් කිරීටය හා වෙළෙඳ සමාගම් එක්ව පාලනය කිරීමයි.
- ✓ මෙරට පරිපාලනය හා දේශපාලන කටයුතු මෙහෙයවීමට ආණ්ඩුකාර ධූරයක් ඇති කරමින් ෆෙඩ්රික් නෝර්ත් ආණ්ඩුකාරවරයා ලෙස පත් කිරීම.
- ✓ තවදුරටත් ආදායම් එකතු කිරීමට සමාගමට බලය ලබා දීම හා ආණ්ඩුකාරවරයාට උපදෙස් ලබාදීම සිදුවිය.
- ✓ ද්විත්ව පාලනය අසාර්ථක වීම නිසා 1802 දී කිරීටයේ පාලනය යටතට මුහුදුබඩ ප්‍රදේශ ලබා ගන්නා ලදී.

## *ඉංග්‍රීසීන් උඩරට රාජධානිය යටත් කර ගැනීම.*

- ඉංග්‍රීසීන් පහතරට බලය ලබාගන්නා විට උඩරට පාලකයා වූයේ රාජාධිරාසිංහ රජුය. ඔහු 1798 දී මිය ගියේය.
- 1798 දී උඩරට මහාධිකාරම් පිළිමතලව්වේ විසින් උඩරට රජු ලෙස පත් කළේ මුත්තුසාමි කුමාරයා නොව කන්නසාමි කුමාරයාය. ඔහු ශ්‍රී වික්‍රම රාජසිංහ රජු නම් විය.
- මුත්තුසාමි කුමාරයා රජකම හිමි නොවූ නිසා ආරක්ෂාව පතා ඉංග්‍රීසීන් වෙත පළා ගියේය.
- ෆෙඩ්රික් නෝර්ත් ආණ්ඩුකාරවරයා 1800 වර්ෂයේදී සෙන්පති මැක්ඩොවල්ගේ නායකත්වයෙන් දූත පිරිසක් උඩරටට යැවීමට කටයුතු කළේය.
- එම දූත පිරිසට හමුදා භටයින් 1164 ක් හා කාලතුවක්කු 8 ක් සහිතව උඩරටට ගිය නමුත් රජු විසින් උඩරටට ගෙන්වා ගනු ලැබුවේ සීමිත පිරිසකි.
- දූත පිරිස විසින් ඉදිරිපත් කළ කොන්දේසි රජතුමා පිළිනොගැනීම නිසා මෙම දූත ගමන අසාර්ථක විය.

## *ඉංග්‍රීසීන් උඩරට ආක්‍රමණය කිරීමට හේතු.*

- උඩරට ස්වාධීන රාජ්‍යයක් ලෙස පැවතීම.
- උඩරට දේශසීමා හා මුහුදුබඩ ප්‍රදේශ වල ආරක්ෂාවට විශාල වියදමක් දැරීමට සිදුවීම.
- පහතරට ජනතාව තම රජු ලෙස උඩරට රජු පිළිගැනීම.
- පහතරට කැරලි ඇති වූ විට උඩරට රජු සහයෝගය දීම.
- කොළඹ හා ත්‍රිකුණාමලය පාලන මධ්‍යස්ථාන අතර ගොඩබිම් මාර්ගය වැටී තිබුණේ උඩරට රාජධානිය හරහාය.

*<u>1803 උඩරට ආක්‍රමණය.</u>*

| වර්ෂය | ආණ්ඩුකාරවරයා | උඩරට රජු | ආක්‍රමණය අසාර්ථක වීමට හේතු |
|---|---|---|---|
| 1803 | ෆෙඩ්රික් නෝර්ත් නායකත්වය- මැක්ඩොවෙල් | ශ්‍රී වික්‍රම රාජසිංහ | • උඩරට ජනතාව රජු වටා ඒකරාශී වීම.<br>• උඩරට දේශගුණය හා භූගෝලීය පසුබිම පිළිබඳව අවබෝධයක් නොමැති වීම. ( වැසි සමය හේතුකොට ගෙන ලෙඩරෝග පැතිරී යාම. )<br>• ඉංග්‍රීසීන් විසින් මුත්තුසාමි රජු ලෙස පත් කළත් එය ජනතාව පිළිනොගැනීම.<br>• උඩරටියන් ඉංග්‍රීසීන්ගේ සන්නිවේදනය අඩාල කරමින් සැපයුම් මාර්ග අවහිර කිරීම.<br>• ඉංග්‍රීසි හමුදාව උඩරටියන් විසින් සමූල ඝාතනය කිරීම. |

- 1805 දී තෝමස් මෙට්ලන්ඩ් ආණ්ඩුකාරවරයා ලෙස මෙරටට පැමිණියේය.
- ඔහු ආක්‍රමණශීලී ප්‍රතිපත්තියක් වෙනුවට උපායශීලී ප්‍රතිපත්තියක් අනුගමනය කරමින් ජෝන් ඩොයිලි එයට යොදා ගනු ලැබුවේය.

*ජෝන් ඩොයිලි.................*

- කේම්බ්‍රිජ් විශ්වවිද්‍යාලයේ උපාධිදාරියෙක් වන මොහු ලංකාවට පැමිණියේ සිවිල් නිලධාරියෙක් ලෙසය.
- තෝමස් මෙට්ලන්ඩ් හා රොබට් බ්‍රවුන්රික් ආණ්ඩුකාරවරුන් යටතේ මොහු සේවය කළේය.
- දේශීය සංස්කෘතිය, ආගම, භාෂාව හොඳින් ඉගෙනගෙන සිංහල ජනතාවගේ මිත්‍රයෙක් ලෙස උඩරටට පැමිණියේය.

- ➢ රජු හා රදළ ප්‍රධානීන් සමඟ මිත්‍රශීලීව කටයුතු කරමින් ඔවුනොවුන් අතර ගැටුම් ඇති කිරීමට කටයුතු කළේය.
- ➢ වෙළෙන්දන් හා සාත්තරකරුවන් ලෙස ඔත්තුකරුවන් යවා උඩරට රහසිගත තොරතුරු සොයා ගත්තේය.
- ➢ මොහු කිසිදු යුරෝපියෙකුට සොයා ගත නොහැකි වූ උඩරට රාජධානියේ ආරක්ෂක රහස් අනාවරණය කරගෙන අවස්ථානුකූලව උඩරට ආක්‍රමණය කළේය.

*<u>උඩරට ඉංග්‍රීසීන්ට යටත් වීමට හේතු.</u>*

- ඉංග්‍රීසීන්ගේ උපායශීලී ක්‍රියාකලාපය.
- තරුණ රජු නායාක්කාර් ඥාතීන්ගේ බසට අවනත වී වැරදි තීරණ ගැනීම.
- මහාධිකාරම්වරුන් දෙදෙනාම රජු සමඟ විරසක වීම.
- පිළිමතලාවේ මහාධිකාරම් හා රජු අතර ගැටුම් ඇති වී මහාධිකරම්ට මරණීය දණ්ඩනය ලබාදීම.
- භික්ෂූන් වහන්සේලා ඝාතනය කිරීම නිසා භික්ෂූන් හා ජනතාව රජුට පක්ෂපාතී නොවීම.
- ඇහැලේපොළ වෙනුවට ඔහුගේ පවුලේ සාමාජිකයන් අමානුෂික ලෙස ඝාතනය කිරීම.

### *1815 උඩරට ආක්‍රමණය කිරීම.*

- ❖ 1815 දී උඩරට රාජධානියේ අභ්‍යන්තර බල අරගලය හේතුකරගෙන රොබට් බ්‍රවුන්රික් ආණ්ඩුකාරවරයා උඩරට ආක්‍රමණය කිරීමට තීරණය කළේය.
- ❖ ජෝන් ඩොයිලිගේ බුද්ධි තොරතුරු මත හා ඉංග්‍රීසීන් වෙතට පලාගොස් සිටි ඇහැලේපොළගේ උපදෙස් මත උඩරට ආක්‍රමණය සිදු කළේය.
- ❖ ඉංග්‍රීසීන් උඩරට ජනතාවට ප්‍රකාශ කළේ උඩරැටියන්ගේ යහපත වෙනුවෙන් සිදු කරන බවත් උඩරැටියන්ගේ සතුරා ඉංග්‍රීසීන් නොව ශ්‍රී වික්‍රම රාජසිංහ රජු බවත්ය.
- ❖ 1815 ජනවාරි මාසයේ දී කොළඹ, ගාල්ල, මීගමුව, ත්‍රිකුණාමලය හා මඩකලපුව යන ප්‍රදේශ වලින් සේනාංක අටක් මහනුවරට ගමන් කළේය.
- ❖ 1815 පෙබරවාරි 18 වන දින උඩරැටියන් විසින්ම රජුව හා බිසෝවරුන් දෙදෙනා මහනුවර බෝමුරේ නැමති ස්ථානයේ දී අල්ලා දුන්නේය.
- ❖ ඩොයිලිගේ ආරක්ෂාව යටතේ රජු හා බිසෝවරුන් කෙළඹට රැගෙන ආ අතර 1816 දී ඉන්දියාවේ වෙල්ලෝරයට පිටුවහල් කරන ලදි.
- ❖ යුරෝපා රාජ්‍යන්ට අල්ලා ගත නොහැකි වූ කන්ද උඩරට ගැටුමකින් තොරව ඉංග්‍රීසීන්ට අල්ලා ගැනීමට හැකිවිය.

*1815 උඩරට ගිවිසුම.........*

- ❖ *1815 මාර්තු 02 දා සිට 10 වන දින දක්වා මහනුවර මඟුල් මඩුවේදී වගන්ති 12 කින් යුත් ගිවිසුම රදළ ප්‍රධානීන් අත්සන් කළේය.*
- ❖ *02 වන වගන්තියේ සඳහන් වන්නේ ශ්‍රී වික්‍රම රාජසිංහ රජු හා ඔහුගේ ඥාතීන්ට සිහසුන උරුම නොවන බවයි.*
- ❖ *4වන වගන්තියේ සඳහන් වන්නේ උඩරට සම්ප්‍රදායික නිලධාරීන් වූ රදළයන් සතු තනතුරු හා අයිතිවාසිකම් ආරක්ෂා කරන බවයි.*
- ❖ *5වන වගන්තියේ සඳහන් වන්නේ රටවැසියන් අදහන බුද්ධාගම හා දේව ආගම්ද, භික්ෂූන් වහන්සේලා හා වෙහෙර විහාරද ආරක්ෂා කරන බවයි.*
- ❖ *6, 7 වගන්ති වල සඳහන් වන්නේ අංග ඡේදනය වැනි පැරණි දඬුවම් ක්‍රම අහෝසි කර මරණ දඬුවම ලබා දීමේ බලය ආණ්ඩුකාරවරයා සතු කිරීම.*

## *1818 නිදහස් සටන*

කැරැල්ල මෙහෙය වූ නායකයන් - කැප්පෙටිපොළ නිලමේ
- මඩුගල්ලේ දිසාව
- කිවුලේගෙදර මොහොට්ටාල
- පිළිමතලව්වේ දෙවන අධිකාරම්
- බූටෑවේ රටේ රාළ
- කොහුකුඹුරේ රාළ
- කතරගම බස්නායක නිළමේ

කැරැල්ල ඇතිවීමට හේතු - දේශිය රජෙකු නොමැති වීම.
- 5වන වගන්තියේ සඳහන් වන බුදුදහම ආරක්ෂා කිරීම යන වගන්තිය කඩ කිරීම.
- රදළ ප්‍රධානින්ගේ බලතල හා වරප්‍රසාද සුරක්ෂිත නොවීම.
- ආසන්නතම හේතුව මඩිගේ මොහන්දිරම් තනතුර හජ්ජි මරික්කාර්ට ලබාදීම.

කැරැල්ල ව්‍යාප්ත වීම - - ප්‍රභූවරුන්ට හා ජනතාවට ඉංග්‍රීසි පාලනය එපාවීම.
සිංහාසනයට උරුමයක් ඇති දොරේ සාමි නැමැත්තා වෙල්ලස්සේ ජනතාව සංවිධානය කිරීම.
හජ්ජි මරික්කාර් මොහන්දිරම් වෙල්ලස්සට ගියවිට සටන්කාමීන් ඔවුන් මරා දැමීම.
බදුල්ල ඒජන්ත ඩග්ලස් විල්සන්ද සටන්කාමීන් විසින් මරා දැමීම.
කැප්පෙටිපොළ කරැල්ල මර්දනය කිරීමට ගියත් ඉංග්‍රීසි හමුදාව හරවා යවා කරැල්ලට එකතු විය.
කැප්පෙටිපොළ කැරැල්ලට එකතුවීමත් සමඟ උඩරට සිටි ප්‍රභූවරුන් බොහෝ දෙනෙක් කැරැල්ලේ නායකත්වය ගැනීම.
රජ්‍ය උරුමයේ සංකේතය වන දළදා වහන්සේ සටන්කරුවන් අතට පත්වීමත් සමඟ සාමාන්‍ය ජනයා කැරැල්ලට එකතුවීම.
ඉංග්‍රීසින්ගේ සියලුම හමුදාව උඩරටට කැඳවා මාෂල් ලෝ ක්‍රියාත්මක කරමින් සාමාන්‍ය ජනයාගේ නිවාස වතුපිටි විනාශ කරමින් බිම්පාළු ප්‍රතිපත්තිය අනුගමනය කළේය.

කැරැල්ල අසාර්ථක වීමට හේතු - මොල්ලිගොඩ හා එක්නැලිගොඩ ඉංග්‍රීසීන්ට හිතවත්ව කටයුතු කිරීම.
- කැරලිකරුවන්ට ශක්තිමත් දීර්ඝකාලීන ආයුධ නොමැතිවීම හා සංවිධානාත්මක භාවයෙන් අඩුවීම.
- ඉංග්‍රීසීන් මර්දනකාරී ප්‍රතිපත්තිය තුළින් නායකයන් අත්අඩංගුවට ගැනීම.
- දොරේ සාමිට රාජ උරුමයක් නොමැති බව ප්‍රචාරය වීමත් සමඟ නායකයන් අතර මතභේද ඇතිවීම.

ප්‍රතිපල - 1818 නොවැම්බර් 26 දින කැප්පෙටිපොළ හා මඩුගල්ලේ හිසගසා මරා දැමීම.
- කැරැල්ලට සහභාගී වූ රදළයන්ගේ දේපළ රාජසන්තක කිරීම.
- රදළ නායකයන් බොහෝ දෙනෙක් දිවි පිදීම හා ඇතැම් අය පිටුවහල් කිරිම.
ඉංග්‍රීසින්ට සහය දුන් මොල්ලිගොඩ, එක්නැලිගොඩට වරප්‍රසාද හා තෑගිබෝග හිමිවීම.
රදළයන්ට තිබුණු අධිකරණ බලය අහෝසි කොට ඉංග්‍රීසි උසාවි ක්‍රමය පිහිටුවීම.
1818 නොවැම්බර් 21 බ්‍රවුන්රික් විසින් 1815 ගිවිසුම අහෝසි කරමින් වගන්ති 56 කින් යුත් ඒකපාර්ශවීය ගිවිසුමක් ඉංග්‍රීසීන් ඉදිරිපත් කළේය.

## *1848 නිදහස් සටන .*

කැරැල්ල මෙහෙයවූ නායකයන්

- ගොංගාලේගොඩ බණ්ඩා ( නායකත්වය )
- වීරපුරන් අප්පු
- ඩිංගිරිරාළ
- දීනිස්

**කැරැල්ල ඇතිවීමට හේතු .**

- ✓ 1833 කෝල්බෲක් කොමිසමේ ඉඩම් ප්‍රතිපත්තිය ( 1840 මුඩුබිම් පනත )
- ✓ කොල්බෲක් ක්‍රමය යටතේ අනිවාර්ය රාජකාරී ක්‍රමය බිඳවැටීම. ( ගම්සභා ක්‍රමය බිඳවැටීම. )
- ✓ නව අධිකරණ ප්‍රතිපත්ති ( ගම් මට්ටමේ නඩු විසඳීමට නගරයට යෑමට සිදුවීම. )
- ✓ සිවිල් පරිපාලන නිලධාරීන්ට තම රාජකාරියට අමතරව වතුවගාවට යොමුවීමට අවසර ලබාදීම නිසා මහජනයාගේ සබඳතා දුරස්වීම.
- ✓ රජයේ බදු ප්‍රතිපත්ති (මුද්දර, කරත්ත, ඔරු පාරු, තුවක්කු, බලු හා ඇග බදු වර්ග)

**<u>කැරැල්ල ව්‍යාප්ත වීමට හේතු.</u>**

- ✓නව බදු ප්‍රතිපත්තියට විරුද්ධව ජනතාව ඒකරාශී වීම.
- ✓කොළඹ, ගාල්ල, බදුල්ල, මහනුවර වැනි නගරවල මහජනයා රජයට විරුද්ධව එක්රැස්වීම.
- ✓බදුල්ලට රැස් වූ ජනතාව තුවක්කු බද්දට විරුද්ධව තුවක්කු කඩා දැමීම.
- ✓මහනුවර කච්චේරියට රැස්වූ හාරදහසක පමණ ජනතාව විසුරුවා හැරීමට හමුදාව කැඳවීමට සිදුවිය.
- ✓මෙය ක්‍රමයෙන් කැරැල්ලක් දක්වා වර්ධනය වෙමින් අනිකුත් ප්‍රදේශ වලටද ව්‍යාප්ත විය.
- ✓ජනතාව සංවිධානය වී ආයුධ අතැතිව රජයේ ගොඩනැගිලි වලට පහර දීම.
- ✓ගොංගාලේගොඩ බණ්ඩා, පුරන් අප්පු, ඩිංගිරිරාළ, දිනෙස් වැනි සාමාන්‍ය ජනයා නායකත්වය ගෙන සටන් මෙහෙයවිය.
- ✓දඹුලු විහාරයේ නායක හාමුදුරුවන් ඉදිරිපිට ගොංගාලේගොඩ බණ්ඩා රජු ලෙස පත්කර ගැනීම.
- ✓ටොරින්ටන් සාමිවරයා යුද්ධ හමුදාව යොදා කරැල්ල මර්දනය කිරීම.
- ✓නායකයන් අල්ලා ගැනීමත් සමඟ ගොංගාලේගොඩ බණ්ඩා රටින් පිටුවහල් කරන ලදී.
- ✓කඩහපොළ හිමියන් වෙඩිතබා මරණයට පත්කිරීම.
- ✓ඒ අනුව 1848 නිදහස් සටන ඉංග්‍රීසීන් විසින් මර්දනය කරනු ලැබීය.
- ✓

**කැරැල්ල අසාර්ථක වීමට හේතු**

මනා සංවිධානයක් නොතිබීම.
නිසි යුද පුහුණුවක් නොතිබීම.
ඉංග්‍රීසීන් උඩරට පිළිබඳ මනා දැනුමකින් යුක්තව කටයුතු කිරීම.
කැරැල්ල ප්‍රදේශ කිහිපයකට පමණක් සීමාවීම.
සාමාන්‍ය ජනතාව කැරැල්ල මෙහෙවීම.

**ප්‍රතිපල**

ටොරින්ටන් සාමිවරයා ආණ්ඩුකාර ධූරයෙන් ඉවත් කර එමර්සන් ටෙනට් පත් කිරීම.
මහජන විරෝධී නව බදු ඉවත් කිරීම.
ගොවි ජනතාවගේ ගැටලු විසඳීම සඳහා යටිතල පහසුකම් සංවර්ධනය කිරීමට පියවර ගැනීම. දළදා වහන්සේගේ භාරකාරත්වය බ්‍රිතාන්‍ය යටතට ගැනීම.

# 03. ශ්‍රී ලංකාවේ ජාතික පුනරුදය

- ✓ වර්ෂ 1815 දී බ්‍රිතාන්‍යයන් මෙරට නීත්‍යානුකූලව බලය හිමිකර ගැනීමෙන් පසුව ක්‍රිස්තියානි ආගම හා සංස්කෘතිය මෙරට ව්‍යාප්ත කළ අතර මෙරට සම්ප්‍රදායික ආගම් සහ සංස්කෘතීන්ට පහරක් එල්ල විය. ස්වදේශිකයන්ට ඉංග්‍රීසි අධ්‍යාපනය පල්ලිය තුලින් ලබාදීම තුළ ඉටහිර සංස්කෘතිය අනුගමනය කළ පිරිසක් නිර්මාණය විය.

***ජාතික පුනරුදය යනු .......***
***19 වන සියවසේදී බෞද්ධ, හින්දු, ඉස්ලාම් ජනතාව අතර තම ආගම හා සංස්කෘතිය තවදුරටත් රැකගැනීමට ඇති වූ උනන්දුව ජාතික පුනරුදය නම් වේ.***

*මිෂනාරී සංවිධාන ( 1804 - 1818 කාලය තුළ )*
මෙරට කිතුණු දහම ව්‍යාප්ත කිරීමේදී මිෂනාරී සංවිධාන ප්‍රමුඛ විය.

| ලංකාවට පැමිණි වර්ෂය | මිෂනාරී කණ්ඩායම | ක්‍රියාත්මක වූ ප්‍රදේශ |
|---|---|---|
| 1804 | ලන්ඩන් මිෂනාරී සංවිධානය | කොළඹ |
| 1812 | බැප්ටිස් මිෂනාරී සංවිධානය | කොළඹ |
| 1814 - 1815 | වෙස්ලියන් මිෂනාරී සංවිධානය | උතුරු - නැගෙනහිර ප්‍රදේශ |
| 1816 | ඇමරිකන් මිෂනාරී සංවිධානය | යාපනය - උතුරු ප්‍රදේශ |
| 1818 | චර්ච් මිෂනාරී සංවිධානය | කොළඹ, ගාල්ල, කල්පිටිය, මන්නාරම, මහනුවර |

මිෂනාරී ආගමික ව්‍යාප්ති මාධ්‍ය

**ලේඛන**

මුද්‍රණාල පිහිටුවීම.
බයිබලය සිංහලයට හා දෙමළ භාෂාවලට පරිවර්තනය කිරීම.

⇩

| වර්ෂය | ප්‍රකාශයේ නම | මුද්‍රණය කළ සංවිධානය |
|---|---|---|
| 1832 | මාසික තැග්ග | චර්ච් මිෂනාරී සංවිධානය |
| 1840 | ලංකා නිධානය | ආගමික පුස්තිකා සංගමය |
| 1842 | උරගල | බැප්ටිස්ට් සමාගම |

**දේශන**

මිනිසුන් ගැවසෙන පන්සල් හා වෙළඳ පොළවල් කඩවීදි අසල

**අධ්‍යාපනය**

මිෂනාරී නව පාසල් ආරම්භ කිරීම. ( රිච්මන්ඩ්, ඇලෝසියස්, කේරි කොලේජ් ) සෙන් තෝමස්,
මිෂනාරී අධ්‍යාපනයට රජයෙන් අනුග්‍රහය ලැබීම.
රජයෙන් රැකියාවක් ලබා ගැනීමට ඉංග්‍රීසි භාෂාව අනිවාර්ය වීම.
සිංහල හා දෙමළ දරුවන්ට ඉංග්‍රීසි අධයාපනය ලැබීමට නම් ක්‍රිස්තියානි ආගම වැළඳ ගැනීමට සිදුවීම.

### ආගමික පුනරුදය ව්‍යාප්ත වීමට හේතු.

- මිෂනාරීන් මෙරට ප්‍රතිමා වන්දනය නිසරු බව පෙන්වීම.
- බෞද්ධ හා හින්දු ඇතැම් සිරිත් විරිත් විවේචනය කිරීම.
- සිංහල, දෙමළ ස්වභාෂා අධ්‍යාපනය සඳහා රජයෙන් ආධාර නොලැබීම.
- දේශීය භාෂා නගා සිටුවීමට තිබූ අවශ්‍යතා

### බෞද්ධ පුනරුද ව්‍යාපාරය.

බෞද්ධ පුනරුද ව්‍යාපාරයට සමගාමීව මෙරට ඇති වූ ප්‍රවනතා

- පිරිවෙන් ඇතිවීම
- මුද්‍රණාල පිහිටුවීම
- පුවත්පත්, සඟරා නිර්මාණය වීම
- ප්‍රසිද්ධ වාදවිවාද පැවැත්වීම
- බෞද්ධ පාසල් ඇතිවීම
- බෞද්ධ පූජනීය ස්ථාන රැකගැනීම

<u>පිරිවෙන් ඇතිවීම</u>

- රත්මලානේ පරම ධම්ම චේතිය පිරිවෙන → වලානේ සිද්ධාර්ථ හිමි
- 1873 මාළිගාකන්දේ විද්‍යෝදය පිරිවෙන → හික්කඩුවේ සුමංගල හිමි
- 1875 පැලියගොඩ විද්‍යාලංකාර පිරිවෙන → රත්මලානේ ධම්මාලෝක හිමි

<u>මුද්‍රණාල පිහිටුවීම</u>

- පූජ්‍ය බුලත්ගම ධම්මාලෝක සිරි සුමනතිස්ස හිමි මෙරට ධනපති හා සියම් රජුගේ ආධාර ඇතිව 1862 ගාල්ලේ ලංකෝපකාර මුද්‍රණාලය පිහිටුවීම.
- ලංකාභිනව විශ්‍රැත මුද්‍රණාලය
- කවට කතික මුද්‍රණාලය
- සුදර්ශන මුද්‍රණාලය
- සරසවි සඳරැස මුද්‍රණාලය

<u>මුද්‍රණාල සමගාමීව මෙරට බිහි වූ පුවත්පත්</u>

- ලක්මිණි පහන
- ලංකාලෝකය
- සරසවි සඳරැස
- සිංහල ජාතිය → පියදාස සිරිසේන
- සිංහල බෞද්ධයා } අනගාරික ධර්මපාලතුමා
- මහාබෝධි සඟරාව }

<u>වාද විවාද පැවැත්වීම</u>

මිෂනාරී පූජකයන්ගේ දේශනයට පිළිතුරු දීම වශයෙන් භික්ෂූන් වහන්සේලාගේ මූලිකත්වයෙන් වාදවිවාද පවත්වන ලදී.
මිගෙට්ටුවත්තේ ගුණානන්ද හිමියන්ගේ ප්‍රමුඛත්වයෙන් ක්‍රිස්තියානි පක්ෂ සමඟ වාද විවාද පැවැත්වීමට සහයදුන් භික්ෂූන් වහන්සේලා

- ❖ හික්කඩුවේ සුමංගල හිමි
- ❖ පූජ්‍ය වස්කඩුවේ සුභූති හිමි
- ❖ පූජ්‍ය පොතුවිල ඉන්ද්‍රජෝති හිමි
- ❖ පූජ්‍ය රත්මලානේ ධම්මාලෝක හිමි

| | |
|---|---|
| පංචමහාවාද → | |
| බද්දේගම වාදය → | 1865 |
| වරාගොඩ වාදය → | 1865 |
| උදන්විට වාදය → | 1866 |
| ගම්පොළ වාදය | 1871 |
| පානදුරා වාදය → | 1873 |

## *හෙන්රි ස්ටීල් ඕල්කට්තුමාගේ ආගමනය හා බෞද්ධ පාසල් පිහිටුවීම*

- පානදුරා වාදය පිළිබඳ විදේශ පුවත් පත්වල දැක බුදුදහම ගැන පැහැදී ඕල්කට්තුමා (ඇමරිකානු ජාතික ) ලංකාවට පැමිණියේය.
- 1880 ජුනි මසයේදී කොළඹ පරම විඥාර්ථ සමාගම පිහිටුවා ගාල්ල, මහනුවර, රත්නපුර ප්‍රදේශවල ශාඛා ආරම්භ කිරිම.
- බෞද්ධ පාසල් පිහිටුවීමට අරමුදලක් පිහිටුවා අනන්ද විද්‍යාලය ආරම්භ කිරිම.
- වෙසක් පොහොය දිනය රජයේ නිවාඩු දිනයක් බවට පත්කිරීම.
- බෞද්ධ කොඩිය නිර්මාණය කිරිම.
- ඉරිදා දින දහම් පාසල් ඇරඹීම.

| |
|---|
| මෙරට බිහිවූ බෞද්ධ පාසල් |
| කොළඹ ආනන්ද විද්‍යාලය |
| මහනුවර ධර්මරාජ විද්‍යාලය |
| ගාල්ල මහින්ද විද්‍යාලය |
| මාතලේ විජය විද්‍යාලය |
| ගම්පොළ ජිනරාජ විද්‍යාලය |
| නාවලපිටිය අනුරුද්ධ විද්‍යාලය |
| මාතර රාහුල විද්‍යාලය |

## ***නව පිරිවෙන් හා බෞද්ධ අධ්‍යාපනය ඇති කිරීමෙන් ඇති වූ ප්‍රවනතාවන්***

- දේශීය උගතුන් පිරිසක් බිහිවීම.
- සමාජ සුධාරක පිරිසක් හා ලේඛකයන් පරපුරක් ඇතිවීම.

## ***බෞද්ධ පුනරුදයට සමගාමීව මෙරට ඇති වූ වෙනස්කම්***

- ජනතාව තුළ දේශානුරාගය දනවීමේ ව්‍යාපාර
- බෞද්ධ පූජනීය ස්ථාන රැකගැනීමේ ව්‍යාපාර
- අමද්‍යප ව්‍යාපාර

*දේශානුරාගය හා ජාත්‍යාලය දූන්වීමේ ව්‍යාපාර*

| | |
|---|---|
| අනගාරික ධර්මපාලතුමා | දේශන පැවැත්වීම |
| | සිංහල ජාතිය, සිංහල බෞද්ධයා නමින් පුවත්පත් වලට ලිපි සැපයීම. |
| පියදාස සිරිසේන | නවකතා පුවත්පත් තුළින් විදේශ සංස්කෘතිය විවේචනය කිරීම. |

### ***බෞද්ධ ස්ථාන රැකගැනීමේ කටයුතු***

- 19 වන සියවස වන විට මෙරට ජනතාව තුළ පැරණි රාජධානි පිළිබඳව දැනුම අඩු වූ අතර අනුරාධපුර, පොළොන්නරු ස්මාරක කැනීම් කොට ප්‍රතිසංස්කරණය කිරීම සඳහා කටයුතු කිරීම.
- විදේශීය විද්වතුන් වන ජෝර්ජ් ටර්නර්, එච්. සී. පී. බෙල් , හෙන්රි පාකර් විසින් ඓතිහාසික මූලාශ්‍ර සොයා එළිදක්වීම.
- ඔවුන් ලියූ පොත්පත් සිංහලයට හරවා අපේ උරුමයන් පිළිබඳ ජනතාව දැනුවත් කිරීම.
- වලිසිංහ හරිස්චන්ද්‍ර තුමා අනුරාධපුරයේ පූජනීය ස්ථාන ආරක්ෂා කර ගැනීමේ ව්‍යාපාරය ආරම්භ කිරිම.

- අනගාරික ධර්මපාල තුමා බුද්ධගයාව බේරා ගැනීම සඳහා මහබෝධි සමාගම පිහිටුවීම.

***අමද්‍යප ව්‍යාපාරය***

- බ්‍රිතාන්‍යන් මෙරට මද්‍යසාර ව්‍යාප්ත කිරීම නිසා සමාජයට අහිතකර ප්‍රතිපල රැසක් ඇතිවිය.
- මද්‍යසාර වලින් රට මුදවා ගැනීම සඳහා අමද්‍යප ව්‍යාපාරයක් ආරම්භ කළේය.
- එයට නායකත්වය ලබා දුන්නේ අනගාරික ධර්පාලතුමා , පියදාස සිරිසේන, ජෝන් ද සිල්වා වැනි අය විසිනි.
- ආගමික නායකයන් හා දේශපාලන නායකයන් එකම වේදිකාවක බ්‍රිතාන්‍යයන් විවේචනය කිරීම.

***හින්දු ආගමික පුනරුදය***

- හින්දු ආගමික හා සංස්කෘතික පිබිදීමක් ඇති කිරීමට මුල් වූ නායකයන් වන්නේ ආරුමුගන් නාවලර්තුමා, පොන්නම්බලම් රාමනාදන් ,පොන්නම්බලම් අරුනාවලම් වැනි නායකයන් විසිනි.

*ආරුමුගන් නාවලර්තුමා*

- ❖ යාපනයේ වන්නපොනෙයි (වන්නාර්පන්නේයි) ප්‍රදේශයේ මුද්‍රණාලයක් පිහිටුවා උදයභානු පුවත්පත ආරම්භ කිරීම.
- ❖ දමිළ සිසුන්ට කාණ්ඩ තුනකින් පෙළපොතක් රචනා කිරීම.
- ❖ පෙරියපුරානම්, ස්කන්ධපුරානම් වැනි කෘති පරිවර්තනය කිරීම.
- ❖ 1849 දී වන්නපොනෙයි ශෛව ප්‍රකාශන විද්‍යාලය ආරම්භ කිරීම.
- ❖ ශෛව පරිපාලන සභාව හා හින්දු අධ්‍යාපන සභාව මගින් පාසල් ආරම්භ කිරීම.
- ❖ 1872 දී යාපනයේ ශිවංගල විද්‍යාලය ආරම්භ කිරීම. එය වර්තමානයේ යාපනයේ හින්දු විද්‍යාලය වේ.

*පොන්නම්බලම් රාමනාදන්*

- ❖ 1851 දී උපත ලැබූ එතුමා නීතිවේදියෙකු ලෙස කටයුතු කිරීම.
- ❖ හින්දු පාසල් ආරම්භ කිරීමට පෞද්ගලික ධනය ලබාදීම. (පරමේශ්වර විදයාලය, රාමනාදන් විද්‍යාලය )
- ❖ කෘෘ මැකලම් ව්‍යවස්ථාදායකයේ ප්‍රථම උගත් ලාංකිකයා ලෙස පත්වීම.
- ❖ 1815 සිංහල මුස්ලිම් කෝලහලයේ දී බෞද්ධයන් වෙනුවෙන් හඬක් නැගීම.

*පොන්නම්බලම් අරුනාවලර්*

- ❖ 1853 උපත ලැබූ එතුමා ඉංග්‍රීසීන්ගෙන් නිදහස ලබා ගැනීමේ දේශපාලන අරගලයට එකතු වී කටයුතු කළේය.
- ❖ 1919 දී ලංකා ජාතික සංගමය බිහි කිරීමේ පුරෝගාමියා ලෙස කටයුතු කළ අතර එහි ප්‍රථම සභාපති ලෙස පත්විය.

***ඉස්ලාම් ආගමික පුනරුදය.***

*ඇම්. සී. සිද්දි ලෙබ්බේ*

- ❖ ඉංග්‍රීසි හා අරාබි භාෂාවන් ඉගෙන ගැනීමට මුස්ලිම් ජනතාව උනන්දු කරවීම.
- ❖ 1882 දී නෙයිසන් පුවත්පත ආරම්භ කිරීම.
- ❖ කොළඹ සහිරා විද්‍යාලය ආරම්භ කරමින් මුලස්ලිම් අධ්‍යාපනය නගා සිටුවීමට සමිති ආරම්භ කිරීම.
- ❖ මද්රාසා පාසල් ආරම්භ කිරීම.

*ටී. බී. ජයා මහතා*

- ❖ වේල්ස් කුමර විද්‍යාලය හා ආනන්ද විද්‍යාලයේ ගුරුවරයෙකු ලෙස සේවය කිරීම.
- ❖ කොළඹ සහිරා විද්‍යාලයේ විදුහල්පති වූ මෙතුමා සහිරා විද්‍යාලයේ ශාඛා රටපුරා ස්ථාපනය කිරීම.
- ❖ දේශපාලඥයෙකු වශයෙන් මුස්ලිම් ජනතාවට සේවය කළේය.

# 04. බ්‍රිතාන්‍යන් යටතේ ශ්‍රී ලංකාවේ දේශපාලන වෙනස්වීම්

- 1815 වර්ෂයේදී මුළු ශ්‍රී ලංකාවම බ්‍රිතාන්‍යන්ට යටත් වීමේ සිට 1948 පෙබරවාරි 04 වන දින නිදහස ලබා ගන්නා තෙක් වර්ෂ 133 ක කාලයක් මෙරට පාලනය කිරීමට විවිධ දේශපාලන වෙනස්කම් භාවිතා කරන ලදී.
- මෙම කාලය තුළ බ්‍රිතාන්‍යන් විසින් වරින් වර ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ හඳුන්වා දෙන ලදී.
- ලාංකිකයන් විසින් දිගින් දිගටම බලය හා වගකීම ලබා ගැනීමට උද්ඝෝෂණ සිදු කළේය.
- බ්‍රිතාන්‍යන් විසින් මෙරටට ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ 06 ක් ලබා දී ඇත.

| ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ | |
|---|---|
| කොල්බෲක් කැමරන් ප්‍රතිසංස්කරණය | 1833 |
| කෲ මැකලම් ප්‍රතිසංස්කරණය | 1910 |
| මැනිං ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය | 1920 |
| මැනිං ඩොවෙන්ෂයර් ප්‍රතිසංස්කරණය | 1924 |
| ඩොනමෝර් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය | 1931 |
| සෝල්බරි ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය | 1947 |


*කොල්බෲක් කැමරන් ප්‍රතිසංස්කරණය*

- ❖ මෙම කොමිසම ශ්‍රී ලංකාවට එවීමට සිදු වූයේ ශ්‍රී ලංකාවේ ආදායමට වඩා වියදම වැඩිවීම නිසා එයට විසඳුම් සෙවීමට.
- ❖ ඒ පිළිබඳ සොයා බලා විසඳුම් ලබා දීමට මෙරටට කොල්බෲක් ඇතුළු පිරිස එවන ලදී.
- ❖ මෙම පිරිස මෙරට සිවිල් නිලධාරීන්ගෙන්, පරිපාලන නිලධාරීන්ගෙන් හා සාමාන්‍ය ජනතාවගෙන් විමසා බලා නිර්දේශ ඉදිරිපත් කළේය.
- ❖ 1829 දී කෝල්බෲක් පැමිණියත් අධිකරණය සම්බන්ධයෙන් සොයා බැලීම සඳහා චාල්ස් හේ කැමරන් පැමිණියේ 1830 වර්ෂයේය.
- ❖ කොල්බෲක් කොමිසමේ නිර්දේශය මත සකස් කළ ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය කොල්බෲක් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය ලෙස හඳුන්වයි.

*කොමිසමේ නිර්දේශ*

- ✓ ව්‍යවස්ථාදායක හා විධායක සභා පිහිටුවීම.
- ✓ උඩරට පහතරට ඒකාබද්ධ කිරීම.
- ✓ පළාත් සංඛ්‍යාව පහකට අඩු කිරීම.
- ✓ අනිවාර්ය රාජකාරී සේවා ක්‍රමය අහෝසි කිරීම.
- ✓ රජයේ වෙළෙඳ ඒකාධිකාරය අහෝසි කිරීම.
- ✓ වතු වගාව ආරම්භ කිරීම.
- ✓ ස්වදේශිකයන්ට ඉංග්‍රීසි අධ්‍යාපනය ලබාදීම.
- ✓ ආණ්ඩුකාරවරයාගේ බලතල අඩු කිරීම.
- ✓ සිවිල් නිලධාරීන්ගේ වැටුප් කප්පාදු කිරීම.
- ✓ අධිකරණය වෙනම ආයතනයක් ලෙස පිහිටුවීම.

*ව්‍යවස්ථාදායක සභාව*



- ව්‍යවස්ථාදායකය හා විධායක සභා පිහිටුවීමෙන් බලාපොරොත්තු වූයේ ආණ්ඩුකාරවරයාගේ බලතල අඩු කිරීමය.
- සියලු දෙනාම පත් කරනු ලැබුවේ ආණ්ඩුකාරවරයා විසිනි.
- නිලනොලත් සාමාජිකයින් තෝරා ගත්තේ වාර්ගික නියෝජන ක්‍රමයෙනි.
- මෙම සභාවේ නිලලත් බහුතර පිරිස වැඩිවිය.

***විධායක සභාව***

- සාමාජිකයින් 5යි →
  - යටත්විජිත ලේකම්
  - භාණ්ඩාගරික
  - ගණකාධිකාරි
  - මිනුම්පති
  - කොළඹ රේගු අයකැමි

- ආණ්ඩුකාරවරයා සතු මුදල් බලතල අඩු කිරිමට මෙය පිහිටුවිය.
- විධායක සභාවේ තිරණ පිළිගැනිමට ආණ්ඩුකාරවරයා බැදි නොසිටියේය.

**ප්‍රතිසංස්කරණය ප්‍රතිපල.**

- ආණ්ඩුවේ අය වැය පරතරය අඩු විය.
- යුරෝපීය ව්‍යාපාරිකයන් මෙරට යටිතල පහසුකම් දියුණු කිරිමට ආණ්ඩුවට බලකලේය.
- 1865 ජොර්ජ් වොල් විසින් ලංකා සංගමය පිහිටුවිම.
- ආණ්ඩුවෙන් ප්‍රශ්න ඇසිම, යෝජනා ඉදිරිපත් කිරිම, පුවත් පත් වලට ලිපි ඉදිරිපත් කිරිම උද්ඝෝෂකයන් විසින් සිදුකලේය.
- උද්ඝෝෂණවල ප්‍රතිපලයක් ලෙස 1889 දි නිල නොලත් පිරිස 8 කිරිම.


**1910 ප්‍රතිසංස්කරණය හා පසුබිම.**

- ලාංකිය මධ්‍යම පන්තිකයන් විසින් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ ඉල්ලා සිටියේය.
- මෙරට දේශපාලන සංගම් කිහිපයක් නිර්මාණය වීය.
- 1908 දි ජේම්ස් පිරිස් මුල්වරට ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ ඉල්ලා සිටියේය.
- පහතරට සංගමය, හලාවත සංගමය හා යාපනය සංගමය එක්ව යටත් විජිත ලේකම් වරයාට පෙත්සම් ඉදිරිපත් කලේය.

**පෙත්සම් මගින් ඉල්ලාසිටි යෝජනා**

- ව්‍යවස්ථාදායකය තුළ නිලනොලත් පිරිස වැඩි කිරිම.
- වාර්ගික නියෝජන ක්‍රමය අහෝසි කිරීම.
- පළාත් බද නියෝජන ක්‍රමය අනුව නියෝජිතයින් තොරාගැනිම.
- ව්‍යවස්ථාදායක සභාවේ බලතල වැඩි කාරීම.

- 1910 නොවැම්බර් මස ආණ්ඩුක්‍රම ප්‍රකිසංස්කරණය ලබාදෙනබව යටත්විජිත ලේකම් ප්‍රකාශ කිරීම.
- හෙන්රි මැකලම් ආණ්ඩුකාරවරයා ගේ නිර්දේශය මත කෲ සාමිවරයා විසින් සකස් කළ යෝජනාවලිය 1910 කෲව් - මැකලම් ප්‍රතිසංස්කරණය වේ.
- ව්‍යවස්ථාදායක සභාවට ප්‍රථමවරට සිමිත ඡන්දයෙන් න්යෝජිතයන් පත් කිරීම.
- උගත් ලාංකිකයන් වෙනුවෙන් එක් නියෝජිතයෙකු ලෙස පත්කර ගැනීම. ඒයට පත්වුයේ පොන්නම්බලම් රාමදන්ය.
- නිලලත් පිරිස සභාවේ වැඩි පිරිස විය.




**අමද්‍යප ව්‍යාපාරය 1912- 1915**

- ❖ 1912 බ්‍රිතාන්‍යන් විසින් රා තැබෑරුම් විවෘත කිරීමට සුරාබදු පනතක් පිහිටුවීම.
- ❖ ලාංකීකයන් සුරාවට වැඩිපුර ඇබ්බැහි වීමනිසා මෙරට සංස්කෘතිය පරිහානියට පත්විය.
- ❖ ආගමික පුනරුදය තුළින් මේරට සමාජයෙන් මත්ද්‍රව්‍ය ඉවත් කිරීමට අමද්‍යප ව්‍යාපාරය නිර්මාණය විය.

**අමද්‍යප උද්සෝෂණයේ ලක්ෂණ.**

- ❖ රජයේ සුරාබදු ප්‍රතිපත්තියට එරෙහිව මහජන මතය සැකසිම.
- ❖ ඉංග්‍රිසි උගත් මධ්‍යම පන්තිය හා ආගමික ක්‍රියාකාරීන් ඒකම අරමුණකින් කටයුතු නිරීම.
- ❖ අමද්‍යප සභා රට පුරා පිහිටුවීම.
- ❖ අමද්‍යප වේදිකාවේදි ආණ්ඩුවේ කටයුතු විවේචනය කිරීම.
- 1915 දි මහානුවර ප්‍රදේශයේ සිංහල මුස්ලිම් කෝලාහලය මුල්කරගේන අමධ්‍යප ව්‍යාපාරය මර්ධනය කිරීම.
- අමද්‍යප ව්‍යාපාරය තුළින් ඉදිරියට පැමිණි නායකයන් වන්නේ ඩී. එස්. සේනානායක, ඩී. බී. ජයතිලක, එෆ්. ආර්. සේනානායක වේ.


*ඉන්දියානු ජාතික ව්‍යාපාරයේ ආභාසය.*

- 1885 වර්ෂයේ සිට ඉන්දියාව තුළ බ්‍රිතාන්‍ය විරෝධි ව්‍යාපාර ඇතිවිය.
- ස්වරාජ්‍ය සංකල්පය මත උද්සෝෂණ කළ නායකයන් වන්නේ
  - සුරේන්ද්‍රනාත් බැනර්ජී
  - මහත්මා ගාන්ධි
  - බාල් ගංගාධාර් තිලක්
  - ජවහල්ලාල් නේරු
- මහත්මා ගාන්ධි හා ජවහල්ලාල් නේරු මෙරටට පැමිණ ජනතාව ඇමතීම නිසා මෙරට ජනතාවගේ උද්යෝගය වැඩිවිය.
- ඉන්දියාවේ මෙන් ලංකාවේ ද උද්සෝෂණ සංවිධානය කිරීම ආරම්භවිය.

*ලංකා ජතික සංගමය.*


- 1915 මුස්ලිම් කෝලාහලය අවස්ථාවේ යුධ නීතිය මගින් ජනතාව මර්දනය කිරීම නිසා ලාංකිකයන් වටහා ගත්තේ ව්‍යවස්ථාව තුළ වැඩි බලයක් ලාබාගත යුතුබවයි.
- කුඩා කුඩා සංවිධාන රැසක් විසින් වෙන වෙනම ඉල්ලීම් ඉදිරිපත් කළත් ජතික එකමුතු කමක් නොමැති නිසා ඉල්ලීම් දිනාගත නොහැකි විය.
- 1919 දෙසැම්බර් මස බොහෝ සංවිධාන එකතුවීමෙන් ලංකා ජාතික සංගමය පිහිටුවා ගත්තේය.
- එහි ප්‍රථම සභාපති වරයා වුයේ පොන්නම්බලම් අරුණාචලම් ය.
- සිංහල, දෙමළ, මුස්ලිම් ජන කෝටස්වල එකතුවෙන් දේශපාලන උද්ඝෝෂණ ඇතිකලේය.
- ඒහි ප්‍රතිඵලයක් ලේස 1920 ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය ලබා ගත්තේය.

*1920 මැනිං ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය.*




- ❖ මුල්වරට ව්‍යවස්ථාදායකය සභාවට නිලනොලත් පිරිස වැඩිවිය.
- ❖ පළාත්බද නියෝජන ක්‍රමය ඇතිවිම.
- ❖ වාර්ගික නියෝජන ක්‍රමය තවදුරටත් ක්‍රියාත්මක විම.
- ❖ නාමකරණයේන් පත්කළ 7 දෙනා ආණ්ඩුකාරවරයාට පක්ෂපාතිව කටයුතුකිරිම නිසා තවදුරටත් ආණ්ඩුකාරවරයා බලවත් විය.
- ❖ ලංකා ජාතික සංගමය බලාපොරොත්තු වු සංශෝධන නොලැබුනු නිසා මේය ප්‍රතික්ෂේප කලේය.
- ❖ නමුත් මැනිං ආණ්ඩුකාරවරයා කෙටි කලකින් නව ප්‍රතිසංස්කරණයක් ලබාදෙන බවට පොරොන්දු විය.

*1924 මැනිං ඩෙවොන්ෂයර් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය.*




- ❖ මෙම ප්‍රතිසංස්කරණයෙන් නිලනොලත් පිරිස බහුතරයක් විය.
- ❖ ව්‍යවස්ථාදායකයේ බහුතර බලය ආණ්ඩුකාරවරයාට හිමි නොවීය.
- ❖ බලය හා වගකීම වෙන්වූ ආණ්ඩුක්‍රමයක් විය.

*ඩොනමෝර් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය. 1931*

- ➢ මැනිං ඩෙවොන්ෂර් ප්‍රතිසංස්කරණයේ දුර්වලතා හියු ක්ලිපර්ඩ් විසින් යටත් විජිත ලේකම් වරයාට දැන්වීමේ ප්‍රතිඵලයක් ලෙස ඩොනමෝර් කොමිසම 1927 දි ලංකාවට පැමිණේ.
- ➢ ලාංකිකයන්ට වැඩිපුර දේශපාලන වගකීමක් පැවරෙන ආණ්ඩුක්‍රමයක් නිර්මාණය කළේය.

**හඳුන්වාදුන් නවාංග**

- ✓ ව්‍යවස්ථාදායක සභාව රාජ්‍ය මන්ත්‍රණ සභාව නමින් හැඳින්වීම.
- ✓ සර්වජන ඡන්ද බලය හඳුන්වා දිම. (සියලුම සීමාවන් එකවර ඉවත් කිරීම)
- ✓ විධායක කාරකසභා ක්‍රමය.
- ✓ අමාත්‍ය මණ්ඩලය.
- ✓ රාජ්‍ය නිලධාරින් තිදෙනා
- ✓ කතානායක ධුරය හඳුන්වාදීම
- ✓ වාර්ගික නියෝජනය ඉවත් කිරීම
- ✓ රාජ්‍ය මන්ත්‍රණ සභාවේ මූලාසනය කථානායකවරයාට හිමිවීම




*සර්වජන ඡන්ද බලය*

- ➢ 1912 - 1924 දක්වා ආන්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ තුළින් සීමිතඡන්ද බලය ලබාදී තිබේ.
- ➢ අධ්‍යාපනය, වත්කම් හා ස්ත්‍රී පුරුෂ භාවය ඡන්දය හිමිවීමේ සුදුසුකම් විය.
- ➢ මෙම සීමාවන් ඉවත් කර සියලු දෙනාටම ඡන්ද බලය හිමිවන ක්‍රමය සර්වජන ඡන්ද බලය ලෙස හඳුන්වයි.
- ➢ මෙරට සාමාන්‍ය ජනයාට ඡන්ද බලය හිමි නොවීම නිසා ගැටලු මතු වී ඇතිබව කොමිසම තේරුම් ගෙන ඇත.
- ➢ එම නිසා ඩොනමෝර් ආණ්ඩුක්‍රමය මඟින් අවුරුදු 21 ට වැඩි ස්ත්‍රී පුරුෂ සියලු දෙනාට සර්වජන ඡන්ද බලය ලබා දෙන ලදී.
- ➢ බ්‍රිතාන්‍ය තුළ සර්වජන ඡන්ද බලය ලබා දුන්නේ 1929 දීය. ඉන් කෙටි කලකින් මෙරටට සර්වජන ඡන්ද බලය ලබා දුන්නේය.
- ➢ අනිකුත් යටත් විජිත වල ඡන්දය දීමට තිබූ සීමාවන් එකින්එක ඉවත් කළ අතර ශ්‍රී ලංකාවේ සීමාවන් එකවිට ඉවත් කරමින් 1931 දී සර්වජන ඡන්ද බලය ලබා දුන්නේය.
- ➢ මෙරට දේශපාලන ප්‍රතිසංස්කරණ ඉල්ලා සිටි ප්‍රභූන් සර්වජන ඡන්ද බලය ලබා දෙනවාට විරුද්ධ වී ඇත
- ➢ ඡන්දය ලබා ගැනීමේ අරමුණින් 1935 දී ලංකා සමසමාජ පක්ෂය ආරම්භ කිරීම.

## *විධායක කාරක සභාව*

- ❖ රාජ්‍ය මන්ත්‍රණ සභාවේ සාමාජිකයන් විධායක කාරක සභා හතට බෙදනු ලැබීය.
- ❖ කථානායක හා රාජ්‍ය නිලධාරීන් තිදෙනා මෙම කාරක සභා වලට අයත් නොවීය.
- ❖ රාජ්‍ය මන්ත්‍රණ සභාවේ සාමාජිකයන් කිසියම් පදනමකින් තොරව කාරක සභා හතකට බෙදනු ලැබීය.
- ❖ එක් එක් කාරක සභාවේ සාමාජිකයන් විසින් එක් අයෙක් සභාපති ලෙස පත් කරගනු ලබයි.
- ❖ කාරකසභා වල සභාපතිවරුන් ඇමතිවරු ලෙස කටයුතු කිරීම.

| කාරක සභාව | සභාපතිවරයා |
|---|---|
| ස්වදේශ කටයුතු | සර් ඩී. බී. ජයතිලක |
| කෘෂිකර්ම හා ඉඩම් | ඩී. එස්. සේනානායක |
| පළාත් පාලන | සී. බටුවන්තුඩාව |
| සෞඛ්‍ය | ටී. බී. පානබොක්කේ |
| අධ්‍යාපන | සී. ඩබ්. ඩබ්. කන්නන්ගර |
| ගමනාගමන හා පොදුවැඩ | එම්. එම්. මාකන් මාකර් |
| කම්කරු හා වෙළෙඳාම් | පී. සුන්දරම් |

## *කාරකසභා හා රාජ්‍ය නිලධාරීන්*

- ➢ මෙම ප්‍රතිසංස්කරණය මඟින් ආණ්ඩුකරුගේ බලතල සීමා විය.
- ➢ ආරක්ෂාව, මුදල් හා නීති කටයුතුවල බලතල තවදුරටත් රාජ්‍ය නිලධාරීන් තිදෙනා හට පැවරුණි.
- ➢ කාරකසභා වලට අවශ්‍ය මුදල් ලබා ගැනීමේදී මුදල් ලේකම්ගෙන් අවසර ගත යුතුය.
- ➢ රාජ්‍ය නිලධාරීන් තිදෙනා තම බලතල භාවිතා කරමින් කාරකසභා වල වැඩකටයුතු ප්‍රමාද කරන ලදී.
- ➢ එම නිසා රාජ්‍ය නිලධාරීන් තිදෙනා යම් තරමක බලවත් භාවයකින් යුක්ත විය.

## *නිදහස සඳහා උද්ඝෝෂණ*

- 1931 සිට බ්‍රිතාන්‍යන් සතු බලතල සීමා කරමින් ඒවා ලාංකීය අමාත්‍යවරුන්ට ලබා ගැනීමට උද්ඝෝෂණ ව්‍යාපාර ඇතිවිය.
- ඩොනමෝර් ආණ්ඩුක්‍රමය සංශෝධනය කර ලාංකීයන්ට බලය ලබා ගැනීමට කටයුතු කළේය.
- ඇමතිමණ්ඩලය, රාජ්‍ය මන්ත්‍රණ සභාවේ සාමාජිකයන්, ලංකා ජාතික සංගමය හා වාමාංශික පක්ෂ විසින් උද්ඝෝෂණ ඇති කිරීම.

<u>සූරිය මල් ව්‍යාපාරය</u>

- ✓ සූරිය මල් ව්‍යාපාරය බිහිවීමට පදනම වැටුනේ බ්‍රිතාන්‍යයන් විසින් පොපි මල් ව්‍යාපාරය ආරම්භ කිරීම නිසාය.
- ✓ පළමු ලෝක යුද්ධයේ ප්‍රතිපල ලෙස අබාධිත සොල්දාදුවන්ට හා පවුල් වලට අධාර පිණිස පොපි මල් ව්‍යාපාරය ආරම්භ වී ඇත.
- ✓ යුද්ධ සාමදාන දිනය ලෙස නොවැම්බර් 11 වන දින නම් කළ අතර සෑම වසරකම එදිනට පොපි මල් විකිණීම හා උත්සව පැවැත්වීම සිදුවිය.

- ✓ 1926 දී ලංකාවේ සේවා මුක්ත භට සංගමය විසින් පොපි මල් විකිණීම සිදු කළ දින සූරිය මල් විකිණීමේ ව්‍යාපාරයක්ද මෙරට ආරම්භ කෙරුණි.
- ✓ වාමාංශික නායකයන් සූරිය මල් ව්‍යාපාරයට එකතු වී එකතු කළ මුදල් දුප්පත් ජනතාවගේ ශුභ සිද්ධියට හා මැලේරියා රෝගය මර්දනය කිරීමට වැය කළේය.
- ✓ පොපි මල් වහල් බවේ සංකේතය බවත් සූරිය මල් නිදහසේ සංකේතය බවත් ප්‍රචාරය කරමින් බ්‍රිතාන්‍ය ප්‍රතිපත්තිය විවේචනය කරමින් නිදහස සඳහා ගෙන ගිය උද්ඝෝෂණ ව්‍යාපාරයක් බවට පත්විය.

<u>අමාත්‍ය මණ්ඩලය හා ජාතික සංගමය</u>

- ✓ 1939 දී දෙවන ලෝක යුද්ධය ආරම්භ වීමත් සමග බ්‍රිතාන්‍යයන්ට ලංකාවේ ඇමති මණ්ඩලයේ සහය අවශ්‍ය විය.
- ✓ ඇමති මණ්ඩලය සහය දුන් නමුත් යුද්ධයෙන් පසුව ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණයක් ඉල්ලා සිටියේය.
- ✓ යුද්ධය පැවති දුස්කර අවස්ථාවේදී ඇමති මණ්ඩය ලබා දුන් සහයෝගය පිළිබඳ පැහැදුණු මෙරට බ්‍රිතාන්‍ය ආණ්ඩුකාරවරයා ඇතුළු නිලධාරීන් නව ආන්ඩුක්‍රමයක් ලබාදෙන ලෙස බ්‍රිතාන්‍යට දැන්වූහ.
- ✓ 1944 දී ඇමති මණ්ඩලය සැකසූ කෙටුම්පතට අනුව සැකසුණු අභ්‍යන්තර කටයුතු පිළිබඳ සම්පූර්ණ බලය ලාංකිකයන්ට ලබා දුනනේය.
- ✓ ලංකා ජාතික සංගමයද 1942 සිට රටට නිදහස ලබා ගැනීම ප්‍රධාන අරමුණ කරගෙන උද්ඝෝෂණ වල නිරත විය.
- ✓ මේ සියල්ලෙහිම ප්‍රතිපලයක් ලෙස 1944 වර්ෂයේදී සෝල්බරි කොමිසම මෙරටට එවනු ලැබීය.
- ✓ 1945 දී සෝල්බරි කොමිසමේ වාර්තාව ප්‍රකාශයට පත් වූ අතර එය පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමයක් විය.
- ✓ සෝල්බරි කොමිසමේ යෝජනාව අමාත්‍ය මණ්ඩලය සැකසූ කෙටුම්පතට සමාන විය.
- ✓ 1945 නොවැම්බර් මාසයේදී රාජ්‍ය මන්ත්‍රණ සභාව විසින් වැඩි ඡන්දයෙන් සෝල්බරි ආණ්ඩුක්‍රමය අනුමත කරන ලදී.
- ✓ 1946 මැයි මාසයේදී සෝල්බරි ආණ්ඩුක්‍රමය පිළිබඳ රාජ ආඥාව බ්‍රිතාන්‍ය විසින් නිකුත් කරන ලදී.

# 05. බ්‍රිතාන්‍යයන් යටතේ ශ්‍රී ලංකාවේ සමාජ පරිවර්තනය.

| බ්‍රිතාන්‍යයන් ශ්‍රී ලංකාව යටත්කර ගැනීමට පෙර මෙරට ආර්ථිකයේ ප්‍රධාන ලක්ෂණ | බ්‍රිතාන්‍යයන් ශ්‍රී ලංකාව යටත්කර ගැනීමෙන් පසුව මෙරට ආර්ථිකයේ සිදු වූ වෙනස්කම් |
|---|---|
| ආර්ථිකය තුළ රජය මුල්තැන ගන්නා ලදි.<br>( රජයේ ඒකාධිකාරය දක්නට ලැබුණි ) | ආර්ථිකය තුළ පෞද්ගලික අංශයේ ව්‍යවසාය දියුණු කිරීමට කටයුතු කරන ලදි. ( කෝල්බෲක් කොමිසමේ යොජනාවකි ) |
| යැපුම් කෘෂිකර්මාන්තය ප්‍රධාන ජීවනෝපාය විය.<br>❑ ගම මුල්කරගත් ස්වයංපෝෂිත ආර්ථික ක්‍රමය<br>❑ අන්‍යෝන්‍ය සහජීවනය හා සහයෝගය<br>❑ අත්තම් ක්‍රමය මගින් කෘෂිකර්මාන්තය සඳහා ශ්‍රමය සැපයුණි.<br>❑ මුදල් භාවිතය අවම විය | අපනයනය මුල්කරගත් කෘෂිකර්මාන්තය දියුණු කරන ලදි.<br>❑ වතු වගාව මූලික වගාව බවට පත්විය<br>❑ ස්වයංපෝෂිත ආර්ථිකයේ බිඳවැටීම<br>❑ මුදල් ගෙවා ශ්‍රමය ලබා ගැනීමට ජනතාව හුරු කර වීම.<br>❑ සමාජය තුළ මුදල් භාවිතය ඉහළ යාම<br>❑ අත්තම් ක්‍රමය බිඳ වැටීම<br>( කෝල්බෲක් නිර්දේශයන්ට අනුව මෙවා සිදුවිය ) |
| සාම්ප්‍රදායික ඉඩම් භුක්ති ක්‍රමය ක්‍රියාත්මක විය.<br>❑ ඉඩම් රජය සතු විය.<br>❑ රජුට සපයන සේවාවට හා භුක්තිය සඳහා ඉඩම් ප්‍රදානය කර තිබුණි.<br>❑ ඉඩම් මත පදනම්ව ඉඩම් රාජකාරී ක්‍රමය ක්‍රියාත්මක විය.<br>❑ රාජකාරී ක්‍රමය ක්‍රියාත්මක විය.<br>( මුදල් ගෙවීමකින් තොරව රජය ජනතාවගේ ශ්‍රමය ලබා ගැනීම සිදුවිය )<br>❑ ගම් සභාව ක්‍රියාත්මක වීම. | ස්වදේශිකයන්ට හා විදේශිකයන්ට තමන් කැමති ප්‍රමාණයක් ඉඩම් මිලට ගැනීමේ හැකියාව සලසා දුනි.<br>❑ සාම්ප්‍රදායික ඉඩම් භුක්ති ක්‍රමය පෞද්ගලික අංශයේ ව්‍යවසායට බාධාවක් බව කෝල්බෲක් නිර්දේශය විය.<br>❑ අනිවාර්ය සේවා රාජකාරී ක්‍රමය නිදහසට බාධාවක් ලෙස අර්ථකථනය විය. එම නිසා එය අහෝසි විය.<br>❑ ශ්‍රමයට මිලක් නියම විය.<br>❑ මුඩු බිම් පනත ගෙන ඒම. |
| කුරුඳු සහ ලුණු ඒකාධිකාරය රජය සතු විය. | කුරුඳු සහ ලුණු ඒකාධිකාරය අවසන් කොට පෞද්ගලික අංශයට එම ක්ෂේත්‍ර වල ව්‍යාපාරික අවස්ථා ලබා දීම.<br>❑ කුරුඳු සහ ලුණු සඳහා රජයේ ඒකාධිකාරය පෞද්ගලික ව්‍යවසායට බාධාවක් බව කෝල්බෲක් කොමිසමේ අදහස විය<br>.(කෝලබෲක් කොමිසමේ යෝජනාවන්ට අනුව සිදුවිය) |
| ඍජු බදු ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක විය.<br>උදා :- අල්ලන ලද මැටි වලින් බදු අයකරන ලදි.<br>❑ ඉඩම්වල නිෂ්පාදිත ද්‍රව්‍ය වලින් බදු අයකරන ලදි. | වක්‍ර බදු ප්‍රතිපත්තියක් හඳුන්වාදෙන ලදි.<br>උදා :- මාළු අල්ලන බෝට්ටු සඳහා බලපත්‍ර නිකුත් කිරීම හරහා බදු අයකරන ලදි.<br>❑ සියලු ඉඩම්වලින් සමාන බද්දක් මුදලින් අයකරන ලදි.<br>(කෝලබෲක් කොමිසමේ යෝජනාවන්ට අනුව සිදුවිය) |
| | සාම්ප්‍රදායික ධනෝපායන මාර්ග වෙනුවට නව ධනෝපායන මාර්ග බිහිවිය.<br>උදා :- අරක්කු බෙදා හැරීම (අරක්කු රේන්දය) , මිනිරන් කර්මාන්තය , තොග හා සිල්ලර වෙළඳාම |
| | ඉතිරි කිරීමේ බැංකු ආරම්භ විය.<br>(කෝලබෲක් කොමිසමේ යෝජනාවකි) |

## වතු වගාව

වතු වගාව දියුණුව සඳහා ඉංග්‍රීසින් අනුගමනය කළ ක්‍රියාමාර්ග.

❑ 1833 කෝල්බෲක් කොමිසමේ නිර්දේශ ප්‍රධාන වශයෙන් හේතු විය.

උදා :- 1. පෞද්ගලික අංශයේ ව්‍යවසාය දියුණු කිරීම සඳහා ස්වදේශිකයන්ට හා විදේශිකයන්ට කැමති ප්‍රමාණයක් ඉඩම් මිලට ගැනීමේ හැකියාව ලබා දීම.
2. අනිවාර්ය සේවා රාජකාරී ක්‍රමය අහෝසි කිරීම.
3. වෙළඳ ඒකාධිකාරය අහෝසි කිරීම.
4. සිවිල් සේවකයන්ට වතු ආරම්භ කිරීමට හැකිවීම.

<u>බ්‍රිතාන්‍යයන් හඳුන්වාදුන් වතුභෝග (වානිජ භෝග)</u>


- තේ
- කොකෝවා
- සිංකෝනා
- රබර්


**<u>කෝපි වගාව</u>**


- ලන්දේසීන් විසින් හඳුන්වාදෙන ලදි.
- ඉංග්‍රීසින් පැමිණෙන විට කෝපි වගාව ගෙවතු වගාවක් ලෙස පැවතුණි.
- කෝපි වගාව දියුණු වුයේ <u>ඉංග්‍රීසි පාලන</u> අවධියේය.
- 1804 ෆෙඩ්රික් නෝර්ත් ආණ්ඩුකාරවරයා කෝපි මෝලක් ආරම්භ කිරීම


- කෝල්බෲක් නිර්දේශ ඒ සඳහා මූලික ලෙස බලපාන ලදි.
  - අනිවාර්ය සේවා රාජකාරී අවලංගු කිරීම.
  - පෞද්ගලික ව්‍යවසායන් දිරිගැන්වීම නිසා කෝපි වගාවට වැඩි වැඩියෙන් මුදල් ආයෝජනය කිරීම.

- එඩ්වඩ් බාන්ස් ආණුඩුකාරවරයා කෝපි අපනයන බදු අයින් කිරීම.
- ඉන්දියානු වතු කම්කරුවන් ගෙන ඒම.
- යුරෝපා වෙළඳපොළේ කෝපි ඉල්ලුම ඉහළ යාම.





සිංකෝනා වගාව
වගා කිරීම උස් බිම් වල පමණි
ක්විනික් නැමැති ඖෂධය නිපදවීමට යොදා ගන්නා ලදි. මැලේරියා මර්ධන ඖෂධයකි
කෝපි වගාවට විකල්පයක් ලෙස සාර්ථක නොවීය
එබැවින් ඉල්ලුම සීමා විය



කොකෝවා වගාව
එම නිසා අමතර වියදමක් දැරීමට සිදු විය
වගාව සඳහා සෙවන අවශ්‍ය විය
මාතලේ දිස්ත්‍රික්කය තුළ පමණක් වගාවට සුදුසු විය
කෝපි වලට විකල්පයක් ලෙස සාර්ථක නොවීය
වගාව සාර්ථකව පැවති අවධියේ පවා එය අක්කර 12000 කට වඩා නොවීය


තේ වගාව
1875 අක්කර 500 ක පමණ තේ වගාව ව්‍යාප්ත විය
1894 තේ වගාව අක්කර ලක්ෂ 4 ක ව්‍යාප්ත වී තිබුණි
ජේම්ස් ටේලර් ලූල්කඳුර වත්තේ අක්කර කිහිපයක තේ වගාව අත්හදා බලන ලදි
වියළි කලාපය හැර අඩි 6000 ට වැඩි උස ඕනෑම ප්‍රදේශයක තේ වගාවකළ හැකි විය
තේ මෙරට ප්‍රධාන අපනයන භෝගය විය
1930 වන විට තේ වගාබිම් විශාල විය එය විශාල වතු 1200 ක් පමණ විය

**තේ වගාවේ උන්නතියට බලපෑ හේතු**

- වියළි කලාපය හැර සෙසු ප්‍රදේශ වල තේ වගාව උචිත වීම.
- ලංකාවේ තේ සඳහා ලෝක වෙළඳ පොලේ හොඳ ඉල්ලුමක් පැවතීම.
- ප්‍රවාහන පහසුකම් වල දියුණුව.
- දකුණු ඉන්දියානු කම්කරුවන් ගෙන ඒම නිසා ලාභදායී ශ්‍රමය මිලට ගැනීමට හැකිවීම.
- නවීන කර්මාන්තශාලා සහ යන්ත්‍ර සූත්‍ර භාවිතය.



**ඉංග්‍රීසින් මෙරටට පැමිණීමට පෙර මෙරට සමාජ තත්තවය**

- පැරණි ප්‍රභූ පන්තිය අභාවයට ගොස් නව මධ්‍යම පන්තියක් බිහිවීම.

ප්‍රභූ පන්තිය :- ආර්ථික තත්ත්වය , සමාජ තත්වය , දේශපාලන බලය අතින් සෙසු ජනතාවට වඩා විශේෂ පිරිසකි. ඔවුන් රදලයන් ලෙස ද හදුන්වන ලදි.

- ඉඩම් හිමිකම් පැවතුණි.
- ඉහළ ආදායමක් ලැබුණි.
- රජයේ නිලතල හිමිය.
- සෙසු ජනතාවගේ ගෞරවය හිමිය.

} ප්‍රභූ පන්තිය

**ඉංග්‍රීසින් මෙරටට පැමිණීමෙන් පසු සමාජ තුළ සිදු වූ කැපී පෙනෙන වෙනස්වීම්.**

මධ්‍යම පන්තිය :- බ්‍රිතාන්‍ය පාලන කාලයේදී විවෘත වූ අළුත් ධනෝපායන මාර්ග වලින් මුදල් උපයාගත් පවුල් වල දරුවන් ඉංග්‍රිසි අධ්‍යාපනය ලැබූ රජයේ ඉහළ නිලතල ලැබූ උගතුන් පිරිසකි.

- මධ්‍යම පන්තියේ වර්ධනයත් සමග පැරණි ප්‍රභූ පන්තිය අභාවයට යන ලදි.

- කම්කරු පන්තියක් සමාජය තුළ නිර්මාණය වීම.
  - මුදලට සේවය සපයන ජනතාවක් බිහිවීම.
  - ඉතා අවම වැටුපකට ඉන්දියාවෙන් කම්කරුවන් ගෙන ඒම.
  - අඩු වැටුප් හිමිවිය.
  - වැඩකරන පැය ගණන නිශ්චිත නොවීම.
  - කම්කරු සුබ සාධන කටයුතු නොතිබිණි.

- වෘත්තිය සංගම් බිහිවීම
  - අයිතිවාසිකම් දිනාගැනීම අරමුණු විය
  - වැඩවර්ජන ඇතිවිය
    උදා :- මුද්‍රණ කම්කරු වැඩ වර්ජනය
    රෙදි සෝදන්නන්ගේ වැඩ වර්ජනය
    කරත්ත කරුවන්ගේ වැඩ වර්ජනය
  - 1922 දි ඒ. ඊ. ගුණසිංහ මහතා විසින් ලංකා කම්කරු සංගමය පිහිටුවීම
  - ලංකා සමසමාජ පක්ෂයේ නායකයින් කම්කරු අයිතීන් ලබා ගැනීමට කටයුතු කිරීම.
  - නඩේස අයියර් විසින් වතු කම්කරුවන්ට නායකත්වය ලබා දි ඇත.

- බටහිර සංස්කෘතිය මෙරට තුළ ව්‍යාප්ත වීම.
  - ඉංග්‍රිසි භාෂා අධ්‍යාපනය
  - මිෂනාරී පාසල් රජයේ පාසල්වල යුරෝපියන් ඉගැන්වීම් සිදු කිරීම.
  - අධ්‍යාපනය සඳහා ස්වදේශිකයන් විදෙස්ගත වීම.
  - යුරෝපියයන් සඳහා සමාජශාලා , නිවාඩු නිකේතන ආදිය බිහිවීම.

  යන දේ නිසා,

  - බටහිර ඇඳුම් පැළඳුම්
  - බටහිර සිරිත් විරිත්
  - ආචාර සමාචාර විධි
  - බටහිර ගෘහ නිර්මාණ ශිල්පය
  - බටහිර ආහාරපාන මෙරට සංස්කෘතියට මුසු විය

<u>**බ්‍රිතාන්‍ය පාලනය නිසා අපට උරුම වූ ප්‍රයෝජනවත් අංග**</u>

- බ්‍රිතානයයන් තම වාසියට ප්‍රතිසංස්කරණ සිදුකරත් ඇතැම් ඒවා මෙරටට දීර්ඝ කාලීනව ප්‍රයෝජනවත් විය
- ජාත්‍යන්තර භාෂාවක් වන ඉංග්‍රීසි භාෂා දැනුම රටතුළ පැතිරීම.
- ගමනාගමනය හා සන්නිවේදන කටයුතු වල දියුණුව.
- අපනයන වැවිලි භෝග හඳුන්වාදීම.
- කාර්මික විප්ලවයේ බලපෑම.
- පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමය

<u>**බ්‍රිතාන්‍ය පාලනය නිසා අපට උරුම වූ අයහපත් අංග**</u>

- බටහිර සංස්කෘතික අංග රටතුළ පැතිරීම නිසා සාම්ප්‍රදායික ලක්ෂණ පිරිහීම.
- මධ්‍යසාර භාවිතය රටපුරා ව්‍යාප්තවීම.
- ඉඩම් අහිමි ජනතාවක් බිහිවීම.
- සාම්ප්‍රධායික ස්වයංපෝෂිත ආර්ථික රටාව බිඳ වැටීම.
- ගම්සභා වැනි ප්‍රයෝජනවත් ආයතන බිඳ වැටීම.

## <u>පැවරුම.</u>

01. යුරෝපා ජාතීන් ලංකාවට පැමිණීමත් සමග ශ්‍රී ලංකාවේ ඇති වූ වෙනස්කම් 3 ක් සඳහන් කර ඒවා පැහැදිලි කරන්න.

02. බ්‍රිතාන්‍ය පාලනය නිසා අපට උරුම වූ ප්‍රයෝජනවත් අංග හා අයහපත් අංග 4 බැගින් ලියන්න.

03. යුරෝපා ජාතීන් ලංකාවට පැමිණීමත් සමග ශ්‍රී ලංකාවේ සමාජය තුළ සිදුවූ වෙනස්කම් 3 ක් ලියන්න.

04. බ්‍රිතාන්‍යයන් විසින් හඳුන්වාදුන් වතුභෝග මොනවාද ?

# 06. ශ්‍රී ලංකාවට නිදහස ලැබීම.

මෙරටට නිදහස ලැබීමේ පසුබිම.

- දෙවන ලෝක යුද්ධයෙන් පසු ඉන්දියාව ඇතුලු ආසියාතික යටත් විජිත වලට නිදහස ලබා දෙන බව ප්‍රකාශ කිරීම.
- 1944 දෙසැම්බර් මස සෝල්බරි කොමිසම ලංකාවට පැමිණ නිර්දේශ වාර්තාවක් ලබා දුන්නේය.
- ශ්‍රී ලාංකිකයන්ට පූර්ණ බලතල හිමිවන පාර්ලිමේන්තු ආණ්ඩු ක්‍රමයක් නිර්දේශ කර තිබිණ.
- මෙම ආණ්ඩුක්‍රමය යටතේ ප්‍රථම පාර්ලිමේන්තු මැතිවරණය 1947 දි පවත්වන ලදි.
- එක්සත් ජාතික පක්ෂය ආණ්ඩුවක් පිහිටුවා ප්‍රථම අගමැති ලෙස ඩී. එස්. සේනානායක පත්විය.
- සේනානායක මහතා බ්‍රිතාන්‍ය සමග ආරක්ෂක හා බාහිර කටයුතු ගිවිසුම් අත්සන් කිරීම.
- 1947 දෙසැම්බර් 19 දින ලංකා ස්වාධීන රාජ්‍ය භාෂාව නිකුත් කිරීම.
- 1948 පෙබරවාරි 4 දින ශ්‍රී ලංකාවට නිදහස ලබාගත් දිනය ලෙස නම් කිරීම.

**<u>සෝල්බරි ආණ්ඩුක්‍රමය ( 1947 වර්ෂය )</u>**

- 1947 වර්ෂයේ සිට 1972 ( ජනරජ ආණ්ඩුක්‍රමය ) දක්වා ක්‍රියාත්මක විය.
- සොල්බරි ආණ්ඩුක්‍රමය යටතේ රජයේ කටයුතු ගෙනයාම සඳහා පැවති ආයතන 04 කි.

1. අග්‍රාණ්ඩුකාරවරයා.
2. අගමැති ප්‍රමුඛ කැබිනට් මන්ඩලය.
3. පාර්ලිමේන්තුව.
4. අධිකරණය.

**<u>අග්‍රාණ්ඩුකාරවරයා.</u>**

- ආණ්ඩුකාර තනතුර අහෝසි කොට අග්‍රාණ්ඩුකාර ධුරයක් ඇති කිරීම. එංගලන්ත කිරිටය නියෝජනය කිරීම සඳහා මෙම තනතුර ඇතිකරන ලදි.
- රැජිනගේ නියෝජිතයා මොහුය.
- නාම මාත්‍රික විධායක තනතුරක් වූ අතර ඔහු සිය කටයුතු මෙහෙයවීමේ දි හැම විටම අගමැතිගේ උපදෙස් පිළිපැදිය යුතු විය.

## <u>පාර්ලිමේන්තුව.</u>

මණ්ඩල දෙකකින් යුක්ත පාර්ලිමේන්තුවක්

සාමාජිකයන් 131

- මහජන මන්ත්‍රී මණ්ඩලය (නියෝජිත මන්ත්‍රී මණ්ඩලය) 101 නිල කාලය අවුරුදු 05
  - ජන්ද කොට්ඨාස පදනම මත මහජන ජන්දයෙන් 95
  - සුළු ජාතීන් වෙනුවෙන් අගමැති උපදෙස් මත අග්‍රාණ්ඩුකාරවරයා පත්කළ 06
- සෙනට් සභාව (උත්තරීතර මන්ත්‍රී මණ්ඩලය) 31
  - නියෝජිත මන්ත්‍රී මණ්ඩලය පත්කළ 15
  - අගමැති උපදෙස් මත අග්‍රාණ්ඩුකාර වරයා විසින් 15

### අගමැති ප්‍රමුඛ කැබිනට් මණ්ඩලය

- කැබිනට් මණ්ඩලයේ ප්‍රධානියා අගමැති වේ.
- නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ මන්ත්‍රීන්ගේ බහුතර සහයෝගය ලැබෙන තැනැත්තා අග්‍රාණ්ඩුකාරවරයා විසින් අගමැති ලෙස පත්කරනු ලැබේ.
- ආණ්ඩුක්‍රමයට අනුව විධායක කටයුතු කැබිනට් මණ්ඩලය සතු වේ.
- ආරක්ෂක හා විදේශ කටයුතු අගමැතිවරයා යටතේ පැවරිය යුතු වේ.
- ඇමති මණ්ඩලය පත්කිරීම අගමැති උපදෙස් මත අග්‍රාණ්ඩුකාරවරයා විසින් සිදුකරන ලදි.
- අධිකරණ ඇමති තනතුර හා තවත් එක් ඇමති තනතුරක් වත් සෙනට් සභා සාමාජිකයන්ට ලබාදිය යුතු වේ.
- එංගලන්ත පාර්ලිමේන්තු සම්ප්‍රදායට අනුව කැබිනට් මණ්ඩලය සාමූහිකව පාර්ලිමේන්තුවට වගකීමට බැඳී සිටී.

### <u>අධිකරණ කටයුතු</u>

සොල්බරි ආණ්ඩුක්‍රමයට අනුව :-

- ශ්‍රේෂ්ඨාධිකරණය ඇතුළු අධිකරණ පද්ධතියක් මගින් අධිකරණ කටයුතු මෙහෙයවන ලදි.
- අග්‍රාණ්ඩුකාරවරයා විසින් අග්‍රවිනිශ්චයකාරවරයා ඇතුළු ශ්‍රේෂ්ඨාධිකරණ විනිශ්චයකරුවන් පත්කරන ලදි.

### <u>ශ්‍රී ලංකාවේ දේශපාලන පක්ෂ</u>

- පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදයේ දැකිය හැකි මූලික ලක්ෂණයකි. දේශපාන පක්ෂවල පැවැත්ම
- ලෝකයේ රටවල දේශපාලන පක්ෂවල ස්වරූපය අනුව කොටස් 02 කි.

දේශපාලන පක්ෂ

| ද්විපක්ෂ ක්‍රමය | බහු පක්ෂ ක්‍රමය | ඒක පක්ෂ ක්‍රමය |
|---|---|---|
| දේශපාන පක්ෂ දෙකක් පමණක් පැවතිම | දේශපාලන පක්ෂ රාශියක් පැවතිම | |
| උදා :- ප්‍රංශය , ජර්මනිය , වැනි යුරෝපා ංගලන්තය, ඇමරිකාව | උදා :- ශ්‍රී ලංකාව ඇතුළු ආසියාතික රටවල් රටවල් | චීනය කියුබාව |

- ශ්‍රී ලංකාවේ දේශපාලන පක්ෂ පිහිටුවීමේ ආරම්භය බ්‍රිතාන්‍ය පාලන සමයේදී සිදුවිය.
- මුල් වරට පක්ෂ ක්‍රමය භාවිතා කළ මැතිවරණයක් පැවැත්වුයේ 1947 පාර්ලිමේන්තු මැතිවරණයේදීය.
- එම මැතිවරණය වන විට ලංකා සමසමාජ පක්ෂය, එක්සත් ජාතික පක්ෂය, ලංකා කොමියුනිට්ස් පක්ෂය, ද්‍රවිඩ සංගමය වැනි පක්ෂ රැසක් පැවතුණි.

<u>ලංකා සමසමාජ පක්ෂය.</u>

- 1935 වර්ෂයේදී පිහිටුවන ලදි.
- ආචාර්ය එන්. එම්. පෙරේරා, ආචාර්ය කොල්වින් ආර් ද සිල්වා , පිලිප් ගුණවර්ධන වැනි පිටරට අධ්‍යාපනය ලැබූ දේශිය උගතුන් මෙහි නායකත්වය ගන්නා ලදි.
- වාමාංශික මතවාද අනුව ශ්‍රී ලංකාව තුළ සමාජවාදි සමාජයක් නිර්මාණය කිරිම සඳහා අවශ්‍ය දේශපාලන කටයුතු මෙහෙයවීම මෙම පක්ෂයේ අරමුණු විය.

<u>එක්සත් ජාතික පක්ෂය</u>

- 1946 දි ආරම්භ කරන ලද පක්ෂයකි.
- ඩී. එස්. සේනානායක මහතා නායකත්වය දෙන ලදි.
- මෙම පක්සයේ නායකයන් මධ්‍යස්ථ දේශපාලන මතවාදයක් දරන ලදි.
- 1947 මැතිවරණයේදි අපේක්ෂකයන් 95 දෙනෙකු ඉදිරිපත් වී ආසන 42 ක් ජයගන්නා ලදි.
- 1952 මැතිවරණයේදි ආසන 54 ක් ලබාගන්නා ලදි.

ශ්‍රී ලංකා නිදහස් පක්ෂය.

- 1951 දී පිහිටුවන ලදි.
- එස්. ඩබ්. ආර්. ඩී. බණ්ඩාරනායක මහතා (එක්සත් ජාතික පක්ෂයෙන් ඉවත් වී) ශ්‍රී ලංකා නිදහස් පක්ෂය පිහිටුවාගන්නා ලදි.
- මෙම පක්ෂය එක්සත් ජාතික පක්ෂයට වඩා සාමාන්‍යය ජනතාවගේ අවශ්‍යතා ගැන සැලකිල්ලක් දක්වන ලදි.
- ස්වභාෂා උගතුන් , භික්ෂුන් වහන්සේලා , දේශියත්වය අගය කළ පිරිස්වල සහය ලැබුණි.
- 1952 දී මැතිවරණයෙන් ආසන 09 ක් දිනාගන්නා ලදි.
- 1956 මැතිවරණයේදී දේශපාලන පක්ෂ රැසක් සමග ඒකාබද්ධව මහජන එක්සත් පෙරමුණ නමින් ආසන 51 ක් දිනාගන්නා ලදි.

වෙනත් දේශපාලන පක්ෂ

- ඒ. ඊ. ගුණසිංහ මහතාගේ - කම්කරු පක්ෂය
- ජී. ජී. පොන්නම්බලම් මහතාගේ- ද්‍රවිඩ ජාතික පක්ෂය
- එස් . ජේ. වී. චෙල්වනායගම් මහතාගේ- ෆෙඩරල් පක්ෂය
- ශ්‍රී ලංකාවේ ප්‍රධාන දේශපාලන පක්ෂ දෙකට අමතරව තවත් කුඩා පක්ෂ රැසක් පැවතීම නිසා මැතිවරණයකදී එක් පක්ෂයකටවත් බහුතරය ලබා ගැනීමට නොහැකි වේ.
- එම නිසා පක්ෂ කිහිපයක් එකතුවී සභාග ආණ්ඩු පිහිටුවීම ප්‍රධාන ලක්ෂණයකි.

**1956 මැතිවරණය හා සමාජ පෙරළිය.**

- නිදහසින් පසුව 1956 දක්වා බලයේ සිටියේ එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුවකි.
- 1956 දී එස්. ඩබ්. ආර්. ඩී. බණ්ඩාරනායක මහතා යටතේ අලුත් ආණ්ඩුවක් බලයට පත්විය.

**1956 මැතිවරණය සමාජ පෙරළියක් ඇති කිරීම සඳහා මුල් වූ බවට උදාහරණ.**

- නව බලවේග රැසක් බණ්ඩාරනායක මහතා වටා එක්රොක් වීම. (ස්වභාෂා උගතුන් , භික්ෂුන් වහන්සේලා , දේශියත්වය අගය කළ පිරිස්)
- දේශියත්වය , දේශිය ආගම් හා සංස්කෘතිය අගය කළ ප්‍රතිපත්තියක් අනුගමනය කිරීම.
- සාමාන්‍ය ජනතාවගේ අවශ්‍යතා පිළිබඳව වැඩි සැලකිල්ලක් දැක්වීම.
- එහෙත් නොවිසිදුණු ආර්ථික ගැටලු රැසක්ම විසඳුම් දීමට ප්‍රයත්න දැරීම.
- මැතිවරණ වේදිකාවේ ප්‍රධාන මාතෘකාව වුයේ සිංහල භාෂාව රාජ්‍ය භාෂාව කිරීමේ ප්‍රතිපත්තියයි.
- සඟ , වෙද , ගුරු , ගොවි , කම්කරු යන පංච මහා බලවේග වල සහාය මහජන එක්සත් පෙරමුණ වටා රොක් වීම.

එස්. ඩබ්. ආර්. ඩී. බණ්ඩාරනායක මහතා අගමැති තනතුරට පත් වූ කාලයේ ඔහු ගෙනිගිය ප්‍රතිපත්ති හා හඳුන්වාදුන් ප්‍රතිසංස්කරණ.

- සිංහල භාෂාව රාජ්‍ය භාෂාව කිරීම.
- බ්‍රිතාන්‍යයන් සමග 1947 අත්සන් කරන ලද ආරක්ෂක හා බාහිර කටයුතු පිළිබඳ ගිවිසුම අවලංගු කිරීම.
- ලෝකයේ බල කඳවුරු වලට නොබැඳුණු මධ්‍යස්ථ පතිපත්තියක් අනුගමනය කිරීම.
- වරාය හා බස් ජනසතු කිරීම. ප්‍රමුඛ ජනසතු ව්‍යාපාර.
- දේශිය කර්මාන්ත හා කෘෂිකර්මාන්තය දියුණු කිරීමට කටයුතු කිරීම.
- විද්‍යෝදය හා විද්‍යාලංකාර පිරිවෙන් විශ්වවිද්‍යාල බවට පත්කිරීම.

## 1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව

1972 ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ මූලික ලක්ෂණ

- එතෙක් ලංකාව යනුවෙනන් හැඳින් වූ මෙරට ශ්‍රී ලංකාව යන නාමයෙන් හැඳින්වීම.
- බ්‍රිතාන්‍ය අධිරාජ්‍ය සමග පැවති ව්‍යවස්ථානුකුල බැඳීම් අවසන් කිරීම.
- ශ්‍රී ලංකාව ඒකීය ජනරජයක් බව පිළිගැනීම.
- ජනතාවගේ මූලික අයිතිවාසිකම් සුරක්ෂිත කිරීම.
- ඒක මාණ්ඩලික ව්‍යවස්තාදායකයක් ඇති කිරීම. අග්‍රාණ්ඩුකාර දූරය ඉවත් කර නාමික ජනාධිපති ධූරයක් ඇති කිරීම.

<u>මූලික අයිතිවාසිකම්</u>

1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 18 වන වගන්තියේ මූලික මිනිස් අයිතිවාසිකම් හා නන්වැදෑරුම් නිදහස ගැන සඳහන් වේ. ඉන් කිහිපයක් පහත පරිදි වේ.

- නීතිය පසිඳලීම , ක්‍රියාත්මක කිරීම හා නීතියේ රැකවරණය සර්ව සාධාරණ විය යුතුය.
- නීතියට අනුකූලව මිස පුද්ගලයකුගේ ප්‍රාණයට නිදහසට හෝ සුරක්ෂිතතාවයට හානි සිදු නොකළ යුතුය.
- සෑම පුරවැසියෙකුටම සිතීමේ නිදහස, හෘදසාක්ෂියේ නිදහසට හා ආගමික නිදහසට අයිතිය තිබේ.
- පුරවැසියන්ට සාමකාමීව රැස්වීමට හා අදහස් ප්‍රකාශ කිරීමට නිදහස තිබේ.
- අයිතිවාසිකම් විස්තරාත්මකව දක්වා නොතිබීම දුර්වලතාවයකි.

<u>ජනාධිපති තනතුර</u>

- සෝල්බරි ව්‍යවස්ථාවේ අග්‍රාණ්ඩුකාර තනතුර වෙනුවට මෙම ආණ්ඩුක්‍රම ව්‍යස්ථාවේ නාමික ජනාධිපති තනතුර ඇති විය.
- ජනාධිපතිවරයා පත් කිරීම අගමැතිවරයා විසින් සිදුකරණ ලදි.
- ප්‍රථම නාමික ජනාධිපති ධූරයට පත්වූයේ විලියම් ගොපල්ලව මහතාය.

<u>ජාතික රාජ්‍ය සභාව</u>

- පාර්ලිමේන්තුව (ව්‍යවස්ථාදායක සභාව) වෙනුවට නව ව්‍යවස්ථාවෙන් ජාතික රාජ්‍ය සභාව අතිකරන ලදි.
- මහජන නියෝජිතයන්ගෙන් සමන්විත විය.
- ජනතාව සතු ව්‍යවස්ථාදායක බලය මෙම සභාව මගින් ක්‍රියාත්මක විය.
- නීති සම්පාදනයේ පූර්ණ බලය මෙය සතු විය.
- නිල කාලය අවුරුදු 06 කි.

<u>අගමැති හා අමාත්‍ය මණ්ඩලය.</u>

- විධායක බලය ක්‍රියාත්මක කරන ලදි.
- අමාත්‍ය මණ්ඩලයේ ප්‍රධානියා අගමැතිවරයායා.
- ජනාධිපතිවරයා විසින් අගමැතිවරයා පත්කරන ලදි.
- අගමැතිගේ උපදෙස් පරිදි ජනාධිපති විසින් සෙසු ඇමතිවරුන් පත්කරන ලදි.

**<u>අධිකරණය.</u>**

<u>1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ අධිකරණ පද්ධතිය</u>

- බ්‍රිතාන්‍ය සතුව තිබූ අවසාන අභියාචනාධිකරණ බලය අහෝසි කිරීම.
- ශ්‍රේෂ්ඩාධිකරණය - } අධිකරණ පද්ධතියේ ප්‍රධාන අංග 02
- මහාධිකරණය-
- දිසා අධිකරණය- සිවිල් නඩු විනිශ්චය කරන ලදි
- මහේස්ත්‍රාත් අධිකරණය - අපරාධ නඩු විනිශ්චය කරන ලදි
- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා අධිකරණය- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව පිළිබඳ ගැටලු හා පාර්ලිමේන්තුව ඉදිරිපත් කරන ලද පනත් කෙටුම්පත් වල ව්‍යවස්ථානුකූලභාවය පරීක්ෂා කිරීම

# <u>1978 ආණුඩුක්‍රම ව්‍යවස්ථාව</u>

- ව්‍යවස්ථාවේ කැපී පෙනෙන අංග ( නවාංග )
  - විධායක ජනාධිපතිධූරය
  - අගමැති හා අමාත්‍ය මණ්ඩලය
  - පාර්ලිමේන්තුව
  - අධිකරණය
  - මූලික අයිතිවාසිකම්
  - ඔම්බුඩ්ස්මන් ධූරය / ජනාධිපතිවරණය / ජනමත විචාරණය

විධායක ජනාධිපතිධූරය (පූර්ණ විධායක බලතල සහිත වේ)

1978 ආණුඩුක්‍රම ව්‍යවස්ථාවේ 30 වගන්තියට අනුව ශ්‍රී ලංකා ජනරජයේ ජනාධිපතිවරයා

- රජයේ ප්‍රධානියාය
- විධායකයේ ප්‍රධානියාය
- ආණ්ඩුවේ ප්‍රධානියාය
- සන්නද්ධ සේවාවන්හි ප්‍රධානියාය

ජනාධිපතිවරණයේදී ඡන්ද විමසීමකින් ජනතා ඡන්දයෙන් ජනාධිපතිවරයා තෝරා පත්කරගන්නා ලදි.

ජනාධිපති බලතල

- ජනාධිපති පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරයකු නොවේ. නමුත් පාර්ලිමේන්තු බලතල රැසක් හිමිවී ඇත.
- පාර්ලිමේන්තුව කැඳවීම
- වාර අවසාන කිරීම
- මංගල පාර්ලිමේන්තුවේ මුලසුන දැරීම
- ආණුඩුවේ ප්‍රතිපත්ති ප්‍රකාශනය ඉදිරිපත් කිරීම.
- පාර්ලිමේන්තුව විසුරුවා හැරීම

ජනාධිපති සතු විධායක බලතල

- අගමැති පත්කිරීම
- ඇමතිවරුන් පත්කිරීම
- ඇමතිවරුන්ට විෂය හා කාර්යය පැවරීම
- අමාත්‍ය මණ්ඩලයේ ප්‍රධානියා ලෙස කටයුතු කිරීම.ඒ අනුව විධායකයේ නායකයා ජනාධිපතිය

ජනාධිපති සතු අධිකරණ බලතල

- අග්‍රවිනිශ්වයකාර වරයා පත්කිරීම.
- ශ්‍රේෂ්ඨාධිකරණය, අභියාචනාධිකරණය විනිශ්වයකරුවන් පත්කිරීම
- අධිකරණයෙන් වැරදිකරුවකු වූ අයට සමාවදීම, දඩුවම් ලිහිල් කිරීම

රාජ්‍ය නායකයා වශයෙන් ජනාධිපති සතු බලතල

- යුද්ධය හා සාමය ප්‍රකාශ කිරීම
- රාජ්‍ය උත්සව වල මුලසුන දැරීම
- ජාත්‍යන්තර වශයෙන් ජනරජය නියෝජනය කිරීම
- රාජ්‍ය මුද්‍රාව තමා භාරයේ තබා ගැනිම.
- තනාතිපතිවරුන් පත්කිරීම හා පිළිගැනීම.

ජනාධිපති සතු විශේෂ වරප්‍රසාද

- ජනාධිපතිවරයාට විරුද්ධව කවර හෝ කරුණක් සම්බන්ධයෙන් අධිකරණයේ නඩු පැවරිය නොහැකිය.

අගමැතිවරයා හා අමාත්‍ය මණ්ඩලය

- පාර්ලිමේන්තු මන්ත්‍රීන් අතරින් අමාත්‍ය මණ්ඩලය හා අගමැති පත්කරන්නේ ජනාධිපති විසිනි
- අමාත්‍ය මණ්ඩලය සාමූහිකව පාර්ලිමේන්තුවට වගකිව යුතුය.
- අමාත්‍ය මණ්ඩලයට පැවරුණු කාර්යයන්,
  - පාර්ලිමේන්තුව පනවන නීති ක්‍රියාත්මක කිරීම
  - ඒ ඒ අමාත්‍යංශවල අයවැය ඇස්තමේන්තු හා අතුරු අයවැය සැකසීම
  - අමාත්‍යවරුන්ට පැවරුණු ඒ ඒ විෂය භාරව කටයුතු කිරීම

# පාර්ලිමේන්තුව

මන්ත්‍රීන් 225

- සමානුපාතික නියෝජනය ක්‍රමය මගින් මහජන ඡන්දයෙන් 196
- ජාතික ලයිස්තුවෙන් ඒ ඒ පක්ෂ වල ඡන්ද අනුපාතය අනුව 29

<u>පාර්ලිමේන්තු බලතල</u>

- නීති පැනවීම
- මුදල් පරිපාලනය
- අයවැය සකස් කිරීම
- සංවර්ධන සැලසුම් සම්පාදනය
- මහජන ගැටලු සලකා බැලීම.

**<u>අධිකරණය</u>**

- ශ්‍රේෂ්ඨාධිකරණය
    - අවසාන අධිකරණ බලය හිමිය
    - ප්‍රධානියා අග්‍රවිනිශ්චයකාර වරයා වේ.
    - එහි සියළුම විනිශ්චයකාර වරුන් ජනාධපති විසින් පත්කරනු ලැබේ
    - මූලික අයිතිවාසිකම් පිළිබඳ නඩු විසඳීම
    - ජනාධිපතිට එරෙහි දෝෂාභියෝග විභාග කිරීම
    - පාර්ලිමේන්තු වරප්‍රසාද කඩ කිරීම සම්බන්ධ චෝදනා විමසීම
    - ඡන්ද පෙත්සම් පිළිබඳ අධිකරණ කටයුතු (ජනාධිපතිවරණය හා ජනමත විචාරණය)
    - ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අර්ථ නිරූපනය කිරීම.

    ශ්‍රේෂ්ඨාධිකරණය සතු කාර්යයන් කිහිපයකි.
- අභියාචනාධිකරණය
    - පහළ අධිකරණ වලින් ලබා දෙන තීන්දුවල අභියාචනා නඩු විමසීමේ බලය සතු වේ.
- මහාධිකරණය
- දිසා අධිකරණය
- පවුල් අධිකරණය
- මහේස්ත්‍රාත් අධිකරණය
- ප්‍රාථමික අධිකරණය

<u>මූලික අයිතිවාසිකම්</u>

- 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 3 වන පරිච්ඡේදයේ මූලික අයිතිවාසිකම් පිළිබඳ විස්තර වේ.
- 1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට වඩා මූලික අයිතාවාසිකම් පිළිබඳ 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ පුළුල්ව හා විස්තරාත්මකව විග්‍රහ කර ඇත.
- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් පිළිගෙන ඇති මූලික අයිතීන් අතර
    - නීතිය ඉදිරයේ සමානාත්මතාවය
    - කතා කිරීමේ හා අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස
    - වධහිංසා වලින් මිදීමේ නිදහස
    - කැමති ආගමක් විශ්වාසයක් දැරීමේ නිදහස
    - කැමති වෘත්තියක් රැකියාවක් කිරීමේ නිදහස

- 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 126 වගන්තියට අනුව,
    - මූලික අයිතිවාසිකම් හා නන් වැදෑරුම් නිදහස උල්ලංගනය වීම හෝ කඩවීමකදී ආසන්න වශයෙන් මාසයක් ඇතුළත ශ්‍රේෂ්ඨාධිකරණයට පෙත්සමක් ගොනු කළ හැකිය.
    - එය ශ්‍රේෂ්ඨාධිකරණය පරික්ෂා කරයි.
    - රජයේ නියුතු අය විසින් සිදුකරණ මූලික අයිතාවාසිකම් උල්ලංගනය වීමකදී පාර්ලිමේන්තුවේ කොමසාරිස් හෙවත් ඔම්බුඩ්ස්මන් වෙත පැමිණිළිකර සහන ලබාගත හැකිය.

## ජනාධිපතිවරණය

- ජනාධිපතිවරණයේදී ශ්‍රී ලංකාවම එකම ජන්ද කොට්ඨාසයක් බවට පත්වේ.
- ප්‍රකාශිත ජන්ද සංඛ්‍යාවෙන් නියත බහුතරය හෙවත් 50% ඉක්ම වූ ජන්ද ප්‍රමාණයක් ලබාගත් අපේක්ෂකයා ජයග්‍රාහකයා වේ.
- නිල කාලය :- අවුරුදු 06 ( ව්‍යවස්ථාවට අනුව වසර 6 ධූර කාලයෙන් අවුරුදු 4 ක් ඉක්මවූ පසු නැවත දෙවන වරටත් ඉල්ලා සිටිය හැක. )
- 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ප්‍රථම විධායක ජනාධිපති ජේ. ආර්. ජයවර්ධන මහතා වේ.

1978 සිට මේ දක්වා ජනාධිපතිවරු අනුපිළිවෙල

| | | | |
|---|---|---|---|
| ජේ. ආර්. ජයවර්ධන මහතා | වාර ගණන | 2 | (1978 ඩනාධිපතිවරණයෙන් නොව) |
| රණසිංහ ප්‍රේමදාස මහතා | වාර ගණන | 1 | |
| ඩී. බී. විජේතුංග මහතා | වාර ගණන | 1 | (අනුප්‍රාප්තික) |
| චන්ද්‍රිකා කුමාරතුංග මැතිණිය | වාර ගණන | 2 | |
| මහින්ද රාජපක්ෂ මහතා | වාර ගණන | 2 | |
| මෛත්‍රීපාල සිරිසේන මහතා | වාර ගණන | 1 | |
| ගෝඨාභය රාජපක්ෂ මහතා | වාර ගණන | 1 | |

### සමානුපාතික නියෝජන ක්‍රමය

- 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ පක්ෂ ලබාගත් ජන්ද වලට අනුව අනුපාතිකව මන්ත්‍රිවරු බෙදී යාම 100% නවාංගයකි.
- පාර්ලිමේන්තු මන්ත්‍රීන් පත්කිරීම
- පළාත්සභා මන්ත්‍රීන් පත් කිරීම.

මේ සියළුම දේ සඳහා මෙම නියෝජන ක්‍රමය භාවිතා කරයි

- පළාත් පාලන ආයතන සඳහා නියෝජිතයන් පත්කිරීම.
- මෙම නියෝජනයේදී අපේක්ෂකයන් කණ්ඩායමක් ලෙස ඉදිරිපත් වේ.
- ඒ ඒ පක්ෂ ලබාගත් ජන්ද සංඛ්‍යාවට අනුපාතිකව පක්ෂයට හිමි ආසන ගණන තීරණය වේ.

### ජනමත විචාරණය

- 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ නවාංගයකි.
- ජාතික වැදගත්කමකින් යුතු කරුණක් සම්බන්ධයෙන් සෘජුවම මහජන මතය ලබාගන්නා ක්‍රමය ජනමත විචාරණය වේ.
- මෙහිදී නියමිත කරුණ සඳහා අභිමතය පරිදි ඔව් , නැත ලෙස ප්‍රකාශ කෙරෙන ප්‍රශ්නයකට පිළිතුරු ලබාදීම සිදුවේ.
- මේ දක්වා මෙරට ජනමත විචාරණයක් පැවැත්වූයේ එක් වරක් පමණි.
- ඒ 1982 වර්ෂයේදී එතෙක් පැවති පාර්ලිමේන්තුවේ නිල කාලය දීර්ඝ කිරීම සඳහාය.
- ජනමත විචාරණයෙන් ඉදිරිපත් කෙරෙන කරුණට ජනතාව විසින් අනුමත කරන බව පිළිගැනීමට දෙන ලද ජන්ද සංඛ්‍යාවෙන් 50% කට වඩා ලබාගත යුතු වේ.

### නිදහසින් පසු සංවර්ධන කටයුතු

නිදහසින් පසු ගෙවුණු දශක 4 තුළ මෙරට ප්‍රධාන දේශපාලන පක්ෂ දෙක වන එක්සත් ජාතික පක්ෂයත්, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයත් කළින් කල බලයේ සිටි අතර ඒ සෑම ආණ්ඩුවක්ම රටේ ආර්ථික තත්වය දියුණු කිරීමට කටයුතු කර ඇත.

<u>කෘෂිකර්මාන්ත ක්ෂේත්‍රයේ දියුණුව සඳහා සිදුකළ කාර්යයන්.</u>

- අතීතයේදී මෙරට කෘෂිකාර්මික අතින් ස්වයංපෝෂිත රටක් විය.
- වසර 133 ක් පැවති බ්‍රිතාන්‍ය පාලන කාලයේදී වතු වගාවට ප්‍රමුඛත්වය ලැබුණි.
- එම නිසා දේශීය යැපුම් කෘෂිකර්මාන්තය බිඳ වැටුණි.
- පරිභෝජනය සඳහා අවශ්‍ය ආහාර ද්‍රව්‍ය විදේශ වලින් ආනයනය කරන ලදි.
- මේ නිසා සෑම ආණ්ඩුවක්ම වී ගොවිතැන දියුණු කිරීම සඳහා අවශ්‍ය පියවර ගන්නා ලදි.

<u>වී ගොවිතැන දියුණු කිරීම</u>

- පළමුවන ලෝක සංග්‍රාම කාලයේ ආහාර ද්‍රව්‍ය අපනයනය දුෂ්කර විය.
- 1929 ලෝක ආර්ථික පරිහානිය නිසා ආහාර ද්‍රව්‍ය වල මිල ඉහළ යන ලදි.
- ඩොනමෝර් ආණ්ඩුක්‍රමය යටතේ කෘෂිකර්ම අමාත්‍යංශය ලාංකික ඇමතිවරුන්ට ලැබුණි.
- ඒ අනුව ඩී. එස්. සේනානායක මහතා එම අමාත්‍යංශයේ ඇමතිවරයා බවට පත්විය.
- මෙය වී වගාවේ දියුණුවට හේතු විය.

ඩී. එස්. සේනානායක මහතා විසින්,

- වියළි කලාපයේ ගොවි ජනපද ආරම්භ කරන ලදි.
  උදා :- මින්නේරිය, කාගම, නාච්චදූව, බෙරගම, මිනිපේ, පරාක්‍රම සමුද්‍රය, රීදී බැඳි ඇළ, සංගිලි කනදරාව

<u>ගොවිජනපද ව්‍යාපාර පිහිටුවීමේ අරමුණු.</u>

- තෙත් කලාපයේ ජනගහන තදබදය, රැකියා හිගය අඩුකිරීම
- රටේ ආහාර නිෂ්පාදනය වැඩි කිරීම
- වියළි කලාපයේ ඉඩම් ආර්ථික සංවර්ධනයට යොදා ගැනීම.
- තෙත් කලාපයේ ඉඩම් හිගය අවම කොට ඉඩම් හිමියන් තෘප්තිමත් කර ගොවි පරපුරක් නිර්මාණය කිරීම.

<u>නව ගොවිජනපද පිහිටුවීමේදී ඇති වූ අභියෝග</u>

- ජනතාව තෝරාගෙන පදිංචි කිරීමේ ගැටලු
- කැලෑ ඉඩම් එළි කිරීම හා වාරි මාර්ග සැකසීම.
- ජන පදිකයින්ට ආහාර ලබා දීම.
- යටිතල පහසුකම් දියුණු කිරීම.
- වෙළඳ පොළක් නිර්මාණය කිරීම.
- ප්‍රථම බහුකාර්ය සංවර්ධන යෝජනා ක්‍රමය ගල්ඔය යෝජනාවයි.

<u>මහවැලි සංවර්ධන යෝජනා ක්‍රමය-</u> බහු කාර්ය යෝජනා ක්‍රමයකි.

- අතු ගංගා රැසකින් පෝෂණය වන මහවැලි ගඟ මධ්‍යම කඳුකරයේ බටහිර කොටසින් ආරම්භ වී දුම්බර මිටියාවත ඔස්සේ ගලාගොස් ත්‍රිකුණාමලයෙන් මුහුදට වැටේ.

- මෙම ගංගා පද්ධතිය ආර්ථික දියුණුව සඳහා යොදා ගැනීම පිණිස මහවැලි සංවර්ධන යෝජනා ක්‍රමය මගින් සිදුවිය.

<u>අපේක්ෂා කළ අරමුණු</u>

- වියළි කලාපයේ ගොවිබිම් ඵලදායි ලෙස කෘෂිකාර්මික කටයුතුවලට යොදා ගැනීමට අවශ්‍ය නිත්‍ය ජල පහසුකම් සැපයීම.
- ඉහළ යන විදුලිබල ඉල්ලුම සඳහා විදුලිබලය නිෂ්පාදනය
- ජල සම්පාදනය නිසා නව ජනාවාස බිහිකිරීම ඉඩම් නැති ජනතාවට ඉඩම් සපයා දී ආහාර බෝග ව්‍යාප්ත කිරීම.
- ගංවතුර පාලනය

- මිරිදිය මසුන් බෝ කිරීම.
- මෙම ව්‍යාපාරයේ අරමුණු එකකට වඩා වැඩි බැවින් මෙය <u>බහු කාර්ය යෝජනා ක්‍රමයකි.</u>

**මහවැලි සංවර්ධන යෝජනා ක්‍රමය**

→ පොල්ගොල්ලේදී මහවැලි ගඟ හරස්කර උමගක් හරහා සුදු ගඟට ජලය ලබාගෙන බෝවතැන්න ජලාශය හරහා රජරටට ජලය ගෙනයාම. ( එමගින් කලා වැව, නාච්චදූව වැව, නුවර වැව, තිසා වැව යන වැව් වලට ජලය ලබා ගැනීම. )

→ කොත්මලේ, වික්ටෝරියා , රන්දෙණිගල , රන්ටැඹේ, උල්හිටිය , රත්කිඳ හා මාදුරු ඔය ජලාශ ඉදිකිරීම

→ 1979 දි මහවැලි අධිකාරිය පිහිටුවන ලදි

- මහවැලි සංවර්ධන යෝජනාව 1977 දි කඩිනම් කරමින් මාස 6 කින් වැඩ අවසන් කිරීමට යෝජනා විය.

<u>කොත්මලේ ජලාශය</u>

- මහවැලි ගඟේ ප්‍රධාන අතු ගංගාවක් වන කොත්මලේ ඔය කඩදොර නම් ස්ථානයෙන් හරස් කොට වේල්ලක් බැදිමෙන් මෙය ඉදිකරන ලදි.
- ස්විඩන් රජයෙන් මේ සඳහා ආධාර ලැබුණි

<u>වික්ටෝරියා ජලාශය</u>

- මහවැලි ගඟේ පොල්ගොල්ල බැම්මට පහළින් වේල්ලක් බැඳ මෙය ඉදිකරන ලදි.
- බ්‍රිතාන්‍ය රජය මේ සඳහා ආධාර ලබා දුනි

<u>රන්දෙණිගල වේල්ල</u>

- වික්ටෝරියා ජලාශයට පහළින් මිනිපේ අමුණට ඉහළින් මෙය ඉදිකරන ලදි.
- මේ සඳහා බටහිර ජර්මනියෙන් ආධාර ලැබුණි

<u>වී වගාවේ දියුණුම සඳහා අනුගමනය කළ වෙනත් ක්‍රියාමාර්ග</u>

- 1943 දි වී සඳහා සහතික මිල ක්‍රමයක් හඳුන්වා දිම
- වී පර්යේෂණ ආයතනය පිහිටුවීම ( <u>බතලගොඩ වී</u> අභිජනන මධ්‍යස්ථානය )
- ගොවිජන සේවා මධ්‍යස්ථාන ඇති කිරීම
- රජයේ බැංකු මගින් ගොවීන්ට ණය ආධාර ලබාදීම

<u>ව්‍යාපාරික කෘෂිකර්මාන්තය දියුණු කිරීම සඳහා අනුගමනය කළ ක්‍රියාමාර්ග</u>

- ❑ 1972 ඉඩම් ප්‍රතිසංස්කරණ නීතිය මගින් එක් පුද්ගලයෙකුට අයිතියේ තබාගත හැකි ඉඩම් ප්‍රමාණය නියම කිරීම.
- ❑ 1975 ඉඩම් ප්‍රතිසංස්කරණය මගින් ව්‍යාපාරික වතු වගාවේ යෙදුණු පොදු සමාගම් සතු ඉඩම් ජනසතු කොට එම ඉඩම් ගොවියන් අතර බෙදා දීම.
- ❑ රාජ්‍ය අංශය සතු වූ ඉඩම් කළමණාකරණය සඳහා ආයතන පිහිටුවීම.
  1. 1958 දී රාජ්‍ය වැවිලි සංස්ථාව.
  2. 1976 දී උඩරට වතු සංවර්ධන මණ්ඩලය පිහිටුවීම.
  3. 1976 දී ජනතා වතු සංවර්ධන මණ්ඩලය පිහිටුවීම.
- ❑ 1952 දී චීන සමූහාණ්ඩුව සමග ඇතිකරගත් ද්විපාර්ශවික ගිවිසුමෙන් රබර් වලට ස්ථාවර මිලක් ලැබීම.
- ❑ සුළු අපනයන භෝග වගාව දියුණු කිරීම සඳහා කටයුතු කරන ලදි

<u>මෙරට කාර්මීකරණ ක්ෂේත්‍රයේ සංවර්ධනය සඳහා අනුගමනය කළ ක්‍රියාමාර්ග</u>

- ❑ 1959 දී ප්‍රථම කාර්මික ජනපදය <u>ඒකළ</u> පිහිටුවීම.
- ❑ 1960 දී <u>රත්මලාන</u> කාර්මික ජනපදය පිහිටුවීම.
- ❑ 1961 දී මහජන බැංකුව පිහිටුවීම, කුඩා කර්මාන්ත සඳහා ණය ලබා දීම.
- ❑ 1966 දී දේශීය කාර්මික නිෂ්පාදනවල ප්‍රමිතිය තීරණය කිරීමට ප්‍රමිති කාර්යංශයක් පිහිටුවීම.
- ❑ 1960 න් පසුව මෙරටට අවශ්‍ය පාරිභෝගික ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීමේ කර්මාන්ත ඇති කිරීම.
- ❑ 1970-1977 කාලයේ රජය අනුගමනය කළ ආයාත ආදේශන ප්‍රතිපත්තිය නිසා දේශීය ගෘහස්ථ කර්මාන්ත හා සුළු කර්මාන්ත දියුණු වීම.
- ❑ රජය විසින් සිමෙන්ති, යකඩ හා වානේ, තුනී ලෑලි, සීනි ආදි කර්මාන්ත ඉදිකිරීම.
- ❑ 1978 <u>කටුනායක</u> ආයෝජන සැකසුම් කලාපය, <u>බියගම, කොග්ගල</u> අපනයන සැකසුම් කලාප පිහිටුවීම.

<u>අධ්‍යාපන ක්ෂේත්‍රයේ උන්නතිය සඳහා අනුගමනය කළ ක්‍රියාමාර්ග</u>

- ❑ C W W කන්නංගර මහතාගේ නිදහස් අධ්‍යාපන ප්‍රතිපත්තිය.
- ❑ රජයේ පාසල් පිහිටුවීම හා අධ්‍යාපන ව්‍යාප්තියට මුදල් යෙදවීම.
- ❑ විෂයමාලා, සංවර්ධන හා ගුරු පුහුණු කටයුතු නවීකරණය වීම.
- ❑ විද්‍යාගාර පහසුකම් හා පාසල් පුස්තකාල පහසුකම් ව්‍යාප්ත කිරීම.
- ❑ දිවා ආහාරය, පාසල් පෙළ පොත්, වෛද්‍ය හා දන්ත වෛද්‍ය සේවා සහ පාසල් නිල ඇඳුම් නොමිලයේ ලබා දීම.
- ❑ අධ්‍යාපන පරිපාලන රටාව කාලයට අනුව වෙනස් කිරීම.
- ❑ වෘත්තිය අධ්‍යාපන ආයතන පිහිටුවීම.
- ❑ නව විශ්ව විද්‍යාල පිහිටුවීම
  - ❑ 1942 - කොළඹ විශ්ව විද්‍යාලය පිහිටුවීම.
  - ❑ 1952 - ලංකා විශ්ව විද්‍යාලය පේරාදෙණියට ගෙනයාම.
- ❑ විද්‍යෝදය හා විද්‍යාලංකාර පිරිවෙන් විශ්වවිද්‍යාල බවට පත්කිරීම. ( පසුව මේවා පිළිවෙළින් ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය, කැළණිය විශ්ව විද්‍යාලය ලෙස නම් කෙරුණි )
- ❑ 1972 මොරටුව කටුබැද්ද විශ්ව විද්‍යාල පිහිටුවීම.
- ❑ 1974 දී යාපනය විශ්ව විද්‍යාලය පිහිටුවීම.

සමාජ සුභසාධනය සඳහා අනුගමනය කළ ක්‍රියාමාර්ග

- ග්‍රාමීය ප්‍රදේශ වල අධ්‍යාපන කටයුතු දියුණු කිරීම
- රැකියා ලබා ගැනීමේදි දක්ෂතාවයට මුල්තැන දීම හා තරග විභාග ක්‍රම හඳුන්වාදීම.
- නිදහස, සමානාත්මතාවය හා මූලික අයිතිවාසිකම් සංකල්ප ව්‍යවස්ථාගත කිරීම.
- කෘෂිකර්මාන්තය හා ධීවර කටයුතු ආදියට ණය පහසුකම් සහනාධාර සපයමින් රාජ්‍ය අනුග්‍රහය ලබාදීම.

සෞඛ්‍ය ක්ෂේත්‍රයේ උන්නතිය සඳහා අනුගමනය කළ ක්‍රියාමාර්ග.

- නිදහස ලබා ගැනීමට පෙර පවා නොමිලයේ සෞඛ්‍ය පහසුකම් ලබා ගැනීමට ඉඩ සලසා තිබුණි. නමුත් එය නාගරික ප්‍රදේශවලට පමණක් සීමාවිය.

එම නිසා නිදහසින් පසුව,

- ග්‍රාමීය ප්‍රදේශ වල රෝහල් පිහිටුවීම.
- වින්නඹු, මාතෘ හා ළමා සෞඛ්‍ය සේවා දියුණු කිරීම.
- ප්‍රතිශක්තිකරණ එන්නත් ලබා දීම.
- වෛද්‍ය සායන පැවැත්වීම.
- දේශීය වෛද්‍ය ක්‍රමය දියුණු කිරීම.

# පැවරුම.

## කෙටි ප්‍රශ්න

01. බ්‍රිතාන්‍ය නාවික, ගුවන් හා සෙසු යුධ කටයුතු සඳහා මෙරට භූමිය භාවිතා කිරීමට ඉඩ ලබාදෙන ගිවිසුමක් බ්‍රිතාන්‍ය රජය සහ ඩී. එස්. සේනානායක මහතා අත්සන් කළේ කිනම් වර්ෂයේදී ද?
    1. 1941 2. 1947 3. 1946 4. 1948

02. ලෝකයේ ද්වි පක්ෂ ක්‍රමයක් ඇති රටවල් දෙකක් පමණක් දැක්වෙන පිළිතුර වන්නේ,
    1. ඇමෙරිකා එක්සත් ජනපදය හා ප්‍රංශය 2. ජර්මනිය හා ඉන්දියාව
    3. එංගලන්තය හා ඇමේරිකා එක්සත් ජනපදය 4. ඉතාලිය හා ලංකාව

03. සොල්බරි ආණ්ඩු ක්‍රමය යටතේ විධායක කටයුතු පැවරුනේ,
    1. බ්‍රිතාන්‍ය මහරැජින වෙනුවෙන් පෙනී සිටි ආණ්ඩුකාරවරයාට
    2. නියෝජිත මන්ත්‍රී මණ්ඩලයට
    3. අගමැති ප්‍රධාන කැබිනට් මණ්ඩලයට
    4. සෙනට් සභාව හෙවත් උත්තර මන්ත්‍රී මණ්ඩලයට

04. ලංකා ආණ්ඩුක්‍රම ඉතිහාසයේ පළමුවරට විධායක ජනාධිපති ධුරයක් අපට හමුවන්නේ පහත සඳහන් කුමන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට ද ?
    1. ඩොනමෝර් ආණ්ඩුක්‍රමයෙනි 2. සෝල්බරි ආණ්ඩුක්‍රමයෙනි
    3. 1972 ප්‍රථම ජනරජ ආණ්ඩුක්‍රමයෙනි 4. 1978 දෙවැනි ජනරජ ආණ්ඩුක්‍රමයෙනි

05. ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව පරමාධිපත්‍ය බලය හිමිවන්නේ මින් කවරෙකුට ද?
    1. ජනාධිපතිවරයාට 2. අමාත්‍ය මණ්ඩලයට
    3. මහජනයාට 4. ශ්‍රේෂ්ඨාධිකරණයට

06. ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව ලාංකික ජනතාව සෘජුවම ව්‍යවස්ථා සම්පාදනයට සහභාගිවන අවස්ථාවක් ලෙස සැලකිය හැක්කේ මින් කවරක් ද ?
    1. ජනාධිපතිවරණය 2. පාර්ලිමේන්තු මැතිවරණය
    3. ජනමත විචාරණය 4. පළාත් සභා මැතිවරණය

07. ශ්‍රී ලාංකිකයන් එකම ජන්ද කොට්ඨාසයක ජන්ද දායකයන් ලෙස ක්‍රියාකාරන්නේ පහත කිනම් අවස්ථාවක දී ද ?
    1. පාර්ලිමෙන්තු මැතිවරණයකදිය 2. පළාත්සභා මැතිවරණයකදිය
    3. ජනාධිපතිවරණය 4. ජනමත විමසුමකදිය

**රචනා**

01. 1) විධායක ජනාධිපති සතු බලතල දෙකක් ලියන්න.

    2) සමානුපාතික නියෝජන ක්‍රමය යටතේ මහජන නියෝජිතයින් තෝරා ගන්නා අවස්ථා 03 ක් නම් කරන්න.

02. සොල්බරි ආණ්ඩුක්‍රමය යටතේ රාජ්‍ය කටයුතු ගෙනයාම සඳහා පැවති ආයතන 4 නම් කරන්න.

03. 1956 මැතිවරණය ශ්‍රී ලංකාව තුළ සමාජ පෙරළියක් ඇති කිරීම සඳහා හේතු වූවා යයි පැවසීමට හේතු 4 ක් ඉදිරිපත් කොට දෙකක් විස්තර කරන්න.

04. 1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව අධිකරණ පද්ධතියේ ප්‍රධාන ආයතන දෙක කුමක් ද ?

05. නාමික විධායක ජනාධිපතිධුරය ඇතිකරන ලද්දේ කුමන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් ද ? ප්‍රථම නාමික ජනාධිපතිවරයා කවුරුන් ද ?

# 07. ලෝකයේ කැපී පෙනෙන විප්ලව

***විප්ලවයක් යනු .....***

- විප්ලවයක් යනු යම්කිසි ක්ෂේත්‍රයක් තුළ කෙටි කාලයක් තුළ දී ඇති වන්නා වූ වෙනස්කම් තුළින් ලෝකයටම බලපාන පරිදි එම ක්ෂේත්‍රය දියුණු වීම විප්ලවයක් ලෙස පෙන්වා දිය හැකිය.
- ලෝක ඉතිහාසය අධ්‍යනය කිරිමේ දී විවිධ රටවල දේශපාලන ක්ෂේත්‍රයේ සිදු වූ විප්ලව 3ක් දැකිය හැකිය. එනම්,

    1. ඇමරිකන් විප්ලවය
    2. ප්‍රංශ විප්ලවය
    3. රුසියන් විප්ලවය

## ඇමරිකන් නිදහස් සටන

**ඇමරිකාව නිර්මාණය වීම**

- දේශගවේෂණයේ ප්‍රතිඵලයක් ලෙස ක්‍රිස්ටෝපර් කොළොම්බස් විසින් ඇමරිකන් මහාද්වීපය ( නව ලෝකය ) සොයා ගැනීම
- සොයාගත් ප්‍රදේශ ආසියාතික ප්‍රදේශ නොව වෙනම භූමියක් ( නව ලෝකය ) ලෙස ප්‍රථම වරට හඳුන්වනු ලැබුවේ **ජර්මන් ජාතික ඇමරිගෝ වෙස්පුචි** විසිනි.
- භූගෝල විද්‍යාඥයෙකු වූ ඇමරිගෝ වෙස්පුචිට ගරු කිරීමක් ලෙස එම ප්‍රදේශ වලට ඇමරිකාව යන නම තැබිණි.
- යුරෝපා ජාතීන් ඇමරිකා මහද්වීපයට යාමට ප්‍රථම එම ප්‍රදේශවල ඉතා දියුණු ශිෂ්ටාචාර 6ක් තිබී ඇත.

➢ **යුරෝපා ජාතීන් ඇමරිකාවේ ජනපද පිහිටුවීමට බලපෑ හේතු**

- යුරෝපයේ පැවති රෝමානු කතෝලික හා රෙපරමාදු ආගමික ගැටුම් නිසා ආගමික නිදහස අගය කළ පිරිස් නව ප්‍රදේශ කරා යොමු වීම.
- නව ප්‍රදේශවල ඉඩම් ලබා ගෙන දියුණු වීමට හැකි වීම.
- කීර්තිය හා ධනය වර්ධනය කර ගැනීමට ජාතික රාජ්‍යවල පාලකයන් ඇමරිකාව තුළ ජනපද පිහිටුවීමට අනුග්‍රහය ලබා දීම.

➢ **ඇමරිකා මහද්වීපය තුළ ජනපද පිහිටුවා ගත් ප්‍රධාන යුරෝපා රාජ්‍යයන් 4කි.**

- ස්පාඤ්ඤය - ෆ්ලොරිඩා, ටෙක්සාස් , කැලිෆෝනියා, පීරු, මෙක්සිකෝ
- ප්‍රංශය - ශාන්ත ලෝරන්ස් ගංගාවේ සිට මිසිසිපි ගංගා මුවදොර දක්වා
- පෘතුගීසීන් - දකුණු ඇමරිකාවේ ප්‍රදේශ
- එංගලන්තය - වර්ජිනියා, නිව්යෝක්, නිව් ජර්සි වැනි ජනපද 13ක් පිහිටුවීම

- **ඇමරිකා එක්සත් ජනපදය නම් රාජ්‍ය නිර්මාණය වූයේ බ්‍රිතාන්‍යයන් විසින් උතුරු ඇමරිකාවේ නිර්මාණය කරගත් ජනපද 13 මුල් කර ගනිමිනි.**

- බ්‍රිතාන්‍යයන් විසින් එම ජනපද 13 නිර්මාණය කිරීමට 1607 සිට 1733 කාලය ගත වී ඇත.
- ජනපද පිහිටුවීමට බ්‍රිතාන්‍ය රජය විසින් බ්‍රිතාන්‍ය සමාගම් හා පුද්ගලයන්ට අවසර ලබා දී ඇත.
- මෙම ජනපද පාලනය කිරීමට බ්‍රිතාන්‍ය කිරීටයට හා බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තුවට විශාල බලයක් තිබිණි.
- මෙම ජනපද වලට ආණ්ඩුකාරවරු හා උපදේශකවරු පත් කරන ලද්දේ එංගලන්තයේ රජු විසිනි.
- ආර්ථික කටයුතු සම්බන්ධව මෙම ජනපද වාසීන්ට ස්වාධීනත්වයක් නොතිබිණි.

- ***ඇමරිකන් නිදහස් සටනට බලපෑ හේතු***

  - බ්‍රිතාන්‍යයන්ට වාසි වන ආකාරයේ ආර්ථික හා වෙළෙඳ ප්‍රතිපත්ති සකස් වී තිබීම.
  - බ්‍රිතාන්‍ය නිෂ්පාදන භාණ්ඩ ඇමරිකාව තුළ නිපදවීම තහනම් වීම.
  - ජනපද තුළ නිෂ්පාදනය කළ දුම්කොළ, සීනි, කපු, මී ඉටි වැනි අමුද්‍රව්‍ය බ්‍රිතාන්‍යට පමණක් ලබා දිය යුතු වීම.
  - නිෂ්පාදන කටයුතු වලදී හා වෙළෙඳාමේ දී බ්‍රිතාන්‍ය සමග තරග නොකළ යුතු වීම.
  - වෙනත් රටවලින් ගෙනෙන භාණ්ඩ බ්‍රිතාන්‍ය වරායට ගෙනගොස් තීරු බදු ගෙවා එම ජනපද වලට ගෙන යායුතු වීම.
  - 1763 දී හඳුන්වා දුන් නව නීති රීති ජනපදවාසීන් පීඩාවට පත් කිරීම.
  - ප්‍රංශය සමඟ පැවති යුද්ධය සඳහා ගිය වියදම පියවා ගැනීමට අගමැති ජෝර්ජ් ග්‍රැන්විල් විසින් නව බදු පැනවීම.
  - ණය ගෙවීමේ දී මුදල් නෝට්ටු භාවිතය තහනම් වූ අතර ඒ සඳහා රිදී හා රත්‍රං භාවිතා කළ යුතු වීම.
  - 1765 දී මුද්දර පනතක් පනවා සියලුම නීතිමය කාර්යන් සිදු කිරීමට මුද්දර භාවිතා කළ යුතු වීම.

***නිදහස් සටන***

**ආරම්භය**

- 1763 න් පසුව නිදහස් සටන ආරම්භ වී ක්‍රමයෙන් වර්ධනය විය.
- ජනපදවාසීන් මුද්දර හා බ්‍රිතාන්‍ය භාණ්ඩ වර්ජනය කරන ලදී

**ව්‍යාප්තිය**

- ජනපදවාසීන්ගේ සටන් පාඨය වූයේ ***නියෝජනයක් නැත්නම් බදුත් නැත*** යන්නයි.
- විරෝධතා හමුවේ මුද්දර පනත හකුළා ගැනීම.
- බොස්ටන්හි පැවති විරෝධතාවයකට වෙඩි තැබීමෙන් ඇමරිකානුවන් පස් දෙනෙකු මරණයට පත් වීම.
- 1770 දී තේ බද්ද හැර අනිකුත් බදු අහෝසි කිරීම.
- 1773 ඇමරිකන් ජනපද වලට තේ සැපයීම එක් සමාගමකට පැවරීමත් සමඟ1773 දෙසැම්බර් 16 බොස්ටන් වරායේ තේ පෙට්ටි 342 ක් මුහුදට දැමීම. ( මෙය බොස්ටන් තේ සාදය නමින් හඳුන්වයි )
- 1774 දී ජනපද 12ක නියෝජිතයින් පිලඩෙල්පියා නගරයේ දී ප්‍රථම මහද්වීපික සමුළුව පවත්වන ලදී.

ප්‍රථම මහද්වීපික සම්මේලනයේ තීරණ

- ජනපද වෙනුවෙන් නීති පැනවීමට හෝ බදු අයකිරීමට බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තුවට බලය නොමැති බව.
- බ්‍රිතාන්‍ය භාණ්ඩ වර්ජනය කිරීම හා ආරක්ෂාව වෙනුවෙන් ජනපදවාසීන් සන්නද්ධ වීම.

- 1775 දී ලෙක්සින්ටන් නගරයේදී දෙපක්ෂය අතර අවි ගැටුමක් ඇති විය.
- ජනපද නියෝජිතයින් රැස් වී මහද්වීපික හමුදාවක් සංවිධානය කිරීම හා එහි අණදෙන නිලධාරීවරයා ලෙස ජෝර්ජ් වොෂින්ටන් පත්කර ගැනීම
- මූලික මිනිස් අයිතිවාසිකම් ඇතුළත් ඇමරිකන් නිදහස් ප්‍රකාශය 1974 ජූලි 4වන දින නිකුත් කිරීම.
- බ්‍රිතාන්‍යට විරුද්ධව ඇමරිකන් ජනපද යුද්ධය ප්‍රකාශ කිරීම.
- 1783 දී බ්‍රිතාන්‍ය සාම සාකච්ඡා වලට යොමු වීම( පැරිස් සාම ගිවිසුම අත්සන් කරමින් ඇමරිකාව නිදහස් රාජ්‍යයක් කිරීම)
- 1789 දී ඇමරිකා ජනපදවාසීන් ලිඛිත ව්‍යවස්ථාවක් සම්මත කර ජෝර්ජ් වොෂින්ටන් ඇමරිකාවේ ප්‍රථම ජනාධිපතිවරයා බවට පත් කර ගැනීම.

***ජයග්‍රහණයට හේතු***

- ජෝර්ජ් වොෂින්ටන්ගේ දක්ෂ නායකත්වය
- ප්‍රංශය , ස්පාඤ්ඤය , ඕලන්දය වැනි රටවල් එංගලන්තයට විරුද්ධව ඇමරිකාවට සහය දීම.
- ඇමරිකාව හා එංගලන්තය අතර ඇති දුර ප්‍රමාණය ඉතා වැඩි නිසා යුද්ධෝපයන් යෙදීමේදී එංගලන්තයට විවිධ දුෂකරතා මතුවීම.
- බ්‍රිතාන්‍ය අධිරාජ්‍යයේ අනිකුත් යටත්විජිතවල ආණ්ඩු විරෝධී සටන් ඇරඹී තිබීම.

***නිදහස් සටනේ ප්‍රතිපල***

- ඇමරිකා එක්සත් ජනපදය නම් ස්වාධීන රාජ්‍ය බිහි වීම.
- ලෝකයේ ප්‍රථම ලිඛිත සන්ධීය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව බිහි වීම.
- මූලික මිනිස් අයිතිවාසිකම් පිළිබඳ ලොවපුරා උනන්දුවක් ඇති වීම.
- සමස්ත මානව සංහතියටම නිදහසේ අගය පෙන්වා දිය හැකි වීම.

# <u>ප්‍රංශ විප්ලවය</u>

- 1789 දී ප්‍රංශ රාජාණ්ඩුවට එරෙහිව ජනතාව නැගී සිටීම ප්‍රංශ විප්ලවය ලෙස පෙන්වා දිය හැකිය.
- 18 වන සියවසේදී යුරෝපයේ දියුණු රාජ්‍ය වලින් එකක් ලෙස ප්‍රංශය වර්ධනය වී තිබිණි.
- බූර්බෝන් රාජ වංශයේ 16 වන ලුවී රජුගේ පාලනය හමුවේ ප්‍රංශය දේශපාලන , සමාජ හා ආර්ථික පරිහාණියකට පත් විය.
- ප්‍රංශ ජනතාව *නිදහස, සමානාත්මතාවය ,සහෝදරත්වය* යන සංකල්ප පදනම් කරගෙන රජුගේ පාලනයට විරුද්ධව සටන් වැදුණි.

***ප්‍රංශ විප්ලවයට බලපෑ හේතු***

දේශපාලන හේතු

- රටේ සියලු බලතල රජු වෙත කේන්ද්‍රගතව පැවතීම.
- පාලකයන් අකාර්යක්ෂම වීම.
- අනවශ්‍ය යුද්ධ වලට සහභාගී වීම.
- 16 වන ලුවී රජුගේ අධූරදර්ශී පාලනය.

සමාජ හේතු

- සාමාන්‍ය ජනතාව මුහුණ දුන් දුෂ්කරතා.
- උප්පත්තිය මත සමාජ තරාතිරම තීරණය කිරීම හා පන්ති විෂමතාවය.

සමාජ පන්ති →
- පූජක
- රදල
- සාමාන්‍ය ජනතාව →
  - මධ්‍යම පන්තිය
  - ගොවි ජනතාව
  - කම්කරු පන්තිය

- රදලයන් අසීමිත වරප්‍රසාද භුක්ති විඳීම.

ආර්ථික හේතු

- රජ පවුලේ අති සුඛෝපභෝගී ජීවිතය හා අනවශ්‍ය යුද වියදම් නිසා ප්‍රංශ භාණ්ඩාගාරය හිස් වීම
- අසාධාරණ බදු ක්‍රමය →
  - ටේල් බද්ද
  - ගැබෙල් බද්ද
  - කැපිටේශන් බද්ද

***ප්‍රංශ විප්ලවයට බලපෑ දාර්ශනික හේතු.***

- මොන්ටෙස්ක්‍යු - නීතියේ සාරය කෘතිය තුළින් පෙන්වා දී ඇති බල බෙදීමේ න්‍යාය .
- වෝල්ටෙයාර් - ස්වාධීන මතය ප්‍රකාශ කිරීමේ අයිතිය.
  රාජාණ්ඩුව හා පල්ලියේ ඒකාධිකාරය විවේචනය කිරීම.
- රූසෝ - සමාජ සම්මුතිය නම් කෘතිය තුළින් ස්වාධිපත්‍ය පිළිබඳ සංකල්පය ඉදිරිපත් කිරීම.
  රජු මහජනතාවගේ සුභසිද්ධිය සඳහා කටයුතු කළ යුතු බවත් එසේ නොවන පාලකයන් පළවා හැරීමේ අයිතිය ජනතාව සතු බව ප්‍රකාශ කිරීම.

***විප්ලවය හේතු ව්‍යාප්ත වීමට හේතු .***

- ප්‍රංශ විප්ලවයට ආසන්නතම හේතුව වූයේ ආණ්ඩුවේ මුදල් අර්බුදයයි.
- ස්ටේට් ජෙනරල් සභාව ( මන්ත්‍රණ සභාව ) අවුරුදු 175ක් පමණ කැඳවා නොතිබීම.
  ස්ටේට් සභාවේ සාමාජිකයන් → රදළ පන්තිය, පූජක පන්තිය, සාමාන්‍ය ජනතාව
- ටෙනිස් පිටියේ දිවුරුම.
- මහජනතාවගේ සහාය ටෙනිස් පිටියේ දිවුරුමට ලැබුණු අතර පැරීසියේ ජනතාව අවිආයුධ ගැනීම.
- 1789 දී බැස්ටීල් බන්ධනාගාරයට පහර දී සිරකරුවන් නිදහස් කිරීම.
- කැරලිකරුවන් මධ්‍ය පාලනය හා ප්‍රාදේශීය පාලනය අත්පත් කරගෙන රටපුරා ව්‍යාප්ත විය.
- ලෆායෙට් නම් නායකයා යටතේ ජාතික ආරක්ෂාක හමුදාවක් පිහිටුවාගෙන රටපුරා විප්ලවවාදී කමිටු පිහිටුවා 16 වන ලුවී රජුට හා මාරි ඇන්ටොයිනට් බිසවට මරණ දඬුවම ලබාදීම.

***ප්‍රංශ විප්ලවයේ ප්‍රතිපල***

- මූලික මිනිස් අයිතිවාසිකම් පිළිබඳ ලොවපුරා උනන්දුවක් ඇතිවීම.
- 1791 දී මානව අයිතිවාසිකම් පිළිබඳ ප්‍රකාශනයක් ඉදිරිපත් කිරීම.
- සැම මිනිසෙකුම නිදහස් පුද්ගලයෙකු ලෙස උපත ලබන බැවින් ඔවුන් සියලු දෙනාට සමාන අයිතිවාසිකම් හිමිවිය යුතුය යන්න පිළිගැනීම.
- ජනතාව නීති සම්පාදනය කර ගැනීමට සම්බන්ධ කර ගැනිම.
- පුරවැසි අයිතිවාසිකම් ඉදිරිපත් කිරීම.

*විප්ලවයෙන් පසු ප්‍රංශය තුළ සිදු වූ වෙනස්කම්*

- ප්‍රංශ රාජාණ්ඩු ක්‍රමය බිඳ වැටීම.
- ප්‍රංශ ගොවි ජනතාවට සහන ලැබීම.
- ප්‍රංශයේ අස්ථාවර දේශපාලන ක්‍රමයක් බිහිවීම.
- 1799 නැපෝලියන් බොනපාට් ප්‍රංශ බලය අල්ලා ගැනීම.

# රුසියානු විප්ලවය.

- විශාල අධිරාජ්‍යයක් වූ රුසියාව පාලනය කරනු ලැබුවේ සාර්වරු (රජු) විසිනි.
- රුසියාවේ වැඩවසම් සමාජ ආර්ථික ක්‍රමයක් තුළ වැඩි පිරිස ගොවි ජනතාව හා කම්කරුවන් විය.
- රුසියාව පළමු ලෝක යුද්ධයට සම්බන්ධ වීම නිසා රුසියානු ආර්ථිකය බිඳවැටීමට ලක්වීම.

***විප්ලවයට බලපෑ හේතු.***

- සාර් පාලනය දූෂිත ඒකාධිපති රාජාණ්ඩු පාලන ක්‍රමයක් වීම.
- සාර්වරු ආදායම් වැඩි කිරීමට ජනතාවගෙන් අධික බදු අය කිරීම.
- වැඩවසම් සමාජ ක්‍රමයක් තුළ කෘෂිකාර්මික ආර්ථිකයක් තිබීම.
- පාරම්පරික ඉඩම් අයිතිය රදළවරුන් සතුවීම නිසා ගොවීන් විසින් රජයට, පල්ලියට, රදළයන්ට බදු ගෙවීමට සිදුවීම.

- 1905 දී රාජ්‍ය විරෝධී කැරැල්ලක් ඇතිවීම.
- ගොවි, කම්කරු කැරලිවලට නාවික හමුදාවේ පිරිස්ද එකතුවීම.
- සාර්වරු දේශපාලන ප්‍රතිපත්ති හඳුන්වාදීම.
- ලෙනින්ගේ බෝල්ෂවික් පක්ෂය ඩූමාව නම් මන්ත්‍රණ සභාවෙන් ඉවත්ව කටයුතු කිරීම.
- 1914 දී පළමු ලෝක යුද්ධය රුසියාව මිත්‍ර පාර්ශවය ලෙස කටයුතු කිරීම.
- යුධ අවි නිපදවූ නිසා අත්‍යවශ්‍ය භාණ්ඩවල මිල ඉහළයාම.

***විප්ලවය ව්‍යාප්ත වීම***

- 1917 මාර්තු විප්ලවය

- ආරම්භය - රෙදි කම්හලක වැඩ වර්ජනය කිරීමෙන්.
- දින තුනක් ගත වනවිට උද්ඝෝෂණය ව්‍යාප්ත වී හමුදාවද ඒ සඳහා සහයෝගය දැක්වීය.
- 1917 මාර්තු මාසයේදී රජුට සිහසුන අහිමිවිය.
- කෙරෙන්ස්කි නම් සටන්කාමී නායකයා විසින් තාවකාලික ආණ්ඩුවක් පිහිටුවන ලදී.
- මෙම පාලනයද ධනවාදීන් සමග කටයුතු කිරීම නිසා සාමාන්‍ය ජනතාවගේ සහ සොල්දාදුවන්ගේ බලාපොරොත්තු බිඳ වැටුණි.

- 1917 ඔක්තෝම්බර් විප්ලවය

- ලෙනින්ගේ බෝල්ෂෙවික්වරු සෝවියට් මණ්ඩලය පිහිටුවා ගොවි කම්කරු රාජ්‍යයක් පිහිටුවීමට කටයුතු කිරීම.
- මෙන්ෂෙවික්වරුන්ට වඩා බෝල්ෂෙවික්වරුට කම්කරුවන්, ගොවියන් හා සොල්දාදුවන්ගේ සහය හිමිවීම.
- වී. අයි ලෙනින්ගේ සන්නද්ධ භට කණ්ඩායම් රජයේ ප්‍රධාන මධ්‍යස්ථාන අල්ලා ගැනීම.

***විප්ලවයේ ප්‍රතිපල***

- ලෙනින්ගේ නායකත්වයෙන් යුත් බෝල්ෂෙවික්වරුන් රජයක් පිහිටුවීම.
- බෝල්ෂෙවික් පක්ෂය කොමියුනිස්ට් පක්ෂය වීම.
- ජර්මනිය සමඟ පැවති යුද්ධය අවසන්වීම.
- පෞද්ගලික ඉඩම් අයිතිය අහෝසිකර ගොවීන්ට ඉඩම් ලබාදීම.
- කර්මාන්තශාලා, බැංකු හා ගමනාගමනය ජනසතු කිරීම.
- සාර් පාලනය අහෝසිකර සෝවියට් සභා නියෝජිතයින් තනතුරු වලට පත් කිරීම.
- රුසියාව සෝවියට් සමාජවාදී සමූහාණ්ඩු සංගමය ලෙස නම් කිරීම.
- සමාජවාදී දර්ශනය ක්‍රියාවට නැංවීම.
- සමාජවාදය ලෝකය පුරා ව්‍යාප්තවීම.

# 08. ලෝක මහා සංග්‍රාම හා සම්මුතීන් .

## *I වන ලෝක මහා සංග්‍රාමය .*

පැවති කාලය - ( 1914 - 1918 ) සියලු මහද්වීප කරා මෙම යුද්ධය ව්‍යාප්ත විය.

***සංග්‍රාමයට බලපෑ හේතු .***

❖ ප්‍රංශය හා ජර්මනිය සතුරන් බවට පත්වීම.
- ජර්මනිය එක්සත් කිරීමේදී ඔටෝ වොන් බිස්මාර්ක් විසින් ගෙනගිය විදේශ ප්‍රතිපත්තිය නිසා ප්‍රංශය සතුරු රාජ්‍යයක් වීම.

❖ ජර්මන් අධිරාජ්‍යයා වූ දෙවන විලියම් රජුගේ ක්‍රියාකලාපය.
- බිස්මාර්ක්ගේ විදේශ ප්‍රතිපත්තියට පටහැනිව යටත්විජිත ඇතිකර ගැනීමට යුද්ධ ශක්තිය වර්ධනය කිරීම.

❖ යටත්විජිත සඳහා වූ තරගය .
- යුරෝපා ජාතීන්කිහිපයක් යටත්විජිත තනා තිබූ නිසා ජර්මනියේ නිෂ්පාදන භාණ්ඩ විකිණීමට ප්‍රදේශ ඇදාගැනිම. එම නිසා අධිරාජ්‍යවාදීන් එයට බියවිය.


❖ අවි තරගය හා ජාතිවාදය වර්ධනය වීම.
- යුරෝපීය දියුණු රාජ්‍යයන් අවිආයුධ එක්රැස් කරගැනීම වර්ධනය වීම.
- ඉතාලිය හා ජර්මනිය එක්සත් රාජ්‍යයන් වීම ජාතීන් අතර ගැටුම් ඇති වීමට බලපෑවේය.

❖ බිස්මාර්ක් අනුගමනය කළ විදේශ ප්‍රතිපත්තිය .
- ප්‍රංශය යුරෝපයෙන් කොන් කිරීම.
- ජර්මනිය තම මිතුරන් ලෙස ඔස්ට්‍රියාව, ඉතාලිය තෝරා ගත් අතර ඔවුන් මධ්‍යම බලවතුන් ලෙසත් ප්‍රංශය, බ්‍රිතාන්‍ය, රුසියාව මිත්‍ර බලවතුන් ලෙසත් පිල් දෙකක් නිර්මාණය විය.

❖ ඔස්ට්‍රියාවේ ඔටුන්න හිමි කුමරුන් ඝාතනය කිරීම.
- ප්‍රාන්ස් ෆර්ඩිනන්ඩ් හා ඔහුගේ බිරිඳ සරායේවෝ අගනුවරදී ඝාතනය කිරීම.
- කුමන්ත්‍රණකරුවන් ඉදිරිපත් කරන ලෙස සර්බියාවෙන් ඉල්ලා සිටියත් ඔවුන් එය ප්‍රතික්ෂේප කිරීම.

***I වන ලෝක සංග්‍රාමයේ ව්‍යාප්තිය .***

❖ ඔස්ට්‍රියාව සර්බියාවට විරුද්ධව යුද්ධ ප්‍රකාශ කිරීම ජර්මනිය අනුමත කළේය.
❖ රුසියාව සර්බියාවට ආධාර ලබා දීමට කටයුතු කිරීම.
❖ ඔස්ට්‍රියාවට පක්ෂව ජර්මනිය 1914 අගෝසතු 01 වන දින රුසියාවට විරුද්ධව යුද්ධය ප්‍රකාශ කළේය.
❖ ප්‍රංශය රුසියාවට උදව් කරනු ඇතැයි සිතූ ජර්මනිය ප්‍රංශයට විරුද්ධව යුද්ධ ප්‍රකාශ කිරීම.
❖ බ්‍රිතාන්‍ය ජර්මනියට විරුද්ධව යුද්ධ ප්‍රකාශ කිරීම.
❖ ජර්මනිය හා බ්‍රිතාන්‍ය යන දෙපාර්ශවය අතර ගොඩබිම් හා මුහුදු ගැටුම් ඇතිවිය.
❖ ලුසිටානියා මගී නැවට ජර්මනිය ප්‍රහාර එල්ල කිරීමත් සමඟ අමරිකාව මිත්‍ර පිළට එකතු විය.
❖ ඉතාලිය මධ්‍යම බලවතුන්ගේ පිලේ සිට හොරරහසේ මිත්‍ර පිලට එකතුවිය.
❖ මිත්‍ර පිලේ රටවල් ප්‍රහාර එල්ල කිරීම නිසා ජර්මනිය ඇතුලු මධ්‍යම බලවතුන් පසු බැසීම.
❖ ජර්මනියතුළ ආහාර අර්බුදයක් ඇතිවීම නිසා හමුදාව හා මහජනයා තුළ කැළඹීමක් ඇතිවීම.
❖ ජර්මන් නාවික හමුදාව කැරලි ගසා අධිරාජ්‍යයා නෙරපීය.



***පළමු ලෝක යුද්ධයේ ප්‍රතිපල.***

- ❖ මිත්‍ර බලවතුන් යුද්ධය ජය ගැනීම.
- ❖ විශාල ජීවිත සංඛ්‍යාවක් හා දේපල ප්‍රමාණයක් විනාශ වීම.
- ❖ වර්සෙල්ස් ගිවිසුම ඇති වීම.
- සහභාගී වූ නායකයන්
  - ඇමරිකන් එක්සත් ජනපද ජනාධිපති - වුඩ්රෝ විල්සන්
  - බ්‍රිතාන්‍ය අගමැති - ලොයිඩ් ජෝර්ජ්
  - ප්‍රංශ අගමැති - ක්ලෙමන්ෂෝ
  - ඉතාලියේ අගමැති - වික්ටෝරියෝ ඕලැන්ඩෝ
- ❖ ජර්මනියට දැඩි දඬුවම් පැනවීම
- මිත්‍ර පිළට වන්දි මුදල් ගෙවීම.
- හමුදාව හා අවිආයුධ සීමා පැනවීම.
- ප්‍රංශයෙන් අල්ලා ගත් ඇල්සාස් හා ලොරෙන්ස් ප්‍රදේශ නැවත ලබාදීම.
- යුරෝපයෙන් පිටත ජර්මනිය සතු යටත් විජිත මිත්‍ර පිළට ලබාදීම.
- ❖ ඒකාධිපති රාජාණ්ඩු බිඳවැටී ජනවර්ග පදනම් කරගත් නිදහස් රාජ්‍ය නිර්මාණය වීම.
- ❖ ලෝකයේ ආර්ථිකය බිඳවැටී ඇමරිකාව හා බ්‍රිතාන්‍යය ලෝක බලවතුන් ලෙස ඉදිරියට පැමිණීම.
- ❖ ජාත්‍යන්තර සංවිධානයක් වන ජාතීන්ගේ සංගමය බිහිවීම.

## ***ජාතීන්ගේ සංගමය .***

ආරම්භය - වුඩ්රෝ විල්සන්ගේ මූලිකත්වයෙන් 1920 ජනවාරි 10 වන දින රටවල් 42 ක සහභාගීත්වයෙන් මෙම සංගමය පිහිටුවා ගන්නා ලදී.

**අරමුණු**

- ✓ ජාත්‍යන්තර ගැටලු සාමකාමීව විසඳා ගැනීම.
- ✓ තවත් ලෝක යුද්ධයක් ඇතිවීම වැළැක්වීම.
- ✓ ජාත්‍යන්තර අවබෝධය සහ සහයෝගය ගොඩනැගීම.
- ✓ කුඩා රාජ්‍යයන්ගේ නිදහස හා ස්වාධීන්තවය ආරක්ෂා කිරීම.

***සාමය සඳහා දැරූ ප්‍රයත්න.***

- ✓ ස්වීඩනය හා පින්ලන්තය, ජර්මනිය හා පෝලන්තය, ග්‍රීසිය හා බල්ගේරියාව, ඉරානය හා තුර්කිය අතර ඇතිවූ යුද ගැටුම් වැළැක්වීම.
- ✓ සරණාගතයන් පුනරුත්ථාපනය සඳහා මැදිහත්ව කටයුතු කිරීම.
- ✓ නීති විරෝධී වහල් වෙළෙඳාම හා මත්ද්‍රව්‍ය වෙළෙඳාම අඩපණ කිරීම.

***අසාර්ථක වීමට හේතු.***

- ✓ බලවත් ජාතීන් සාමාජිකත්වයෙන් ඉවත් වීම.
- ✓ පරාජිත ජාතීන් නොසලකා හැරීම.
- ✓ ලෝක සාමය පවත්වාගෙන යාමේ අරමුණු බිඳවැටීම.
- ✓ කොන්දේසි උල්ලංඝනය කළවිට ඊට එරෙහිව කටයුතු කිරීමට නොහැකිවීම.
- ✓ ජාත්‍යන්තර හමුදාවක් නොතිබීම.

# දෙවන ලෝක මහා සංග්‍රාමය .

**හැඳින්වීම**

- පළමුවන ලෝක සංග්‍රාමයේ ප්‍රතිපල තුළින් දෙවන ලෝක යුද්ධය ආරම්භ වීම.
- 1933 දී හිට්ලර් ජර්මනියේ නායකයා බවට පත්වීම.
- යුද්ධයට එංගලන්තය සහභාගී වීමත් සමග යටත්විජිත කරාද යුද්ධය ව්‍යාප්ත වීම.
- දෙවන ලෝක යුද්ධය 1939 සැප්තැම්බර් සිට 1945 අගෝස්තු දක්වා කාලය තුළ සිදුවිය.

***දෙවන ලෝක යුද්ධයට තුඩුදුන් හේතු.***

- ජර්මනියේ වෛමාර් සමූහාණ්ඩුවේ දුර්වලතා.
- ඇඩොල්ෆ් හිට්ලර් ජර්මනියේ බලය ලබා ගැනීම.
- හිට්ලර්ගේ නට්සිවාදය තුළින් යුදෙව් ජාතිකයන් සංහාරය කිරීම.
- ඉතාලියේ බෙනිටෝ මුසෝලනී ගෙනගිය පැසිස්ට්වාදය.
- ජපානයේ නිෂ්පාදන විකිණීමට අධිරාජ්‍යයක් ගොඩනගා ගැනීමේ අවශ්‍යතාවය.
- ජාතීන්ගේ සංගමයේ දුර්වලතා .

***දෙවන ලෝක යුද්ධයේ ව්‍යාප්තිය.***

- හිට්ලර් විසින් ඔස්ට්‍රියාව, සුඩෙන්ලන්තය, චෙකොස්ලෝවැකියාව හා පෝලන්තය වැනි ප්‍රදේශ ආක්‍රමණය කිරීම.
- 1939 සැප්තැම්බර් 01 වන දින පෝලන්තය ආක්‍රමණය කල අතර එයට ප්‍රතිචාර වශයෙන් බ්‍රිතාන්‍ය හා ප්‍රංශය ජර්මනියට විරුද්ධව යුද්ධ ප්‍රකාශ කිරීම.
- හිට්ලර් නව යුද්ධ උපක්‍රම භාවිතා කිරීම.
- 1940 දී නෝර්වේ , ඩෙන්මාර්කය, ඕලන්දය, බෙල්ජියම මෙන්ම ප්‍රංශයේ පැරිස් දක්වා හිට්ලර් ආක්‍රමණය කිරීම.
- ඉතාලියේ මුසෝලනීද ප්‍රංශයේ ප්‍රදේශ ආක්‍රමණය කිරීම.
- ප්‍රංශය පරාජය වීමත් සමග බ්‍රිතාන්‍ය අගමැති වින්ස්ටන් චර්චිල් උපක්‍රමශීලීව බ්‍රිතාන්‍යයන් සහ යටත්විජිත ජනතාව ජර්මනියට විරුද්ධව පෙළ ගැස්වීය.
- ජපානය ආසියාතික රටවල් ආක්‍රමණය කිරීම.
- ඇමරිකා එක්සත් ජනපදය යුද්ධයට සම්බන්ධ වීම.
- 1941 නොවැම්බර් 7 වන දින ජපානය පර්ල් වරායට බෝම්බ දමා විනාශ කිරීම.
- එම නිසා ඇමරිකානු ජනාධිපති ෆ්රෑන්ක්ලින් රූස්වෙල් ජපානයට විරුද්ධව යුද්ධ ප්‍රකාශ කිරීම.
- ජර්මනිය බ්‍රිතාන්‍යයන්ට ගුවන් ප්‍රහාර එල්ල කළ නමුත් එය අසාර්ථක විය.
- ජර්මනිය රුසියාව ආක්‍රමණය කළත් උපක්‍රමශීලීව රුසියන් රතු හමුදාව එය පාලනය කළේය.

*දෙවන ලෝක යුද්ධයේ පාර්ශවකරුවන්*

- *මිත්‍ර බලවතුන්*
  - *ඇමරිකාව*
  - *ප්‍රංශය*
  - *බ්‍රිතාන්‍ය*
  - *රුසියාව*
- *අක්ෂ බලවතුන් (ආක්‍රමණික බලවතුන් )*
  - *ජර්මනිය*
  - *ඉතාලිය*
  - *ජපානය*

***ජර්මනිය යටත් වීම.***

- රුසියාව විසින් ජර්මන් හමුදාව පරාජය කරමින් ජර්මනිය දෙසට හමුදාව මෙහෙයවීම.
- ප්‍රංශ හා ඇමරිකානු සේනාව බටහිරින් ප්‍රහාර එල්ල කිරීම.
- මිත්‍ර හමුදාව බර්ලින් නුවර දක්වාම පැමිණීම නිසා හිට්ලර් ඇතුලු නිලධාරීන් රාශියක් සියදිවි නසා ගැනීම.
- 1945 මැයි මාසයේ දී ජර්මනිය කොන්දේසි විරහිතව යටත්විය.

***ජපානය යටත්වීම.***

- 1942 වන විට ලංකාව හා ඉන්දියාව හැර දකුණු හා අග්නිදිග ආසියාතික රටවල් යටත්විය.
- 1942. 04, 05 හා 07 කොළඹට හා ත්‍රිකුණාමලයට ජපානය බෝම්බ දැමීම.
- ජපානයට මිත්‍ර පාක්ෂික හමුදාව දැඩි ප්‍රහාර එල්ල කරමින් යටත් වන ලෙස නිවේදනය කළේය.
- එය ජපානය ප්‍රතික්ෂේප කළ නිසා 1945 අගෝස්තු 06 හිරෝෂිමාවටද අගෝස්තු 09 නාගසාකි නගරයටද ඇමරිකාව විසින් පරමාණු බෝම්බ හෙළන ලදී.
- 1945 අගෝස්තු 14 වන දින හිරෝහිතෝ අධිරාජ්‍යයා කොන්දේසි විරහිතව මිත්‍ර පිළට යටත් වීමත් සමඟ දෙවන ලෝක යුද්ධය අවසන් විය.

***දෙවන ලෝක යුද්ධයේ ප්‍රතිපල .***

- අක්ෂ පිළ පරාජයට පත්වීම.
- ලෝකය පුරා මානව සම්පත් හා භෞතික සම්පත් විනාශ වී යාම.
- යුදෙව්වන් විහාල ප්‍රමාණයක් වධකාගාර තුළ මරා දැමීම.
- පරමාණු බෝම්බයේ භයානක ප්‍රතිපල අනාගත පරම්පරාවට අත්විඳීමට සිදුවීම.
- බ්‍රිතාන්‍ය හා ප්‍රංශ අධිරාජ්‍ය පරිහානියට පත්වීම හා යටත්විජිත වලට නිදහස ලැබීම.
- පරාජිත රටවල් නඟා සිටුවීමට ඇමරිකා එක්සත් ජනපදය විසින් මාර්ෂල් සැලැස්මක් හඳුන්වා දීම.
- ධනවාදී හා සමාජවාදී ලෙස බල කඳවුරු දෙකක් ලෝකය තුළ නිර්මාණය වීම.
- ඇමරිකාව හා රුසියාව ප්‍රදාන කරගෙන ලෝකයේ සීතල යුද්ධයක් නිර්මාණය වීම.
- එක්සත් ජාතීන්ගේ සංවිධානය නිර්මාණය වීම.

## ***එක්සත් ජාතීන්ගේ සංවිධානය .***

**ආරම්භය**

- ජාතීන්ගේ සංගමයට වඩා ශක්තිමත් ජාත්‍යන්තර සංවිධානයක අවශ්‍යතාව මතුවීම.
- 1941 අත්ලන්තික් ප්‍රඥප්තිය ඇති කරන ලදී.
- 1945 ඔක්තෝම්බර් 24 වන දින සැන් ප්‍රැන්සිස්කෝ සමුළුවේදී එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තිය නිල වශයෙන් අනුමත කිරීම.
- ආරම්භයේදී සාමාජික රටවල් 50 කි.

**අරමුණු**

- ජාත්‍යන්තර සාමය, ආරක්ෂාව හා සහයෝගය පවත්වා ගෙන යාම.
- වර්ණ, ලිංග හා ආගම් භේදය නොතකා මිනිස් අයිතිවාසිකම් වලට ගරු කිරීම.
- අරමුණු සපුරා ගැනීම සඳහා ජාතීන්ගේ මුලස්ථානයක් ක්‍රියාත්මක වීම.

***එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ව්‍යුහය.***

**මෙහි ප්‍රධාන ආයතන 06 කි.**

1 මහා මණ්ඩලය 2 ආරක්ෂක මණ්ඩලය 3 ආර්ථික හා සමාජ මණ්ඩලය
4 භාරකාර මණ්ඩලය 5 ජාත්‍යන්තර අධිකරණය 6 මහලේකම් මණ්ඩලය

***මහා මණ්ඩලය.***

- එක්සත් ජාතීන්ගේ සියලු සාමාජික රටවල් මෙයට අයත් වේ.
- සාමාජික සංඛ්‍යාව 193 යි .
- සෑම අවුරුද්දකම සැප්තැම්බර් මස සැසිවාර පැවැත්වේ .
- සෑම සාමාජික රටකටම එක් ඡන්දයක් හිමිවේ.

***කාර්යය හා බලතල***

- අන්තර්ජාතික සාමයට හා ආරක්ෂාවට අදාළ ප්‍රශ්න සාකච්ඡා කිරීම.
- එක්සත් ජාතීන්ගේ අයවැය සළකා බලා අනුමත කිරීම.
- ආරක්ෂක මණ්ඩලයේ නිර්දේශ මත මහලේකම්, අන්තර්ජාතික අධිකරණයට විනිශ්චයකාරවරු පත් කිරීම හා නව සාමාජිකයන් බඳවා ගැනීම.

***ආරක්ෂක මණ්ඩලය.***

- සාමාජික රටවල් 15 කි
- නිත්‍ය සාමාජික රටවල් 05 කි → ඇමරිකාව, රුසියාව, එක්සත් රාජධානිය, ප්‍රංශය, චීනය
- අනික් සාමාජික රටවල් 10 හි සාමාජිකත්වය වසර දෙකකට වතාවක් වෙනස් වේ.
- නිත්‍ය සාමාජික රටවල් 05 ට නිශේධ බලය හිමි වේ.
- නිශේධ බලය යනු යෝජනාවන්ට එක් රටක් විරුද්ධ වුවහොත් එම යෝජනාව සම්මත නොවේ.

***කාර්යය හා බලතල***

- සාමයට හා ආරක්ෂාවට තර්ජනය විය හැකි ගැටුම් පිළිබඳ පරීක්ෂා කොට බලා නිර්දේශ ඉදිරිපත් කරයි.
- ආක්‍රමණිකයෙකුට විරුද්ධව ආර්ථික සම්බාධක පැනවීම හා යුධ බලය යෙදවීම.

***ආර්ථික හා සමාජීය මණ්ඩලය .***

- ✓ මෙහි සාමාජික සංඛ්‍යාව 54 කි
- ✓ සාමාජික කාලය අවුරුදු 3 කි

***අරමුණු***

ලෝක ප්‍රජාවගේ ආර්ථික, සමාජික, සංස්කෘතික, අධ්‍යාපනික හා සෞඛ්‍ය අංශ වැඩිදියුණු කිරීම.

අනුබද්ධ ආයතන →
- ජාත්‍යන්තර කම්කරු සංවිධානය
- ජාත්‍යන්තර මූල්‍ය අරමුදල
- ලෝක සෞඛ්‍ය සංවිධානය
- එක්සත් ජාතීන්ගේ ළමා අරමුදල

***භාරකාර මණ්ඩලය .***

- ○ එක්සත් ජාතීන්ගේ සංවිධානය පිහිට වූ අවධියේ භාරකාර රාජ්‍ය 11 ක් විය.
- ○ 1994 වර්ෂය වන විට සියලු ප්‍රදේශ ස්වාධීනත්වයක් ලැබුණි.

***ජාත්‍යන්තර අධිකරණය .***

- නෙදර්ලන්තයේ හේග් නුවර පිහිටා ඇත.
- සාමාජික රටවල අධිකරණ ක්ෂේත්‍රවල ඉහළම තනතුරු දරන අන්තර්ජාතික නීතිය පිළිබඳ විශේෂඥයන් අතරින් විනිශ්චයකාරවරු තෝරා ගනු ලබයි.

***කාර්යයන්***

- එක්සත් ජාතීන්ගේ ආයතන වලට අවශ්‍ය නීති උපදෙස් ලබාදීම.
- සාමාජික රටවල් අතර පැන නගින ආරවුල් සම්බන්ධව නීතිමය විසඳුමක් ලබාදීම.

***මහලේකම් කාර්යාලය..***

- ❖ ප්‍රධාන පරිපාලනය කාර්යාලය නිව්යෝක් නුවර පිහිටා ඇත.
- ❖ ප්‍රධානියා මහලේකම්වරයායි.
- ❖ ආරක්ෂක මණ්ඩලයේ නිර්දේශය මත වසර 05 කාල සීමාවකට මහලේකම්වරයා පත්කර ගනී.
- ❖ වර්තමාන මහලේකම්වරයා වන්නේ අන්තෝනියෝ ගුටරේස්ය.
- ❖ ජාතයන්තර සාමයට හා ආරක්ෂාවට හානි වේ යැයි සිතන ඕනෑම ප්‍රශ්නයක් ආරක්ෂක මණ්ඩලයට ඉදිරිපත් කිරීමට බලය ඇත.

***ලෝක සාමය ආරක්ෂා කිරීම සඳහා එක්සත් ජාතින්ගේ සංවිධානය ගත් ප්‍රයත්න.***

- ➢ පරමාණු බෝම්බ පාලනය කිරීමට පරමාණු බලශක්ති කොමිසම පිහිටුවීම.
- ➢ සීතල යුද්ධය හෙවත් නිරවි යුද්ධ යටතේ ගැටුම් ඇති වීමට ගිය අවස්ථා නතර කිරීම.
    - සූවස් අර්බුදය
    - ගල්ෆ් අර්බුදය
    - කියුබානු මිසයිල අර්බුදය

***ලෝක සාමය ආරක්ෂා කිරීමට එක්සත් ජාතීන්ගේ සංවිධානයට ගතහැකි ක්‍රියාමාර්ග.***

- ❖ ආර්ථික සම්බාධක පැනවීම.
- ❖ න්‍යෂ්ටික අවිතැනීම සීමා කිරීමට කටයුතු කිරීම.
- ❖ සාම සාධක හමුදා යෙදවීම.

# ලෝක මහා සංග්‍රාම

| ලෝක යුද්ධය | හැඳින්වීම | සහභාගී වූ රටවල් | ලෝක යුද්ධ ඇතිවීමට හේතු | ලෝක යුද්ධ වල ව්‍යාප්තිය | ලෝක යුද්ධ වල ප්‍රතිපල |
|---|---|---|---|---|---|
| 1 වන ලෝක යුද්ධය 1914-1918 | 1871 දී ජර්මනිය එක්සත් වී යුරෝපා බලවතුන් අතරට එකතුවීම.<br><br>ප්‍රංශය යුරෝපයේ හුදෙකලා කරමින් ජර්මනිය මිත්‍ර සබඳතා තර කර ගැනීම.<br><br>ජර්මනිය අවට ප්‍රදේශ ආක්‍රමණය කිරීමත් සමඟ යුද්ධය ආරම්භ වීම. | *මිත්‍ර පිල*<br>ප්‍රංශය<br>බ්‍රිතාන්‍ය<br>රුසියාව<br>ඇමරිකාව<br>ග්‍රීසිය<br>ඉතාලිය<br>( පසුව )<br><br>*මධ්‍යම බලවතුන්*<br><br>ජර්මනිය<br>ඔස්ට්‍රියාව<br>බල්ගේරියාව<br>තුර්කිය | යටත්විජිත පිහිටුවා ගැනීමේ බ්‍රිතාන්‍යයන් හා ජර්මන් අධිරාජ්‍යවාදීන්ගේ බල අරගලය<br><br>යුරෝපයේ බල කඳවුරු දෙකක් ගොඩනැගීම.<br><br>යුධ අවි තරඟය හා යුධ මානසිකත්වය නිර්මාණය කිරීම.<br><br>ආසන්නතම හේතුව ඔස්ට්‍රියාවේ ඔටුන්න හිමි කුමරු ඝාතනය කිරීම. | ඔස්ට්‍රියාවේ කුමරු ඝාතනය කිරීම නිසා ඔස්ට්‍රියාව විසින් සර්බියාව ආක්‍රමණය කිරීම.<br><br>සර්බියාවට රුසියාව අධාර කිරීම හා ඔස්ට්‍රියාවට ජර්මනිය ආධාර කිරීම.<br><br>මිත්‍ර පිල හා මධ්‍යම බලවතුන් අතර ගොඩබිම් හා මුහුදු සටන් අතිවීම.<br><br>ලුසිටානියා නැව පිපිරීමත් සමඟ ඇමරිකාව මිත්‍ර පිලට එකතුවීම.<br><br>ජර්මනිය තුළ ආහාර අර්බුදයක් ඇතිවීම.<br><br>1918 ජර්මනිය පරාජිතයන් බවට පත්වීම. | මිත්‍ර පිල ජය ගැනීම.<br><br>විශාල ජීවිත සංඛ්‍යාවක් හා දේපල ප්‍රමාණයක් විනාශ වීම.<br><br>වර්සෙල්ස් ගිවිසුම ඇතිවීම.<br><br>ජර්මනියට දඬුවම් පැමිණවීම.<br><br>නිදහස් රාජ්‍යයන් නිර්මාණය වීම.<br><br>ජාතීන්ගේ සංගමය පිහිටුවීම. |
| 2 වන ලෝක යුද්ධය 1939 - 1945 | පළමු ලෝක යුද්ධයේ ප්‍රතිපල තුළින් දෙවන ලෝක යුද්ධය වර්ධනය විය.<br><br>ජර්මනියට අත් වූ අපකීර්තිය මකා ගැනීම සඳහා හිට්ලර්ගේ නායකත්වයෙන් ජර්මන් ජාතිය ගොඩනැගීම.<br><br>හිට්ලර්ගේ ජාතිවාදය හා ප්‍රදේශ ආක්‍රමණය කිරීම තුළින් ප්‍රංශය හා බ්‍රිතාන්‍ය ජර්මනියට විරුද්ධව යුද්ධ ප්‍රකාශ කිරීම. | <u>මිත්‍ර පිල</u><br>ප්‍රංශය<br>බ්‍රිතාන්‍යය<br>රුසියාව<br>ඇමරිකාව<br><br>අක්ෂ බලවතුන්<br><br>ජර්මනිය<br>ඉතාලිය<br>ජපානය | ජර්මනියේ වෙමාර් සමූහාණ්ඩුවේ දුර්වලතා<br><br>වර්සෙල්ස් ගිවිසුමේ දුර්වලතා<br><br>හිට්ලර්ගේ දේශීය හා විදේශීය ප්‍රතිපත්ති<br><br>යුදෙව්වන් හා පැසිස්ට්වාදය මර්දනය කිරිම.<br><br>යුරෝපය තුළ බල කඳවුරු නිර්මාණය වීම.<br><br>ආසන්නතම හේතුව හිට්ලර් පෝලන්තයට පහර දීම. | හිට්ලර් නට්සිවාදය භාවිතා කරමින් කොමියුනිස්ට්වාදය මර්දනය කරමින් රාජ්‍යයන් ආක්‍රමණය කිරීම.<br><br>1939 දී ජර්මනිය පෝලන්තය ආක්‍රමණය කිරීම මඟින් මිත්‍ර පිල යුද්ධ ප්‍රකාශ කිරීම.<br><br>ජර්මනිය වේගයෙන් අවට ප්‍රදේශ ආක්‍රමණය කිරිම.<br><br>ඉතාලිය ජර්මනියේ සහයට පැමිණීම.<br><br>වින්ස්ටන් චර්චිල්ගේ උපක්‍රමශීලී නායකත්වය | මිත්‍ර පිල ජයගැනීම.<br><br>විශාල ජීවිත සංඛ්‍යාවක් හා දේපල ප්‍රමාණයක් විනාශ වී ගිය අතර එය අනාගත පරම්පරාවටද බලපෑම.<br><br>බ්‍රිතාන්‍යයේ ප්‍රංශයේ යටත්විජිත රටවල් වලට නිදහස ලැබීම.<br><br>ඇමරිකාව මාෂල් සැලැස්ම ක්‍රියාත්මක කිරීම. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | | ජපානය ආසියාතික රටවල් ආක්‍රමණය කරමින් පර්ල් වරායට පහර දීම. ඇමෙරිකාව යුද්ධ ප්‍රකාශ කිරීම.<br><br>ජර්මනිය රුසියාව ආක්‍රමණය කිරීම අසාර්ථක වීම.<br><br>ජර්මනිය පරාජයට පත්වීම.<br><br>ජපානය පරාජයට පත්වීම. | ලෝකයේ ධනවාදී හා සමාජවාදී බල කඳවුරු දෙකක් නිර්මාණය වීම.<br><br>එක්සත් ජාතීන්ගේ සංවිධානය නිර්මාණය වීම. |

# ලෝකයේ කැපී පෙනෙන විප්ලව

| විප්ලවය | පෙර පැවති තත්වය | විප්ලවයට බලපෑ හේතු | විප්ලවයේ ව්‍යාප්තිය | විප්ලවයේ ප්‍රතිපල |
|---|---|---|---|---|
| ඇමරිකන් විප්ලවය 1763 - 1776 | දේශගවේෂණයේ ප්‍රතිපලයක් ලෙස ඇමරිකාව සොයා ගැනීම.<br><br>අමෙරිකාව තුල දියුණු ශිෂ්ටාචාර පැවතීම.<br><br>යුරෝපා ජාතීන් ජනපද නිර්මාණය කිරීම.<br><br>බ්‍රිතාන්‍ය ජනපද 13ක් නිර්මාණය කිරීම. | බ්‍රිතාන්‍යයන් ඔවුන්ට වාසි වන නීතිරීති සැකසීම.<br><br>ඇමරිකන් ආර්ථිකයට බ්‍රිතාන්‍යයන් විසින් සීමා පැනවීම.<br><br>බ්‍රිතාන්‍යයන් විසින් ඇමරිකානුවන්ගෙන් අධික බදු අයකිරීම.<br><br>ඇමරිකානුවන් නිදහස අගය කිරීම. | 1763 න් පසු නිදහස් සටන වර්ධනය වීම.<br><br>නියෝජනයක් නැතිනම් බදුත් නැත<br><br>විරෝධතා ඇතිවීම.<br><br>බොස්ටන් තේ සාදය<br><br>ප්‍රථම මහද්වීපික සම්මේලනය<br><br>ජෝර්ජ් වොෂින්ටන්ගේ නායකත්වයෙන් ගැටුම් ඇතිවීම.<br><br>1776 ජූලි 04 නිදහස් ප්‍රකාශය නිකුත් කිරීම. | ඇමරිකා එක්සත් ජනපදය නම් ස්වාධීන රාජ්‍ය නිර්මාණය වීම.<br><br>මූලික මිනිස් අයිතිවාසිකම් පිළිබඳව ලොවපුරා උනන්දු වීම.<br><br>ලිඛිත සන්ධිය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් නිර්මාණය වීම. |
| ප්‍රංශ විප්ලවය 1789 | යුරෝපයේ දියුණු රාජ්‍යයක් ලෙස පැවතීම.<br><br>බූර්බෝන් රාජවංශය පාලන කටයුතු කිරීම.<br><br>යටත්විජිත ඇතිකර ගනිමින් බලවත් රාජ්‍යක් ලෙස වර්ධනය වීම. | දේශපාලනය දුර්වල වීම.<br><br>සාමාන්‍ය ජනතාව මුහුණ පෑ දුෂ්කරතා<br><br>ප්‍රභූ පන්තියට පමණක් සියලු වරප්‍රසාද හිමි වීම.<br><br>ගොවීන්ගෙන් අධික බදු අය කිරීම. | ආණ්ඩුවේ මුදල් අර්බුදය<br><br>ස්ටේට් ජෙනරල් සභාව කැඳවා නොතිබීම.<br><br>ටෙනිස් පිටියේ දිවුරුම<br><br>1789 ජූලි 04 බැස්ටීලයට පහර | මූලික මිනිස් අයිතිවාසිකම් පිළිබඳ උනන්දු වීම.<br><br>1791 දී අයිතිවාසිකම් පිළිබඳ ප්‍රකාශයක් ඉදිරිපත් වීම.<br><br>ප්‍රංශ රාජාණ්ඩුව බිඳවැටීම. |


[ Downloaded from Past Papers Wiki - Most Extensive Wikipedia of Past Papers! ]

| | | | | |
|---|---|---|---|---|
| | 16 වන ලුවී රජු දුර්වල පාලකයෙක් වීම. | භාණ්ඩාගාරය හිස් වී තිබීම.<br><br>දාර්ශනික මතවාද | දීම.<br><br>16 වල ලුවී රජු හා බිසව මරණයට පති කිරීම. | 1799 දී නැපෝලියන් බොනපාට් බලය ලබා ගැනීම. |
| රුසියන් විප්ලවය 1917 | ලොව ගොඩබිම් වලින් 6/1 ක් වූ රුසියාව විශාල අධිරාජ්‍යයක් විය.<br><br>සාර් පාලනයක් පැවතියේ.<br><br>වැඩවසම් සමාජ ක්‍රමයක් පැවතුණි.<br><br>ගොවීන් හා කම්කරුවන් වැඩි පිරිස විය.<br><br>1 වන ලෝක යුද්ධයට සම්බන්ධ විය. | දූෂිත ඒකාධිපති රාජාණ්ඩු ක්‍රමයක් පැවතීම.<br><br>සාර් පාලනය විසින් අධික බදු අය කිරීම.<br><br>ගොවි ජනතාව වැඩි වීම නිසා වැඩවසම් ක්‍රමය ක්‍රියාත්මක වීම.<br><br>ගොවීන්ට අධික බදු ගෙවීමට සිදුවීම.<br><br>අත්‍යවශ්‍ය භාණ්ඩ වල මිල ඉහළ යාම. | 1905 දී රාජ්‍ය විරෝධී කැරැල්ලක් ඇතිවීම.<br><br>කැරලිකරුවන්ට නාවික හමුදාවද එක්වීම.<br><br>1917 මාර්තු විප්ලවය<br><br>රජුට සිහසුන අහිමි කර කෙරෙන්ස්කිගේ නායකත්වයෙන් තාවකාලික ආණ්ඩුවක් පිහිටුවීම.<br><br>1917 ඔක්තෝම්බර් විප්ලවය<br><br>ලෙනින්ගේ නායකත්වයෙන් කැරලි ඇතිවීම.<br><br>ලෙනින් නව ආණ්ඩුවක් නිර්මාණය කිරීම. | බෝල්ෂෙවික් පක්ෂය කොමියුනිස්ට් පක්ෂය බවට පත්වීම.<br><br>1 වන ලෝක යුද්ධයෙන් රුසියාව ඉවත් වීම.<br><br>පෞද්ගලික ඉඩම් අයිතිය අහෝසි කිරීම.<br><br>කර්මාන්තශාලා ජනසතු කිරීම.<br><br>රුසියාව සෝවියට් සමාජවාදී සමූහාණ්ඩුව ලෙස නම් කිරීම.<br><br>සමාජවාදී දර්ශනය ක්‍රියාවට නැංවීම හා ලොව පුරා ව්‍යාප්ත වීම. |

WWW.PastPapers.WiKi



[ Downloaded from Past Papers Wiki - Most Extensive Wikipedia of Past Papers! ]